පොහොට්ටුව, අත හෝ බුලත් කොළය යටතේ තරඟ කළ
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද සහ මෛත්‍රී පාර්ශ්වවලට
ඡන්දය දුන් සියලු ජනතාව මෙන්ම
සියලු ජාතිකවාදී වාමවාදී බලවේග වෙතයි...

# පුංචි ඡන්දයෙන් ජනපතිවරණයට:

## කළ යුත්තේ කුමක්ද



**මහජන රාජ්‍ය සභාව**

“ ...ජනතා විමුක්ති පෙරමුණට දැන් ඉතිරි වී ඇත්තේ දේශපාලන කුලීකරුවාගේ භූමිකාව ය. බෙදුම්වාදී 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඔවුන් එකගවන්නේ ඒ කුලීකාර භූමිකාවේ ප්‍රධාන කොන්ත්‍රාත්තුව ලෙස ය. ඊනියා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හරහා හෝ සෘජුව ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කිරීම මගින් බෙදුම්වාදීන්ගේ අරමුණ අනතුරට වැටෙන තත්වයක් මේ වනවිට රටේ උද්ගත වී ඇත. ඒ අමාරු තත්වයෙන් ආණ්ඩුව ගලවා ගැනීම සඳහා දැන් ජනතා විමුක්ති පෙරමුණ ඉතා කැමැත්තෙන් ඉදිරිපත් වී ඇත. මේ වන විට ජ.වි.පෙ තුළ බලවත් වී සිටින "එන්.ජී.ඕ කාරයින්ට" සහ ගේම් කාරයින්ට එවැනි මහා පාවාදීම් ඉතා සරල "දේශපාලන ගේම්" බවට පත් වී ඇත.

ඔවුන්ගේ සැලසුම අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් බැවින් එය අමාත්‍ය මණ්ඩලය වෙත යැවීම සිදු වේ. ඉන් පසු අමාත්‍ය මණ්ඩලය හරහා එය නැවත පාර්ලිමේන්තුවට එන්නේ ආණ්ඩුවේ යෝජනාවක් ලෙස නොව ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවක් ලෙස ය. ජ.වි.පෙ අතීත භූමිකාවට සාපේක්ෂව බලන විට එම පාවාදීම සමාන කළ හැක්කේ පියකු විසින් තම දියණිය දූෂණය කිරීම සඳහා කුට්ටාලිකම කිරීම වැනි දුෂ්ඨ ක්‍රියාවකට ය. එම යෝජනාවේ මුඛ්‍ය අරමුණ ලෙස විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ උවමනාව ඉදිරියට දමනු ඇත. එහෙත් බෙදුම්වාදී බලවේග සමග ඔවුන් ඇතිකර ගන්නා එකගතාව වන්නේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ඊනියා සුළු සංශෝධන ප්‍රමාණයක් සම්මත කිරීමය. ඊට අමතරව මහා සංඝරත්නය රැවටීම සඳහා මනාප ඡන්ද ක්‍රමය සංශෝධනය කිරීමේ යෝජනාව ද ඊට ඇතුළත් කරනු ඇත. ඊට හේතුව මීට පෙර එවැනි යෝජනාවක් මහනායක හිමිවරුන් විසින් ඉදිරිපත් කිරීම ය. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ අනුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව පමණක් ජනමතවිචාරණයට ලක් කළ යුතු බව පවසා කල් දැමීමේ හැකියාව ඇත. ඉන් පසුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව ඉදිරි ජනාධිපතිවරණයේ දී නැවත වටයකින් ඊනියා පොදු අපේක්ෂකයෙකුගේ භූමිකාවට සුජාතභාවය ලබා දීම සඳහා යොදා ගනු ඇත... ”

# පුංචි ඡන්දයෙන් ජනපතිවරණයට:
# කළ යුත්තේ කුමක්ද


**මහජන රාජ්‍ය සභාවේ ප්‍රකාශනයක්**

**අනුග්‍රහය**
**ශ්‍රී ලාංකීය ගෝලීය සංසදය**

**මහජන රාජ්‍ය සභාව**

පළමු මුද්‍රණය - 2018 අප්‍රේල් 03

ISBN 978-955-7243-02-3

**ප්‍රකාශනය**

ව්‍යවස්ථා ආවේක්ෂණ කමිටුව,

මහජන රාජ්‍ය සභාව,

අංක 544/ඒ, නාවල පාර, රාජගිරිය.

දුරකථන - 0112 865742

www.rajyasabaha.lk

FB- mahajanarajyasabhawa

**මුද්‍රණය**

ඉමාෂි මුද්‍රණාලය

වනාත පාර,

නුගේගොඩ

# පිදුම

එදා
1956 විප්ලවයෙහි
න්‍යාය පත්‍රය බවට පත් වූ
ජාතික වැඩපිළිවෙළ සැකසීමට
මුල් වූ
පූජ්‍ය හේන්පිටගෙදර ඥානසීහ සහ
පූජ්‍ය මැදගොඩ සුමනතිස්ස
යන යතිවරයාණන් වහන්සේලා
ඇතුළු ජාතික බලවේගවල
නායකයන් වෙත
මෙම කෘතිය
ගෞරවයෙන් පුදමු!

## මහජන රාජ්‍ය සභාවේ වෙනත් ප්‍රකාශන

නව ව්‍යවස්ථාවේ බෙදුම්වාදී ලක්‍ෂණ:
මැනලා බලන්න මෙන්න කෝඳුව- (2016)

ව්‍යවස්ථා සෙල්ලමෙන් රට බෙදෙන හැටි:
බෙදුම්වාදීන්ගේ සහ පාවාදෙන්නන්ගේ රහසිගත සැලසුම්- (2017)



# පෙරවදන

## මහින්ද සහ මෛත්‍රී පාර්ශ්වවලට පුංචි ඡන්දයේ දී ඡන්දය දුන් මහජනතාව වෙතයි


පසුගිය පුංචි මැතිවරණය නිහඬ මහජන විප්ලවයක් ලෙස හැඳින්වීම වරදක් නොවේ. ඡන්දය ප්‍රකාශ කළ ජනතාවගෙන් 58%ක් 1956 විප්ලවයේ උරුමක්කාරයන් බව පැවසීම ද වරදක් නොවේ. ජනතාවගේ හදවත් තුළ විවිධ ප්‍රමාණයෙන් එම උරුමය නියෝජනය කරන මහින්ද සහ මෛත්‍රී පාර්ශව විසින් ලබාගත් සෑම ඡන්දයක්ම එක්සත් ජාතික පක්ෂ විරෝධී ඡන්ද ලෙස සැලකීම ද වරදක් නොවේ. මහින්ද රාජපක්ෂ චරිතය වර්තමාන ජනාධිපති හෝ පොහොට්ටුව පක්ෂයේ නායකයා හෝ අඩුම තරමින් මීළඟ ජනාධිපතිවරණ අපේක්ෂකයා හෝ නොවේ. එහෙත් ජනතාව ඔහු කෙරෙහි විශ්වාසය තබා ඉහළම ඡන්ද ප්‍රතිශතය ඔහුට ලබා දුනි. ඒ මගින් ඔහු රට නැවත නිවැරදි මගට ගත හැකි ජාතික නායකයා බවට පත්කරගත හැකි බව ජනතාව විසින් පිළිගෙන ඇත.

ඒ අනුව මහින්ද රාජපක්ෂයන් දැන් ව්ලැඩිමීර් පුටින් වැනි ශ්‍රේෂ්ඨ නායකයින් පෙන්වන ආදර්ශයෙන් පමණක් නොව 1956 බණ්ඩාරනායක මහතා පෙන්වූ ආදර්ශයන් ද උගත යුතු ය. ඔහු විසින් ඒ මහා භූමිකාව අතට ගත යුතු ය. ඊට අනුව හැසිරිය යුතුය. දැන් ඔහු රාජපක්ෂ පවුලට හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ පොදු ජන පෙරමුණට අයත් වූවෙක් නොවේ. ඔහු සකල විධ පරගැති බලවේගයන් විසින් ශ්‍රී ලංකාවේ නලලේ කොටා ඇති ඉරණම නැවත වටයකින් වෙනස් කිරීම සඳහා තෝරාගත් මහා පොදු නායකයා ය. ඒ නිසා ඔහු තමාගේ උරමත ඉතිහාසය විසින් තබා ඇති ඒ මහා ජාතික වගකීම ඉටු කිරීම සඳහා නොපැකිලිව මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහාය ඉල්ලා සිටිය යුතුය. එහිදී වැදගත් වන්නේ පක්ෂය, පාට හෝ ලකුණ නොව රට ගොඩගැනීම සඳහා මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ජාතික න්‍යාය පත්‍රය යි. ඒ න්‍යාය පත්‍රයේ ජයග්‍රහණය සඳහා මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන මීළඟ ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂකයා බවට ගෝඨාභය රාජපක්ෂ මහතාට පමණක් නොව මෛත්‍රීපාල සිරිසේන මහතාට ද සුදුසුකම් තිබේ. ඔහු කවුරු වුවත් ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් විය යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත් කරමිනි. එම නව ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයක් නැත. ඒ නිසා සුළු ජනකොටස්වලට සමානාත්මතා පදනමින් උපරිම අයිතිවාසිකම් ලබාදෙන අතර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට බාධාවක් නැත.

**මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි,**
**සභානායක**
**මහජන රාජ්‍ය සභාව**

## පටුන


| පරිච්ඡේදය | අංකය |
|---|---|
| 01. පුංචි ඡන්දයෙන් ජනපතිවරණයට: කළ යුත්තේ කුමක්ද? | 01 - 10 |
| 02. පුංචි මැතිවරණ ජනමතයේ යටිපෙළ | 11 - 20 |
| 03. ආණ්ඩුව කළ දේ සහ නොකළ දේ සහ මැතිවරණ ප්‍රතිඵලය | 21 - 30 |
| 04. මෛත්‍රී - මහින්ද එකතුව: එදා හැකිවීම සහ අද නොහැකි වීම | 31 - 38 |
| 05. 1956 ජයග්‍රහණයේ රහස සහ පූර්වාදර්ශය | 39 - 46 |
| 06. වෙල්ලාලයින්ගේ ''ෆෙඩරල් සංහිඳියාව'' වෙනුවට සැබෑ ජාතික සංහිඳියාව | 47 - 54 |
| 07. 13 නැතිව ජාතික ගැටළුව විසඳන්නේ කෙසේද? | 55 - 68 |
| 08. බෙදුම්වාදයට ගොදුරු නොවී නව ව්‍යවස්ථාවක් මඟින් ජාතික ගැටළුව විසඳීම | 69 - 74 |
| 09. දූෂණ විරෝධී සටන් පාඨයේ ඉදිරි වලංගුභාවය | 75 - 84 |
| 10. බෙදුම්වාදයට එරෙහි ජ.වි.පෙ. භූමිකාව සහ එහි අවසානය | 85 - 90 |
| 11. ජනාධිපතිවරණය දක්වා භාරකාර ආණ්ඩුවක් | 91 - 98 |
| 12. ශ්‍රී ලංකාවට එරෙහි ඇමෙරිකානු ''මායාකාර යුද්ධය'' තුළ 2019 මැතිවරණ වසරේ ක්‍රියාන්විතය | 99 - 106 |
| 13. ජාතිවාදී ගැටුම්වලින් වාසි අත්වන්නේ කාටද? | 107-120 |
| 14. ආණ්ඩුවේ අන්තිම ක්‍රීඩා සැලසුම හෙවත් ජාතියේ අන්තිම ගමන | 121-120 |



01

# පුංචි ඡන්දයෙන් ජනපතිවරණයට: කළ යුත්තේ කුමක්ද?

## හැඳින්වීම-:

**ප**ළාත් පාලන මැතිවරණයේදී ජාතික සංවිධාන විසින් මහජනයාගෙන් ඉල්ලා සිටියේ පුංචි ඡන්දය මහා මැතිවරණයක් හෙවත් ජනමත විචාරණයක් බවට පත්කරගන්නා ලෙස ය. එනම් ආණ්ඩුව විසින් මෙතෙක් ඉදිරියට ගෙනයන ලද වැඩපිළිවෙළ පිළිබඳව ජනතාවගේ මතය හෙවත් විරෝධය ප්‍රකාශ කරන ලෙසය. එහිදී එම සංවිධාන තවදුරටත් ඉල්ලා සිටියේ එම ඡන්දය රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කරන පාර්ලිමේන්තු සැසියක් බවට පත් කරගන්නා ලෙසය. එවිට මහජනයා තම ඡන්දය ප්‍රකාශ කරන්නේ රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ දී පරාජය කිරීම සඳහා ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසය. ඊට අමතරව පුංචි ඡන්දය බැඳුම්කර වංචාවේ

මහ මොළකරුවන්ට එරෙහිව දඬුවම් කරන මහජන අධිකරණය බවට පත්කර ගන්නා ලෙසද ජාතික සංවිධාන විසින් ඉල්ලා සිටින ලදී. එවිට මහජනයා තම ඡන්දය ප්‍රකාශ කරන්නේ විනිසුරුවරයකු තම තීන්දුව ප්‍රකාශයට පත් කරන ආකාරයටය.

දැන් මහජනයා විසින් ඉතා නිරවුල්ව ආණ්ඩුවේ ගමන පිළිබඳව තම මතය ප්‍රකාශ කොට ඇත. සමස්ත ඡන්දදායකයන්ගෙන් වැඩිම ප්‍රතිශතය එනම් 44.6% ක් ලැබී ඇත්තේ ජාතික සංවිධාන විසින් ඉදිරිපත් කළ ඉහත මතවාදය නියෝජනය කළ මහින්ද රාජපක්ෂ මහතාටය. මහජනයා විසින් පොහොට්ටුවට කතිරය ගසන්නේ මහින්ද රාජපක්ෂයන් නැවත මේ රටේ ඉරණම තීන්දු කරන නායකයා බවට පත් කිරීම සඳහාය. ඒ පිළිබඳව ඡන්දය ප්‍රකාශ කළ ජනතාව එක් හඬින් සාක්ෂි දරති. නමුත් යම් අඳබාල දේශපාලකයන් පිරිසක් අප රටේ ජනමතවිචාරණ නීතිය ගැන කියමින් ජනමත විචාරණයක් දිනීම සඳහා 51% ක් ලබා ගත යුතු බව පවසති. එය සම්පූර්ණයෙන්ම වැරදි විග්‍රහයකි.

රටක ජනතාව විසින් පත්කරගත් ආණ්ඩුවක් පිළිබඳව අදාළ මැතිවරණයෙන් යම් කාලයකට පසුව පවත්වන මැතිවරණයක් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම අනුව ජනමතවිචාරණයක් ලෙස සැලකිය හැක. එහි දී සැළකිල්ලට ගැනෙන්නේ වැඩිම ඡන්ද ප්‍රතිශතය ලබාගත් පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ මතය පිළිගැනීමට ලක්වූ බව ය. එනම් එම පාර්ශ්වය විසින් ජනමත විචාරණය ජයග්‍රහණය කළ බවය. ඇත්ත වශයෙන්ම ආණ්ඩුවේ ගමන පිළිබඳව කරන ලද එම මත විමසුමේදී එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව මතයක් ප්‍රකාශ කළ ජනතාවගේ සමස්ත ප්‍රතිශතය 64% වේ. ඊට මහින්ද රාජපක්ෂ මහතා මෛත්‍රීපාල සිරිසේන මහතා සහ අනුර දිසානායක මහතා නියෝජනය කළ පාර්ශව සියල්ලේම ඡන්ද අයත් වේ. ඒ සියලු පාර්ශ්ව මූලික වශයෙන් මහජනතාවට ඉදිරිපත් කළේ එක්සත් ජාතික පක්ෂයේ ගමනට එරෙහි මතවාදයකි.

ඊට අමතරව මැතිවරණයට ඉදිරිපත් වූ ප්‍රධාන පාර්ශව සියල්ලටම මහජනයා විසින් සුවිශේෂී වූ පණිවුඩ ලබා දී ඇත. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා ලෙස එම පක්ෂය සහ එය අයත් වන සන්ධානය විසින් දියත් කළ මැතිවරණ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම තමා අතට ගෙන මෙහෙයවීය. ඒ අනුව එතුමා ලබාගත් ප්‍රතිඵල ජනාධිපතිවරයා ලෙස එතුමාගේ භාවිතාවට අදාලව මහජනයා විසින් ලබාදුන් ජනවරමකි. ඊට අනුව 2015 ජනවාරි 8 වන දින එතුමාට ලබාදුන් ජනවරම මහජනයා විසින් ඉතා පැහැදිලි ලෙස ආපසු ලබාගෙන ඇත. **ඒ අනුව දැන් එතුමා ජනතාවගේ තීන්දුවට ගරු කරනවා නම් එතුමාට ගත හැකි දේශපාලන තීන්දු තුනක් ඇත. පළමුවැන්න මහජනයාට සෘජුව හිස නමා ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස් වීම ය. නමුත් එසේ කළහොත් ජනතාව විසින් ඉතා තීරණාත්මක ලෙස ප්‍රතික්ෂේප කළ අගමැතිවරයා අතට ජනපති බලය ලැබේ. එවිට ජනතාව අපේක්ෂා කළ ප්‍රතිඵලයට ප්‍රතිවිරුද්ධ ක්‍රියාව සිදු වේ.**

ජනාධිපතිතුමා ඉදිරියේ පවතින දෙවන විකල්පය වන්නේ එතුමා නිර්පාක්ෂික වීම මගින් රාජ්‍ය නායකයාගේ භූමිකාව ස්වාධීනව සිදුකරන බව ජනතාවට පෙන්වීම ය. එවිට එතුමාගේ පක්ෂයට ජාතික ආණ්ඩුවෙන් ඉවත්වීම පිළිබඳව ස්වාධිනව තීන්දුවක් ගත හැක. තුන් වන විකල්පය වන්නේ ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණය පැවැත්විය හැකි පළමු දිනයේදීම ජනාධිපතිවරණය කැඳවා ජනතාවට කැමති ජනාධිපතිවරයෙක් තෝරාගැනීමට ඉඩ සැලසීම ය. එවිට එම මැතිවරණය දක්වා එතුමාගේ භාවිතාව අනුව එතුමා නැවත පත් කිරීමේ අවස්ථාවද ජනතාවට හිමිවේ. ප්‍රායෝගිකව එතුමාට වඩා වාසිදායක වන්නේ දෙවන සහ තුන්වන විකල්ප දෙකම එකට ක්‍රියාත්මක කිරීමය. එවිට ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත්වී මෙතෙක් එතුමා විසින් ඉටු කිරීමට අපොහොසත් වූ ප්‍රධාන පොරොන්දුව වූ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා එතුමාට සදාචාර බලයක් ලැබේ.

නමුත් ඒ සදාචාර බලය ලබා ලබාගැනීම සඳහා නිර්පාක්ෂික වීම ජාතික ආණ්ඩුවෙන් ඉවත්වීම සහ එතුමාගේ ධූර කාලය වසර හතරක් අවසන් වූ වහාම ජනාධිපතිවරණය කැඳවීම යන සාධක තිත්වය පමණක් සෑහෙන්නේ නැත. එතුමා දැන් පැමිණ සිටින අවාසිදායක දේශපාලන සංධිස්ථානය අතික්‍රමණය කළ හැක්කේ එම ජනාධිපතිවරණය රටට සුදුසු ව්‍යවස්ථාවක් ජනතාව විසින් අනුමත කරන ජනමත විචාරණයක් බවට පත් කිරීම මගිනි. එනම් ව්‍යවස්ථාවක් අතින් ගෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම මගිනි. පසුගිය පුංචි ඡන්දයේ ප්‍රතිඵලය අනුව ජාතිවාදී බෙදුම්වාදී කුඩා කල්ලි හා කණ්ඩායම්වල බලපෑම් වලට යටත් නොවී ජනාධිපතිවරයා පත් කිරීමේ අවස්වස්ථාව සිංහල, දෙමළ, මුස්ලිම් මධ්‍යස්ථ මතධාරී බහුතර ජනතාවට ලැබී දැන් ඇත.

එම නිසා බෙදුම්වාදී කප්පම්කරුවන්ට බලය බෙදීම වෙනුවට සිංහල දෙමළ මුස්ලිම් සියලු ජනතාවට සමාන අයිතිවාසිකම් ලබා දෙන ව්‍යවස්ථාවක් සම්මත කිරීමේ දුර්ලභ අවස්ථාව ජනතාවට හිමි වේ. එවිට 13 වැනි සංශෝධනය පිළිබඳව තවදුරටත් කතා කිරීම අවශ්‍ය නොවේ. නව ව්‍යවස්ථාවක දහතුනක් නැත. ඒ නිසා සැබෑ ලෙසම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ගැටලුවක් මතුවන්නේ නැත. එම අභියෝගය ජය ගැනීම මගින් එතුමා සහ එතුමාට පෙර බලය හෙබ වූ ජනාධිපතිවරු දෙදෙනෙකුට ඉටුකළ නොහැකි වූ ඓතිහාසික පොරොන්දුවක් ඉටු කර ඉතිහාස ගතවීමට එතුමාට අවස්ථාව ලැබේ. නමුත් එය වලංගු වන්නේ 1956 දී මෙන් ජාතික බලවේග විසින් ඉදිරිපත් කරන වැඩ පිළිවෙලකට එතුමා එකඟවුවහොත් පමණි.

කෙසේ වෙතත් ජනාධිපතිතුමා දැන් ක්‍රියාත්මක කරමින් සිටින්නේ ඉහත සඳහන් කළ විකල්ප ක්‍රියා මාර්ග ත්‍රිත්වයෙන් එකක් හෝ නොවේ. ඒ වෙනුවට දැන් එතුමා අගමැතිවරයාගේ සහ ඉදිරි වසර දෙක තුළ අගමැතිවරයා පුටුවේ තබා ගැනීමට නූල් සූත්තර

අදින ඉන්දියානු සහ ඇමෙරිකානු ඔත්තු සේවාවල වුවමනාව ඉටු කරමින් සිටින බව පැහැදිලි ව පෙනේ. ඒ අනුව යම් රූපලාවන්‍ය වෙනස්කම් ප්‍රමාණයක් සිදු කොට මහජනයා ගොනාට ඇන්දවීම සඳහා රඟ දැක්වෙන නාඩගමේ ප්‍රධාන නළුවා බවට ජනාධිපතිතුමා පත් වී ඇත. ඒ තුළ එතුමාගේ 13% ක ජන පදනම අනතුරට ලක්වන අතර එතුමා විසින් දැනට අත්පත් කරගෙන සිටින රජුන් තනන්නා ගේ භූමිකාව ද ක්‍රමයෙන් අහිමි වේ. ඉන්දියානු සහ ඇමෙරිකානු ඔත්තු සේවා විසින් රචනා කරන පිටපතක් අනුව රඟ දැක්වෙන එම නාඩගම සඳහා මහා නායක හිමිවරුන්ට පවා අතුරු චරිත ලබාදීමට එම නාඩගමේ අධ්‍යක්ෂවරුන් කටයුතු කරන බව පෙනේ. දැන් මහ නායකහිමිවරු පවා ආණ්ඩුව අස්ථාවර නොකරන ලෙස ඉල්ලා සිටිති.

**ආණ්ඩුව අස්ථාවර වී ඇත්තේ ජනතාව විසින් මැතිවරණයේදී ලබාදී ඇති තීන්දුව නිසා නම් අනාගතයේ මැතිවරණවලදී ආණ්ඩුව අස්ථාවර නොවන ආකාරයට ඡන්දය පාවිච්චි කරන ලෙස මහජනයාගෙන් ඉල්ලා සිටීමද සාධාරණීකරණය වේ. මහජනයා ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන්නේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රය පරාජය කිරීමට ය. එනම් ආණ්ඩුව අස්ථාවර කර රට ස්ථාවර කිරීමට ය. ආණ්ඩුවේ න්‍යාය පත්‍රය පරාජය කිරීමට මහජනයා තීන්දු කරන අවස්ථාවේ දී ආණ්ඩුව අස්ථාවර වීම වැළැක්විය නොහැක. ඒ නිසා ආණ්ඩුව ස්ථාවර කිරීමේ උවමනාව ආණ්ඩුව රැකීමේ උවමනාවක් මිස අන් යමක් නො වේ. විශේෂයෙන්ම රට විදේශ ආක්‍රමණයකට හෝ සුනාමිය වැනි බරපතළ ආපදාවකට මුහුණ දී සිටින අවස්ථාවක නම් අස්ථාවර නොකරන ලෙස ඉල්ලීමේ යම් සාධාරණ භාවයක් තිබිය හැක. ආණ්ඩුවේ අස්ථාවරභාවය නැති කළ හැක්කකේ මහජන මතයට අනුව හැසිරීම මගිනි.**

රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේ 2015 අගෝස්තු ජන වරම මහජනයා විසින් ඉතා පැහැදිලිව ආපසු උදුරා ගෙන ඇත. එහෙත් ඔහු ඊට සංවේදී වන පුද්ගලයෙක් නොවේ. ඔහු බලයට පත් කළ ඔහුගේ ස්වාමිවරුන් කොන්දේසි විරහිතව ඔහු රැකීමට

වලිකන්නේ ද ඔහුගේ එම ගුණය නිසාය. ඔහුට දැන් සියල්ල උගසට තබා තම ස්වාමීවරුන් භාර දුන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට සිදුවී ඇත. එම උකස්කරයට ඔහුගේ අනාගතය, ඔහුගේ පක්ෂය සහ රටේ ඉරණම යන සියල්ල අයත් වේ. ප්‍රායෝගිකව ගත් විට ඔහු තම කොන්ත්‍රාත්තුවේ යම් කොටස් දැනටමත් ඉටුකොට ඇත. ගෝලීය කොල්ලකාරී ආර්ථික සහ මූල්‍ය පද්ධතියට අවශ්‍ය ආකාරයට රටේ නීති පද්ධතිය වෙනස් කිරීම ඔහු විසින් දැනටමත් ආරම්භ කොට ඇත. **මානව හිමිකම් කවුන්සලයේ දීර්ඝකාලීන න්‍යාය පත්‍රයට ශ්‍රී ලංකාව යටත් කිරීම සහ ඊට අයත් ප්‍රධානතම කොන්දේසි වන අතුරුදහන්වූවන්ගේ කාර්යාලය පිහිටුවීම සහ ඊට අදාළ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත සම්මත කිරීම දැනටමත් අවසන් කොට ඇත. දැන් මූලික වශයෙන් ඉතිරි වී ඇත්තේ බෙදුම්වාදීන්ට සැබෑ ලෙසම අවශ්‍ය වන සහ දයාන් ජයතිලක වැන්නන් විසින් නිර්දේශ කරන 13 වැනි සංශෝධනය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සුළු ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමය.**

නමුත් විපක්ෂයේ යම් අඳබාල දේශපාලන නායකයින් විශ්වාස කරන්නේ දැන් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට ඉඩක් නැති බවය. ඊට හේතු ලෙස ඔවුන් ඉදිරිපත් කරන්නේ දැන් ජනමත විචාරණයක් ජයග්‍රහණය කිරීමට ආණ්ඩුවට හැකියාවක් නොමැති වීමය. බෙදුම්වාදීන්ට ජනමත විචාරණයක් අවශ්‍ය වන ව්‍යවස්ථා සංශෝධනයක් උවමනා නැත. ඉතා සුළු සංශෝධන ලෙස දයාන් ජයතිලක වැනි බෙදුම්වාදී විද්වතුන් විසින් හඳුන්වන දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීමේ සුළු ව්‍යවස්ථා සංශෝධනයක් මගින් බෙදුම්වාදීන්ට රට බෙදීමේ ගමනේ ඉතිරි දුර ගමන් කිරීමට අවස්ථාව නිර්මාණය වේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර කැමැත්ත පමණි. රනිල් වික්‍රමසිංහ අගමැති ලෙස සිටින ආණ්ඩුවකට එකඟ නැති බව කියන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් විපක්ෂයේ වාඩි වුව ද ආණ්ඩුවට විශේෂ බහුතරය ආරක්ෂා කර ගැනීමට හැකියාව ඉතිරිවේ.

ඒ සියල්ලටම වඩා දැන් ආණ්ඩුව විසින් සක්‍රීය බැරකම් කළමනාකරණය නම් වූ ව්‍යාජ ලේබලයක් යටතේ මහා පරිමාණ බැඳුම්කර මගඩියක් සඳහා නව පනතක් සම්මත කර තිබේ. ඒ මගින් මීට පෙර සිදු කළ බැඳුම්කර වංචාව මෙන් සිය ගුණයක වංචාවක් නීත්‍යානුකූලව සිදු කිරීමට හැකියාව ලැබෙයි. එමගින් එක් පැත්තකින් 2019 මැතිවරණ වසරේදී අතපය දිගහැර මහජනයාට විවිධ ව්‍යාජ සහන ලබාදීමට ආණ්ඩුවට අරමුදල් ලැබේ. අනෙක් පැත්තෙන් ඩොලර් බිලියන 4.2 ක ණය ගෙවා ගැනීමට නොහැකිව ලෝක අපවාදයට හා ආර්ථික අර්බුදයකට තල්ලු වීමේ අවදානමෙන් ගැලවීමට ආණ්ඩුවට අවස්ථාව උදාවෙයි. ඊට අමතරව 2019 ජනාධිපතිවරණය අයුතු ලෙස දිනාගැනීම සඳහා අවශ්‍ය දූෂිත ඡන්ද අරමුදල ගොඩනගා ගැනීමට ද එම පනත මගින් අවස්ථාව සැලසේ.

ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් ගත් විට ඔවුන් දැන් ජනතාව විසින් ඔවුනට ලබා දුන් දඬුවම නිසා ජනතාව සමග උරණ වී ඇත. මැතිවරණයෙන් පසුව ඔවුන්ගේ ප්‍රකාශ සහ ක්‍රියාමාර්ග එම මනෝභාවය විසින් මෙහෙයවන බව පෙනේ. ඔවුන් 15% ක ඡන්ද ප්‍රතිශතයකට ළඟා වී ඊළඟ ජනාධිපතිවරණයේදී රජුන් තනන්නා ගේ භූමිකාව අත්පත් කර කරගැනීමට උත්සාහ කළද ඔවුන් අතින් එය ගිලිහී ගියේය. මහා පරිමාණ මැතිවරණ ව්‍යාපාරයක් දියත් කිරීමෙන් පසුව ඔවුනට ලබාගත හැකි වූයේ 6%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි. ඔවුනට දැන් ඉතිරි වී ඇත්තේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ දක්ෂිණාංශික ප්‍රතිගාමී බලවේගයකට බලය ලබාගැනීම සඳහා වක්‍රව උදවු කිරීමේ භූමිකාව පමණි. එනම් ජනවාරි 8 භූමිකාව වෙනත් ආකාරයකට නැවත රඟ දැක්වීම පමණි. අනුර දිසානායකගේ න්‍යාය අනුව ජනතා විමුක්ති පෙරමුණ වෙත මහා පරිමාණයෙන් ජනතාව නැඹුරු වන්නේ දැවැන්ත මර්දනයකට සහ ආර්ථික පීඩනයකට ඒ ජනතාව ගොදුරු වන තත්වයක් යටතේය. එම න්‍යාය අනුව අතරමැදි ප්‍රතිසංස්කරණවලට දායක නොවී රට අමාරුවේ දැමිය යුතුය. බෙදුම්වාදයට අදාලවද ඔවුන් තම භූමිකාව තෝරන්නේ


රට ඊට ගොදුරු වූ විට ජනතා විමුක්ති පෙරමුණ රටට වඩාත් ඕනෑ වනු ඇත යන පදනමින් බව දැන් පැහැදිලි ව පෙනෙයි. අවසාන වශයෙන් ජනතා විමුක්ති පෙරමුණට ඉදිරි ජනාධිපතිවරණයේ දී ප්‍රබල ප්‍රතිගාමී භූමිකාවක් අත්පත් කරගත හැක්කේ මෛත්‍රී සහ මහින්ද සාධක දෙක දුරස් කෙරෙන ප්‍රමාණයට සාපේක්ෂව ය. ඒ නිසා ඔවුන් එම අන්තයට ළඟාවීම සඳහා කළ හැකි සියල්ල කරන බවට කිසිදු සැකයක් නැත.

නමුත් අවාසනාවකට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ සැබෑ විපක්ෂය මෙම මහා අභියෝගයට මුහුණදීම සඳහා උපායමාර්ගිකව ස්ථානගත වන බවක් පෙනෙන්නේ නැත. ආණ්ඩුවේ වහල රනිල් - මෛත්‍රී දෙපළගේ හිසමත කඩා වැටෙන විට ඔවුන් කලබලයෙන් මුක්කු රැගෙන ඒදෙසට දුවන්නේ ඒ නිසාය. ඔවුන් ඔවුන්ට ලැබුණු ජනවරමේ අරුත සහ බලය ගැඹුරින් වටහා ගන්නා බවක් පෙනෙන්නේ නැත. ඊට හේතුව එම ජනවරම මහන්සියෙන් උපයාගත් දෙයකට වඩා ජනතාව විසින් මහින්ද රාජපක්ෂ සාධකය මුල්කරගෙන ස්වෙච්ඡාවෙන් ලබා දුන් දෙයක් වීම විය හැක. ඔවුන් ඔළුගෙඩි මාරු සෙල්ලමකට'' දායකවීම ජනතාව විසින් අනුමත කරන්නේ නැත. රනිල් වික්‍රමසිංහ මහතාගේ රටට හතුරු න්‍යාය පත්‍රය අවුල් කිරීම සඳහා ඔවුන් එවැන්නකට දායක වන්නේ නම් ආණ්ඩුව තම න්‍යාය පත්‍රයට යටත් කෙරෙන කොන්දේසි ප්‍රමාණයක් විවෘතව සහ නොපැකිලව මහජනයාට ඉදිරිපත් කළ යුතුය. එසේ නොකර එම ඔළුගෙඩි සෙල්ලමට දායක වීමේ වරද වසා ගැනීම සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කරන්නේ බොළඳ තර්කයකි. එනම් කොන්දේසි දැමුවහොත් එන්නට සිටින උන් එන්නේ නැති බවය. නමුත් දැන් අවසානයේ දී ආපු එකෙක් නැත. එහෙත් සිදු වූයේ ජනතාවට වැරදි පණිවුඩයක් දීම පමණි.

මහින්ද රාජපක්ෂයන් විසින් පරිවාස ආණ්ඩුවකට කොන්දේසි ඉදිරිපත් කළානම් ජය සහ පරාජය යන දෙකම ඔහුට වාසි සහගත වේ. එම කොන්දේසි ජනාධිපතිවරණය දක්වා ආණ්ඩුව සහ රට තල්ලු කිරීමේ ජනතා ව්‍යාපාරයක න්‍යාය පත්‍රය බවට පත්කර ගත හැක. ඒකාබද්ධ විපක්ෂය විසින් පළමුව පැමිණෙන ජනාධිපතිවරණය වෙනුවට පාර්ලිමේන්තු මැතිවරණයක් ඉල්ලා සිටීම ද උපායමාර්ගිකව පැහැදිලි කළ නොහැකි අතාර්කික සටන් පාඨයකි. ඒ බව තව නොබෝ දිනකින් ඔවුන් විසින්ම තේරුම් ගනු ඇත. **පුංචි ඡන්ද ප්‍රතිඵලය ඉදිරි ජනාධිපතිවරණයේ ජයග්‍රහණය දක්වා දිගු කළ හැක්කේ ජනතාව විසින් ඉල්ලා සිටින ප්‍රතිසංස්කරණ ඉටුකරන ජාතික න්‍යාය පත්‍රයක් රටට ඉදිරිපත් කිරීමෙන් පමණි. සියලු ප්‍රතිගාමී බලවේග නිරායුධ කළ හැක්කේ ද ඒ මගින්මය. 1956 දී බණ්ඩාරනායක මහතා අභිමුව වූ ඓතිහාසික පෙළ ගැස්ම අද මහින්ද රාජපක්ෂ මහතා අභියසට පැමිණ ඇත. එදා 1952 ආසන 9ක් හෙවත් සමසමාජ පක්ෂයට සමාන ආසන ගණනක් දිනා ගත් ළදරු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට 1956 දී මහාජන බලවේගයක් නිර්මාණයය කිරීමට හැකි වන්නේ ජාතික බලවේග විසින් ඉදිරිපත් කළ න්‍යාය පත්‍රය බණ්ඩාරනායක මහතා විසින් අතට ගැනීම නිසාය.**

**මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් මරාගෙන මැරෙන්නට ඉදිරිපත් වන ශ්‍රී ලංකා කාරයින්ගේ නම් ලැයිස්තුවක් ලිපි ගොනුවකට දමා ඊට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නමින් ලේබලයක් ඇලවීමෙන් නව පක්ෂයක් නිර්මාණය වන්නේ නැත. එම පක්ෂයට මහා ජාතික බලවේගයක් බවට පත්විය හැක්කේ ජාතික න්‍යාය පත්‍රයකට නායකත්වය දෙන සැබෑ ජාතික සන්ධානයක් නිර්මාණය කිරීමෙනි. ඒ තුළ අනෙකුත් සියලුම පක්ෂ මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද නියෝජනය විය යුතුය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යනු මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කළ ආයතනයක් පමණක් නොවේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම් වූ බෝඩ් ලෑල්ල පිටුපස ඓතිහාසික උරුමයක් සහ සමාජ මනෝභාවයක් ඇත. එම බෝඩ් ලෑල්ල**

මෛත්‍රිපාල සිරිසේන මහතා විසින් සිරිකොතේ පිළිකන්නේ එල්ලූ පමණින් එම උරුමය අහෝසි වන්නේ නැත. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැමැති බෝඩ් ලෑල්ල, බලවේගය, උරුමය සහ මනෝභාවය යන සියල්ල නැවත අත්පත් කරගැනීම මහින්ද රාජපක්ෂ මහතාගේ වගකීමකි. පොහොට්ටුව විසින් නියෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු  සෙසු ජාතිකවාදී, වාමවාදී පක්ෂ සියල්ලේ පොදු න්‍යාය පත්‍රයයි. ඉදිරි ජනාධිපතිවරණයේ ජයග්‍රහණය පොහොට්ටුවට දිනා ගැනීමට නම් මෙම කරුණු සහ මතවාද පිළිබඳ ගැඹුරින් සිතා බැලිය යුතුය.



02

# පුංචි මැතිවරණ ජනමතයේ යටිපෙළ

පුංචි මැතිවරණයේ අවසන් දින කිහිපයේදී මහින්ද රාජපක්ෂයන් සහභාගී වූ රැස්වීම්වලට ගලා ආ මහජන ගංගාවේ තරම අනුව ජනතාව අපේක්ෂා කළ ඡන්ද ප්‍රතිඵලයක් තිබුණි. ඔවුන්ගේ ඉවට දැනුනු ඒ ප්‍රායෝගික යතාර්ථය නිල වශයෙන් ඡන්ද ප්‍රතිඵලයක් සේ ඔවුනට අසන්නට ලැබෙන්නේ වෙනත් මැතිවරණවලට වඩා බොහෝ පමා වීමෙන් පසුවය. මහින්දගේ කතාව ඇසීමට වඩා ඔහුගේ රුව දැකීමට පොදිගැසෙන මහජන සමූහ දුටු යම් දේශපාලන විචාරකයෝ මහින්ද රාජපක්ෂයන්ගේ ජයග්‍රහණය පිළිබද ඉගි කළහ. ඒ අතර සමීක්ෂණ වාර්තා මගින්ද පොදු ජන පෙරමුණ ඉදිරියෙන් සිටින බවට අනාවැකි පළ කරන්නට යෙදුණි. ඒ අනුව මහින්ද රාජපක්ෂයන්ගේ මුහුණ පෙන්වා පොදු ජන පෙරමුණ නැමති දේශපාලන සන්ධානය විසින් ලබාගත් ජයග්‍රහණය නොසිතූ විරූ එකක් නොවේ. විශේෂයන්ම සමාජයේ මතුවෙමින් තිබූ ආණ්ඩු විරෝධය තුළ ඒවැන්නක සත්‍යතාව පැහැදිලිව දක්නට ලැබුණි.

එසේ නම් නොසිතූ දේ කුමක්ද? එසේ නැත්නම් දේශපාලන විචාරකයන් සඳහන් කරන ආකාරයට පොදුජන පෙරමුණ නම් වූ දේශපාලන සන්ධානය ලබාගත් ජයග්‍රහණය මහින්ද රාජපක්ෂයන්ගේ ජයග්‍රහණයක් ලෙස නිර්වචනය කරන්නේ කෙසේද? එසේම විචාරකයන් විසින් එම ජයග්‍රහණය මහජන විප්ලවයක් ලෙස හඳුන්වන්නේ කෙසේද? ඊට අමතරව ඉතිහාසයේ ප්‍රථම වතාවට ප්‍රාදේශීය සභා මැතිවරණයක ප්‍රතිඵලය විසින් රටේ සමස්ත දේශපාලන පින්තූරය හෙවත් මහජන මනෝභාවය උඩුයටිකුරු කරන්නේ කෙසේද? ඉදිරි ජනාධිපතිවරණයට තරග නොකරන මහින්ද රාජපක්ෂයන්ගේ ජයග්‍රහණය මහජනයා විසින් තහවුරු කරන්නේ කුමක් නිසාද?

කෙසේ වෙතත් අංක ගණිතමය වශයෙන් ඡන්ද ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී ඒ ආකාරයට සැබැවින්ම මහජන විප්ලවයක් සිදු නොවූ බවට ද තර්ක කළ හැක. උදාහරණයක් ලෙස මේ පුංචි ඡන්දයෙන් පොදුජන පෙරමුණ ලබා ගෙන ඇත්තේ ඡන්ද 49 ලක්ෂයක් හෙවත් සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 44.6 %කි. එනම් 2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා ලබාගත් ඡන්ද ප්‍රමාණයට වඩා ඡන්ද ලක්ෂ 2 කට මඳක් වැඩි ප්‍රමාණයකි. එසේ නැතහොත් ජනවාරි 8 දේදුනු විප්ලවයට මුහුණ දී මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව ඒතුමා විසින් ලබාගත් ඡන්ද ප්‍රමණනයට වඩා ඡන්ද ලක්ෂ 9 ක් අඩුවෙනි. නමුත් එම ප්‍රතිඵලය සංවිධායකයින් මහන්සි වී ලබාගත් ප්‍රතිඵලයකට වඩා මහජනයා ස්වෙච්ඡාවෙන් ලබාදුන් එකකි. කෙසේ වෙතත් ජනාධිපතිවරණයක ප්‍රතිඵලය ප්‍රාදේශීය සභා මැතිවරණයක ප්‍රතිඵල සමග ඒ ආකාරයට ගණිතමය වශයෙන් සන්සංධනය කළ නොහැක. නමුත් මෙවර පුංචි මැතිවරණයේදී ජනාධිපතිවරණයකදී වැටෙන ඡන්ද ප්‍රතිශතයට ආසන්න ප්‍රතිශතයක් ඡන්දය දී තිබෙන බව අමතක නොකළ යුතුය.

එදා මහින්ද රාජපක්ෂ මහතා සමග විරසකව මෛත්‍රිපාල සිරිසේන මහතාගේ පැත්තට බර වූවා යැයි සැලකෙන ලක්ෂ 5ක් පමණ වූ තරුණ ඡන්ද මෙන්ම ඉන් පසුව පාර්ලිමේන්තු මැතිවරණයේදී උකටලීව ඡන්දය නොදී සිටි ලක්ෂ 11 මෙන්ම මෙවර නව ඡන්ද ලක්ෂ 7ක ප්‍රමාණය එකතු කළ විට ලක්ෂ 23කි. එම ප්‍රමාණයෙන් තමා ලඟ තිබී නැතිවී ගිය ඡන්ද ලක්ෂ 11 අනිවාර්යයෙන් ම පොදු ජන පෙරමුණ විසින් නැවත දිනා ගත යුතුව ඇත. ඊට අමතරව ඉතිරි තරුණ ඡන්ද ලක්ෂ 12න් අඩක් හෙවත් ලක්ෂ 6ක් හෝ දිනා ගැනීමේ ඉලක්කය ඔහු විසින් සපුරා ගත යුතුව තිබුණි. **ඒ ලක්ෂ 17ක අභියෝගයෙන් පොදුජන පෙරමුණ විසින් ජයගෙන ඇත්තේ ලක්ෂ 02 පමණි. එය පොහොට්ටුව ස්ථානගත කිරීමේ ප්‍රශ්නයක් මිස මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රතිරූපය පිළිබඳ ප්‍රශ්නයක් නොවේ.**

එසේම මෙම මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ **එක්සත් ජනතා නිදහස් සන්ධානය** නමින් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පුද්ගලික කැපවීමෙන් දියත් කළ ඡන්ද ව්‍යාපාරය සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 13.3% ලබා ගැනීමට සමත්වී ඇත. ඒ අනුව විවිධ සමීක්ෂණ වාර්තා මගින් පුරෝකතනය කළ 6-8% ප්‍රතිශතය ඉක්මවා යාමට එතුමා සමත්වී ඇත. මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සිහිනයට සාපේක්ෂව එනම් මහින්ද රාජපක්ෂ සමග කරට කර ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමේ දේශපාලන උවමනාව සමග සසඳන විට එය ඉතා කණගාටුදායක තත්ත්වයකි. නමුත් මෛත්‍රීපාල සිරිසේන මහතා මුහුණ දෙන ''දෙලොවක් අතර''දේශපාලන යථාර්ථය තුළ එම අපේක්ෂාව බරපතළ අභියෝගයක් බවට විවාදයක් නැත. එක්සත් ජාතික පක්ෂ විරෝධී පොදු ඡන්ද තොගය මහින්ද සහ මෛත්‍රී අතර ඒ ආකාරයට අසමානව බෙදී යාමට හේතුවුණු කරුණු රාශියක් ඇත. කෙසේවෙතත් මහින්ද - මෛත්‍රී පාර්ශ්වවල ඡන්ද එක්තුව එක්සත් ජාතික පක්ෂ විරෝධී පොදු ඡන්ද ප්‍රතිශතය බවට පත්වේ. එය සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 57.3%කි. ඒ මගින් ඉදිරි ජනාධිපතිවරණයේදී නියත ජයග්‍රහණය සඳහා උපායමාර්ගික දොරටුවක් විවෘත වේ.

ජනතා විමුක්ති පෙරමුණ මෙම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට පමණක් දෙවැනි වූ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ ද ඔවුන් අපේක්ෂා කළ මට්ටම වූ 15% ක ඡන්ද ප්‍රතිශතය ආසන්නයටවත් ළගාවිය නොහැකි විය. සියලු ශිල්ප හරඹ වලින් පසුව ඔවුනට ලබා ගත හැකි වූයේ සමස්ත ඡන්ද ප්‍රතිශතයෙන් 6.2% ක් පමණි. යහපාලන ආණ්ඩුව බලයට පත් කිරීම සඳහා ඊනියා සිවිල් භූමිකාව ඉටු කළ එන්. ජී. ඕ. නඩය සහ චම්පික රණවක වැනි එක්සත් ජාතික පක්ෂයේ 'ෆුඩ් බෝඩ්' එකේ එල්ලී යන ඇමතිවරුන්ට අනුව මහජනයා මහින්ද රාජපක්ෂ දෙසට හැරෙන්නේ ආණ්ඩුව විසින් පොරොන්දු ඉටු නොකළ නිසාය. එසේ නම් ආණ්ඩුව ලවා පොරොන්දු ඉටු කරවන බවට පොරොන්දු වූ සහ ඒ සඳහා උපරිමයෙන් කඩේ ගිය ජනතා විමුක්ති පෙරමුණට එවැනි ඉරණමක් අත් වන්නේ කෙසේද? ඔවුන් විසින් අත්පත් කර ගැනීමට උත්සාහ කළ රජුන් තනන්නාගේ භූමිකාව දැන් ඔවුනට අහිමි වී ඇත. එම භූමිකාව දැන් මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අත්පත්කරගෙන ඇත.

කෙසේ වෙතත් ආණ්ඩුව විසින් මහජනයාට ලබා දුන් බොරු පොරොන්දු ඉටු නොකළ නිසා මහජනයා නැවත මහින්ද රාජපක්ෂ වෙත නැඹුරු වූ බව පැවසීම ඉතා සූක්ෂම තක්කඩි විග්‍රහයකි. ඊට අනුව ඉදිරි වසර දෙක තුළ ඒ පොරොන්දු ඉටු කිරීමට අවංක උත්සාහයක් ගන්නේ නම් මහජන කැමැත්ත නැවත දිනා ගත හැක. ඊට අමතරව එම විග්‍රහය මගින් ආණ්ඩුව විසින් මහජනයාට පොරොන්දු නොවූ එහෙත් තමා බලයට පත්කළ ස්වාමිවරුන්ට ලබා දුන් පොරොන්දු ඉටු කිරීමේ අවුල යටපත් වේ. ඒ තුළ මෛත්‍රී-රනිල් ආණ්ඩුවේ පරාජයට වගකිව යුතු රනිල් පාර්ශවය හෙවත් එක්සත් ජාතික පක්ෂයේ පරාජයට අදාල යටි පෙළ පුළුල්ව කතාබහට ලක්වෙන්නේ නැත. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ඡන්ද ලක්ෂ 50ක් හෙවත් සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 45.6% ක් ලබා ගැනීමට සමත්විය. එම බලය පුංචි ඡන්දයේදී ඡන්ද ලක්ෂ 36 දක්වා හෙවත් සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් 32.6% දක්වා බරපතල ලෙස පහත වැටී ඇත.

එසේ වුවත් එදා 2014 දී රනිල් වික්‍රමසිංහ මහතා විසින් රඟදැක් වූ 'හංස නාඩගම්' දෙස මෙම ප්‍රතිඵලය තුලින් ආපසු හැරී බැලීමේදී පෙනෙන්නේ වෙනත් පින්තූරයකි. එවැනි ක්‍රීඩාවකට දේශපාලන බිමේ ඉඩක් නැතත් අංක ගණිතමය වශයෙන් ඒ සඳහා ඉඩක් ඉතිරිවී ඇත. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී-චන්ද්‍රිකා පිල සහ ජනතා විමුක්ති පෙරමුණ මෙන්ම ටී.එන්.ඒ. පක්ෂය ලබාගත් ඡන්ද ගොඩ එකතු කළ විට එය 55%කි. ඒ නිසා ඉදිරි ජනාධිපතිවරණයේදී හංස න්‍යාය සංකල්පමය වශයෙන් හා අංක ගණිතමය වශයෙන් තවදුරටත් වලංගු වේ. නමුත් උපායමාර්ගික වශයෙන් ඊට සක්‍යතාවය තිබේද යන්න බොහෝ විට තීන්දු කෙරෙන්නේ වෙනත් බාහිර බලවේග විසින් බැවින් ඒ පිළිබඳව මේ මොහොතේ නිශ්චිතව යමක් පැවසිය නොහැක. කෙසේවෙතත් අනාගතයේදී බාහිර බලවේග විසින් ගන්නා තීන්දු රට තුළ සාර්ථක වීමට නම් මෛත්‍රී රනිල් පාර්ශව දෙක වැටී තිබෙන තැනින් තවදුරටත් පහළට වැටීම වළක්වා ගත යුතුය. ඒ නිසා වර්තමාන ආණ්ඩුව බලයට පත් කළ බාහිර බලවේග මේ දිනවල ආණ්ඩුව රැකගැනීම සඳහා උපරිම කැපවීමෙන් වැඩ කරන බවට සැකයක් නැත.

ඒ අනුව දැන් තමා ලබාගත් පරාජය හමුවේ තවදුරටත් පහළට වැටීම වළක්වා ගැනීම සඳහා මෛත්‍රී-රනිල් පාර්ශව දෙක වෙන්ව සිටිමින් එකට වැඩ කිරීම සඳහා තේරීම් කරනු ඇත. ආණ්ඩුව දැන් දැඩි සත්කාර ඒකකයට ඇතුළු කර ඇතත් ඔවුන්ගේ දිවි ගලවා ගැනීම සඳහා ලෝකයේ සිටින දක්ෂතම දේශපාලන වෙදුන් කැඳවීමට ආණ්ඩුවේ ස්වාමිවරුන් කටයුතු කරන බවට සැකයක් නැත. එසේ නොවීම සඳහා ඇත්තේ ඉතාම සුළු සම්භාවිතාවකි. එනම් අනාගත මහින්ද රාජපක්ෂ රජයක් යටතේ තම අභිමතයන් ඉටුකර ගත හැකි තත්ත්වයක් නිර්මාණය කර ගැනීමේ සම්භාවිතාව යි. මහින්ද රාජපක්ෂ මහතාගේ සමහර ප්‍රබල සංවිධායකයින් හෝ ඔවුන්ගේ වඳ බසින ලද ගෝල බාලයින් ලවා එවැනි තැනකට ඔහු තල්ලු කර ගැනීමට රටට සතුරු බලවේග විසින් යම් උත්සහයක්

දැරීමට ඉඩක් ඇත. එහෙත් පවතින දේශපාලන වාතාවරණය තුළ සහ මේ වන විට මහජනයා විසින් මහින්ද රාජපක්ෂ මහතා ඔසවා තබා ඇති ස්ථානය අනුව එවැන්නකට ඇත්තේ කෙස් ගහක ඉඩක් පමණි.

කෙස් ගහක ඉඩ ගැන විශ්වාසය තබා අධිරාජ්‍යවාදී, බෙදුම්වාදී බලවේග කටයුතු නොකරන බවට කිසිදු සැකයක් නැත. ඒ නිසා එම බලවේග මෛත්‍රී-රනිල් සාධක යුගලය කෙරෙහි විශ්වාසය තබා ඉදිරි දේශපාලන උපාය මාර්ග තෝරන බවට විවාදයක් නැත. එහෙත් පවතින තත්වය තුළ එම සාධක දෙක එකට ගැට ගසා තබා ගැනීම මගින් දෙපාර්ශවයේම මහජන පදනම දුර්වල වේ. එම නිසා එම සාධක මහජන ඇස් ඉදිරියේ වෙන් වෙන්ව කළමනාකරණය කිරීම වඩාත් සුදුසු ලෙස ඔවුන් විසින් තේරීමට ඉඩ ඇත. එනම් රටට හතුරු බලවේගවල තීරණාත්මක උවමනාව වනු ඇත්තේ එම සාධක වෙන් ව සිට එකට වැඩ කිරීම ය. ඇමතිකම් අහිමි වන පිරිස් මූල්‍යමය වශයෙන් සමතුලිත කිරීමටද ඔවුන් කටයුතු කරන බවට සැකයක් නැත. ඒ නිසා රටට මිතුරු බලවේගවල උවමනාව විය යුත්තේ වෙන්ව සිටින බව මතුපිටින් පෙන්වන එම දෙපාර්ශ්වය සැබෑ ලෙසම දුරස් කිරීමය. ඒ සඳහා ඔවුන් අතර වන සියලු ප්‍රතිවිරෝධතා උපරිමයෙන් යොදා ගැනීමය. එහිදී අවම කොන්දේසිය වන්නේ ඔවුනට එක්ව බැඳීමට බලකෙරෙන කිසිදු කොන්දේසියක් ඉටු නොකිරීමය. ඉදිරි ජනාධිපතිවරණය මුල්කරගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද - මෛත්‍රී පාර්ශ්ව දෙක පොදු ජාතික න්‍යායපත්‍රයක් යටතේ සමගි කිරීම යනු එම න්‍යායපත්‍රයේ ජයග්‍රහණය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියකි. එහෙත් ඔළුගෙඩි මාරු කිරීමෙන් ආණ්ඩු හැදීමට ඒම පාර්ශ්ව දෙකට ජනවරමක් ලැබී නැත. එසේ කිරීම මගින් රනිල් වික්‍රමසිංහ මහතාගේ න්‍යාය පත්‍රය අවුල් කළ හැකිනම් එය කළ යුත්තේ කොන්දේසිවලට යටත් කළ පරිවාස ආණ්ඩුවක් මගින් පමණි.

කෙසේ වෙතත් මෙම පරිච්ඡේදය ආරම්භයේ දී ප්‍රකාශ කළ ආකාරයට මෙම මැතිවරණය මගින් නිහඬ මහජන විප්ලවයකට පණ දුන් බව හෝ ඒවැන්නක් ආරම්භ වූ බව තහවුරු කරන්නේ කෙසේද? පළමුවෙන්ම එය නිහඬ විප්ලවයක් වන්නේ එම ජයග්‍රහණය ආශ්‍රිතව ප්‍රබල මහජන උද්ඝෝෂණයක් හෝ වීදි බැසීමක් රට තුළ නොතිබුණු නිසාය. දෙවනුව එය මහජන විප්ලවයක් වන්නේ එවැනි වීදි බැසීමකට කිසිදු දේශපාලන බලවේගයක් විසින් නායකත්වය ලබා නොදීම නිසාය. **විශේෂයෙන්ම සිදුවූ පෙරළිය මහජන විප්ලවයක් ලෙස හැඳින්වීය හැක්කේ ඒ නිහඬ මහජන නැගී සිටීමට දේශපාලන බලවේගයක් විසින් තීරණාත්මක, අරමුණු සහගත සහ ඉලක්ක සහගත නායකත්වයක් ලබා නොදීම නිසාය. එදා 2015 ජනවාරි 8 දේදුනු විප්ලවයට සාපේක්ෂව ගත්විට එම තර්කය වඩාත් සාධාරණ වේ. එදා සිදු වූවා යැයි කියන ලේ බිඳක් නොහෙලූ රෝස විප්ලවය හෙවත් අරාබි වසන්තය දෙස් විදෙස් මහා දේශපාලන බලවේගයක් විසින් මෙහෙයවනු ලැබීය. එසේම ඒ සඳහා ඔවුන් විසින් කෝටි ප්‍රකෝටි ගණනින් ඩොලර් සහ රුපියල් පොම්ප කරනු ලැබීය.**

**ජනවාරි 8 මහා මෙහෙයුමට සාපේක්ෂව ගත්විට පොදුජන පෙරමුණ විසින් පුංචි ඡන්දයට ලබාදුන් නායකත්වය ඉතා දුප්පත් එකක් බව සියලු අපේක්ෂකයෝ ඉතා හොඳින් දනිති. ඒ තුළ අඩු තරමින් පොදු සටන් පාඨයක් හෝ පොදු අත් පත්‍රිකාවක් අපේක්ෂකයන්ට කලට වේලාවට ලබාදීමට නායකත්වය අපොහොසත් විය. අපේක්ෂකයන් කැඳවා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත් වූ මහ සමුළුවේ දී හෝ ඔවුන් ඉදිරියේ පවතින මහා සටන හෝ අභියෝගය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දුන්නේ නැත.** ඊට අමතරව මහින්ද රාජපක්ෂ මහතා දැකබලා ගැනීමට දස දහස් ගණන් රැස්වූ රැලිවලදී පවා ප්‍රහාරාත්මක කතා අසන්නට ලැබුණේ ඉත සුළු වශයෙනි. මෛත්‍රීපාල සිරිසේන මහතාට සාපේක්ෂව මහින්ද රාජපක්ෂ මහතා රඟපෑවේ සාන්තුවරයෙකුගේ

භූමිකාවකි. සමහර විට එම භූමිකාව වඩා වාසි දායක වූවා යැයි යමකු තර්ක කළ හැක. එහෙත් සමස්තයක් ලෙස මහින්ද රාජපක්ෂ මහතා ප්‍රහාරාත්මක ප්‍රවේශයකට වඩා ආරක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළ බව රහසක් නොවේ. එතුමා විසින් රනිල් වික්‍රමසිංහ ආරක්ෂා කරන බවට චෝදනාවක් එල්ල කළ හැකි වූයේ ද ඒ නිසා විය හැක.

සිදු වූයේ මහජන විප්ලවයක් බව තහවුරු කිරීම සඳහා තව බොහෝ හේතු ඇත. ඉන් පළමුවැන්න මහින්ද රාජපක්ෂ මහතා ඔසවා තැබූ මැතිවරණය සෘජු ආණ්ඩු වෙනසකට හේතු වන මැතිවරණයක් නොවීමය. දෙවනුව එතුමාට ඊළඟ ප්‍රධාන මැතිවරණය වන ජනාධිපතිවරණයට තරග කිරීමට අවස්ථාවක් නොලැබෙන තත්ත්වයක් යටතේ පවා ජනතාව විසින් එතුමා නායකයා ලෙස පිළිගැනීමය. ඉතිහාසයේ දී ආණ්ඩු වෙනසකට හේතු නොවන පුංචි මැතිවරණයකදී මහජන සහභාගිත්වය 60 - 65% මට්ටමේ පැවතුණි. මෙවර එය 75 - 80% දක්වා ඉහළ යෑම තුළින් පෙන්වන්නේ මහජන විප්ලවයක් සඳහා වූ මහජන සහභාගීත්වය නොවේද? එම වෙනස සිදුවූයේ බිම් මට්ටමේ මහජන උනන්දුවේ ප්‍රතිඵලයක් ලෙස මිස අපේක්ෂකයන්ගේ මහත් කැපවීම නිසා නොවේ. මෙවර මනාප ඉල්ලීමක් සිදු නොවූ බැවින් අපේක්ෂකයන්ගේ පුද්ගලික කැපවීම සීමා සහිත විය.

තුන්වනුව මෙම මැතිවරණය ජනමත විචාරණයක් සේ සලකා ඡන්දය භාවිතා කරන ලෙස විපක්ෂ දේශපාලන පක්ෂ නායකයන් විසින් ඉල්ලා සිටිය ද ඔවුන් ඒ සඳහා මහජනයා සමග නිශ්චිත ගිවිසුමකට එළඹුණේ නැත. එනම් මහජනතාව විසින් එම ජනමත විචාරණයේ දී පිළිතුරු දිය යුතු මූලික ප්‍රශ්න පිළිබඳව ඔවුන් මහජනයා සමග එකඟත්වයකට එළඹුයේ නැත. මහින්ද රාජපක්ෂ මහතා තමා නිශ්චිතව කරන සහ නොකරනන දේ මෙන්ම කිරීමට ඉඩ නොදෙන සහ කිරීමට බල කරන දේ පිළිබඳව මහජනයා සමග

පැහැදිළි ගිවිසුමකට එළඹීමෙන් වැළකී සිටියදී මහජනයා ක්‍රියාකාරී වීම තුළින් පෙන්වන්නේ මහජන විප්ලවයක ස්වරූපයයි . **ඒ තුළ මහජනයා පෙන්වන්නේ ඔවුන් විසින් මහින්ද රාජපක්ෂ මහතා ආධ්‍යාත්මික නායකයෙකුගේ තත්වයට ඔසවා තබා ඇති බව නොවේද?. එනම් රටේ සමස්ත ඉරණම තීන්දු කිරීමේ බලය ඔහුගේ උර මත පැටවීමට ජනතාව සූදානම් බවය. එම තත්වය විමල් වීරවංශලා නුගේගොඩින් ආරම්භ කළ මහින්ද සුළඟ ව්‍යාපාරයේ තර්කානුකූල දිගුවක් නොවේද?**

**ඒ නිසා දැන් ඔහුට හිමි වන්නේ ඉරානයේ අයතුල්ලා කොමේනි ගේ සහ රුසියාවේ පුටින්ගේ භූමිකාවය. ඒ අනුව ඔහු තවදුරටත් දේශපාලන පක්ෂයකට හෝ රාජපක්ෂ පවුලට අයත් නොවේ. ඔහු අයත් වනවා නම් අයත් වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අතීත උරුමයටය. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකම පමණක් නොව විපක්ෂ නායකත්වය ද අත්පත් කර කර ගැනීම ඔහුගේ ඉදිරි සටනේ පළමු පියවර විය යුතුය.** පොදුජන එක්සත් පෙරමුණ යනු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ සෙසු පක්ෂ සියල්ල ඇතුළත් වන දේශපාලන සන්ධානය මිස තවදුරටත් තනි දේශපාලන පක්ෂයක් නොවේ. මහින්ද රාජපක්ෂ මහතාට පුංචි ඡන්දයේදී මහජනයා විසින් ලබා දුන් බලය පළමු වටයේදී පාර්ලිමේන්තුව තුළ පිළිබිඹු විය යුත්තේ විපක්ෂ නායකයා ලෙස ය. එසේ ම ඉදිරියේදී මහා දේශපාලන සන්ධානයට ඔහු ඇතුළු විය යුත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උරුමය ද රැගෙනය. ඔහු ජාතියේ ආධ්‍යාත්මික නායකයා බවට පත් විය යුත්තේ ඒ මහා සන්ධානය තුළිනි.

ඒ මහා සන්ධානය විසින් රටට ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ සහ ජාතික න්‍යාය පත්‍රය විසින් ඉදිරි ජනාධිපතිවරණයේ ජයග්‍රහණය තීරණය කෙරෙනු ඇත. ඒ සටනේ දී **පොදු අපේක්ෂකයා තේරීමේ**

මහා සදාචාර අයිතිය ද මහජනයා විසින් මහින්ද රාජපක්ෂයන්ට පවරා ඇත. ඒ පොදු අපපේක්ෂකයා කවුරු වුවත් ඔහුගේ මුහුණ ඉදිරි ජනාධිපතිවරණයේදී මහජනයා දකිනු ඇත්තේ මහින්ද රාජපෂයන්ගේ මහා ප්‍රතිරූපය මුල්කරගත් පුළුල් ජාතික සන්ධානයක් තුලිනි. පොදු ජාතික න්‍යාය පත්‍රයක් සහ නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත් කරමින් තරග කිරීමට සුදුසුකම් තිබිය හැකි අපේකෂකයින්ගේ කෙටි නම් ලැයිස්තුවට ගෝඨාභය රාජපක්ෂයන් පමණක් නොව, මෛත්‍රීපාල සිරිසේනයන්ට ද ඇතුළුවිය හැක.

ඒ මහා සන්ධානය තුළ බෙදුම්වාදී ජාතිවාදී කුඩා පක්ෂවල කේවල් කිරීමේ බලය ද අහිමි වී යනු ඇත. ''මෛත්‍රී සාධකය''ඇතිව හෝ නැතිව එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඓතිහාසික උරුමය නියෝජනය වන සන්ධානයකට ජාතිවාදි පක්ෂවල කේවල් කිරීම් වලට යටත් නොවී ජය ලබාගත හැකි බව පුංචි මැතිවරණයේදී බහුතර ජනතාව විසින් ඔප්පුකොට ඇත. රට අවුලින් මුදවා ගත හැකි ව්‍යවස්ථාවක් සම්මත කළ හැක්කේ ජාතිවාදී සුළු පක්ෂ වල බලපෑමට යටත් නොවන ඒවැනි ආණ්ඩුවකට පමණි. මහින්ද රාජපක්ෂයන්ට විධායක අගමැති ලෙස ඊළග භූමිකාව පැවරෙන්නේ ඒ නව ව්‍යවස්ථාව යටතේය. ඒ ගමනේ දී රට මුහුණෙදන අභියෝගයට සාපේක්ෂව මහින්ද රාජපක්ෂ නැමති සන්නාමය ජනතා හදවත් තුළ නැවත ස්ථානගත කිරීම යනු මහින්ද රාජපක්ෂයන්ටම පැවරෙන වගකීමකි. නමුත් යම් බොළද දේශපාලකයින් කියන ආකාරයට ලැබුණු ජනවරම කෙරෙහි පමණක් විශ්වාසය තබා පොහොට්ටුවේ පතිවත රැකීමට ගියහොත් ඉතිහාසය විසින් නිර්මාණය කළ ඒ මනරම් අවස්ථාව ගිලිහී යා හැක.




03

# ආණ්ඩුව කළ දේ සහ නොකළ දේ සහ මැතිවරණ ප්‍රතිඵලය

යහපාලන ආණ්ඩුවේ සිවිල් ආරක්ෂකයින් ලෙස පදක්කම් පැළඳ සිටින එන්.ජී.ඕ. කාරයින්ට අනුව ආණ්ඩුව පුංචි මැතිවරණයෙන් අන්ත පරාජයක් අත් පත් කර ගන්නේ මහජනයාට ලබා දුන් පොරොන්දු ඉටු නොකිරීම නිසාය. ජනතා විමුක්ති පෙරමුණද තම පරාජය වසා ගැනීම සඳහා එම තර්කයම වෙනත් වචනවලින් ඉදිරිපත් කරන්නට යෙදුනි. ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා වන මංගල සමරවීර මහතා ද මෙම මතය ඉහළින්ම තහවුරු කළේය. එසේම ඔහු ඉන් ඔබ්බට ගොස් කියන්නේ එම වරද නිවැරදි කොට මහින්ද රාජපක්ෂ යළි බලයට ඒම වැළැක්වීම ආණ්ඩුවේ මූලික වගකීම බව ය. මේ සියලු පාර්ශ්ව ආණ්ඩුව නොකළ දේ යනුවෙන් හඳුන්වන්නේ හොරු ඇල්ලීමේ ක්‍රීඩාව නිවැරදිව සිදු නොකිරීම ය. මෙම තර්කය මගින් ඔවුහු ආණ්ඩුව විසින් මහජනයාට ලබාදුන්නේ 'ව්‍යාජ පොරොන්දු මාලාවක් බව සැඟවීමට උත්සාහ කරති. අනෙක් පැත්තෙන් ඔවුහු ආණ්ඩුව විසින් තමා බලයට පත්කළ ස්වාමිවරුන්ට ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට ගන්නා වූ අපරිමිත උත්සාහය සැඟවීමට උත්සාහ කරති.

හොරු ඇල්ලීමේ සෝෂාව ආණ්ඩුවට වැදගත් වන්නේ සැබෑ ලෙසම හොරු ඇල්ලීම මගින් රටට යහපතක් සිදු කොට මහජන විශ්වාසය තහවුරු කරගැනීමට නොවේ. එම සටන් පාඨය ආරම්භයේ පටන් ඔවුනට වැදගත් වූයේ මහින්ද රාජපක්ෂ පාලනය බිම දැමීමට සහ දිගින් දිගටම ඔහුගේ බලකඳවුර යටත් කර තබා ගැනීමටය. එසේ හොරු ඇල්ලීමට පොරොන්දු වී බලයට පැමිණි ආණ්ඩුවක් ඉතිහාසයේ විශාලතම මූල්‍ය වංචාවට සිදු කොට එය සැඟවීමට ගොස් හත් පොලේ ගා ගත් ආකාරය දැන් රටට රහසක් නොවේ. රනිල් වික්‍රමසිංහ මහතාට 2015 අගෝස්තු මාසයේ දී ඡන්ද ලක්ෂ 50 ක් ලබා දුන් ජනතාව ඉන් ලක්ෂ 14 ක් ආපසු උදුරා ගැනීමට කටයුතු කරන්නේ ප්‍රධාන වශයෙන් ඒ නා ගැනීම නිසාය.

**බැඳුම්කර වංචාව මුල් කරගෙන එක්සත් ජාතික පක්ෂ විරෝධී ඡන්ද ගොඩ කඩා ගැනීමට මෛත්‍රීපාල ජනාධිපතිතුමා විසින් ගනු ලැබූ උත්සාහය අසාර්ථක වන්නේ එතුමා මුල් අවස්ථාවේදීම එම වංචාව සැඟවීමට උදව් කළ නිසාය. එතුමා විසින් ඩිව් ගුණසේකර වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඉඩ නොදී ක්ෂණිකව පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා එම වංචාවට එරෙහිව නිසිකළ නිසි පියවර ගැනීමට නොහැකි විය. එතුමා එදා එම වරද නොකළා නම් 2015 දී පළමු වටයේදී සිදු වූවාට වඩා බරපතළ ලෙස එම වංචාව 2016 නැවත සිදු වන්නේ නැත.**

කෙසේ වෙතත් ආණ්ඩුව විසින් තම විරුද්ධවාදීන් මැඩලීම මුල්කරගෙන හොරු ඇල්ලීමේ ව්‍යාපාරය හැකි උපරිම ආකාරයෙන් දියත් කළ බව ජනතාවට නම් රහසක් නොවේ. එය අසාර්ථක වන්නේ ආණ්ඩුවට ඒ සඳහා උවමනාවක් නොතිබූ නිසා නොවේ. එක් පැත්තකින් එම ක්‍රියාවලියේදී තමා ළඟ දණ ගැසූ හොරුන් නිදහස්කොට තමාට විරුද්ධ හොරුන් පමණක් ඇල්ලීමට උත්සාහ කිරීම නිසා එම ක්‍රියාවලිය උපරිම කාලයකට ගෙන ඒම ස්වාභාවිකවම අපහසු වේ. උදාහරණයක් ලෙස අල්ලස් පනත යටතේ රාජිත සේනාරත්න ඇමතිවරයාට විරුද්ධව නඩු පවරන්නේ නැතිව

මහින්දානන්ද අලුත්ගමගේ මහතාට පමණක් නඩු පැවරීම පහසු වන්නේ නැත. ඒ මහතාට පැවරූ නඩුවලින් ඔහු නිදහස් විය. ඔහු නිදහස් වන්නේ ඔහුට විරුද්ධව ආණ්ඩුව විසින් එල්ල කළ චෝදනා ඔප්පු කිරීමට නොහැකි වීම නිසාය. ඒ ආකාරයට තවත් විපක්ෂ දේශපාලනඥයින් සහ නිලධාරීන් සියගනනක් අල්ලස් කොමිසමට කැඳවා ප්‍රශ්න කළ ද නඩු පැවරීම්ට තරම් සාක්ෂි ලැබී නැත.

**නඩු පැවරීමට දේශපාලන වුවමනාවක් තිබූ පමණින් නඩු පැවරිය නොහැක. ඒ සඳහා උසාවියට ඔප්පු කළ හැකි සාක්ෂි සොයාගත යුතුය. පාලකයන්ට ද්වේශය සහ උවමනාව තිබූ පමණින් රජයේ එදිනෙදා පරිපාලන කටයුතු වලදී කරන වැරදි සඳහා යමකුට විරුද්ධව අපරාධ නඩු පැවරීමේ හැකියාවක් නැත. එහෙත් බොරු චෝදනා ගොතා පොදු දේපළ පනත යටතේ තම විරුද්ධවාදීන්ට දඬුවම් කිරීමට ආණ්ඩුව විසින් දැඩි ලෙස උත්සාහ කොට ඇත. නඩුවක් ඔප්පු කිරීම්ට සාක්ෂි නැතත් තමන්ට අවශ්‍ය අය මාස කිහිපයක් හෝ රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීම්ට උත්සාහ කළ අවස්ථා රාශියක් ඇත. විමල් වීරවංශ මන්ත්‍රීවරයාට එසේ කරන්නේ වාහන අවභාවිත චෝදනාවක් එල්ල කරමිනි. ගම්මන්පිල මන්ත්‍රීවරයාට පටලවන්නේ පැරණි සිවිල් ගනුදෙනුවකට අදාළ චෝදනාවකි. තිස්ස අත්තනායක මහතා රිමාන්ඩ් කරන්නේ කූඨ ලේඛනයක් සකසා ජාතීන් අතර අසමගියක් ඇති කිරීමට උත්සාහ කළ බවට චෝදනා එල්ලකරමිනි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාට ද එවැනිම අභූත මුදල් වංචා චෝදනාවක් එල්ල කොට රිමාන්ඩ් කරන ලදී.**

ඒ ආකාරයට හොරු ඇල්ලීමේ මුවාවෙන් නඩු පැවරීමට කුඩා හෝ ඉඩක් ඇති තමන්ගේ විරුද්ධවාදීන්ට එරෙහිව ආණ්ඩුව නීතිමය පියවර රාශියක් ගෙන ඇත. එහෙත් හොරු ඇල්ලීම සඳහා එක් පැත්තකින් මහා පරිමාණ හොරකම් සිදු වී තිබිය යුතු අතර අනෙක් පැත්තෙන් සාක්ෂි තිබිය යුතුය. **ලැම්බෝගිනි සහ රත්රන්**

**අශ්වයාගේ කතා පට්ටපල් බොරු බව දැන් ඉතා හොඳින් ඔප්පු වී ඇත. ඒ බොරුවලට කිසිවකු රිමාන්ඩ් කිරීමට නොහැකි වන්නේ ඒවා පට්ටපල් බොරු නිසා මිස ආණ්ඩුව විසින් නඩු පැවරීම්ට උත්සාහ නොකළ නිසා නොවේ. ඩුබායිවල ඩොලර් ගිණුම් සෙවීමට ගොස් හොරු ඇල්ලීමේ ඔස්තාර්ලා කොපමණ රජයේ මුදල් තම සාක්කුවට දමා ගත්තා ද යන්න දැන් ප්‍රසිද්ධ රහසකි. හොරු ඇල්ලීමේ සටන් පාඨය හරහා යම් එන්.ජී. ඕ. කාරයෝ ඊනියා හොරුන්ට වඩා හොඳින් රජයේ මුදල් හොරකම් කළහ.**

ඒ ආකාරයට ආණ්ඩුව විසින් හොරු ඇල්ලීම සඳහා ගන්නා වූ උත්සාහය තවත් දීර්ඝ වශයෙන් මතක් කර දිය හැක. ඒ නිසා හොරු ඇල්ලුවේ නැති නිසා ආණ්ඩුව පැරදුනා යන ගොන් තර්කය වලංගු නොවන බව ඉතා පැහැදිලිව ඔප්පු කළ හැක. එසේම තාජුඩීන්ගේ මළ මිනි ගොඩ දමා එක්නැලිගොඩලාගේ සහ ලසන්ත වික්‍රමතුංගගේ මළ මිනී වල පින්තූර පෙන්නා හමුදා නිලධාරීන් කෙතරම් පිරිසක් දීර්ඝ කාලීනව රඳවාගෙන සිටිනවා ද? ඒ නිසා ආණ්ඩුව විසින් එන්.ජී.ඕ. කාරයින්ට ලබාදුන් පොරොන්දු ද අති බහුතරයක් ඉටු කොට අවසන් බව සැඟවිය නොහැක. හමුදා ඔත්තුසේවා දුර්වල කොට දුර්මුඛ කිරීම මගින් එන්.ජී. ඕ. කාරයන් සහ ඩයස්පෝරාව සතුටු කිරීමේ නාඩගම ආණ්ඩුව විසින් ඉතා හොඳින් රඟ දැක්වූ බව මහජනයාට රහසක් නොවේ. එම විනාශයේ ප්‍රතිඵල බෙදුම්වාදී ව්‍යවස්ථාව සම්මත කළහොත් නුදුරු දිනවලදී මහජනයා විසින් ප්‍රායෝගිකව අත්දකිනු ඇත. කෙසේවෙතත් ඒ ආකාරයට ආණ්ඩුව විසින් මහජනයාට පමණක් නොව එන්.ජී.ඕ. කාරයින්ට සහ ඩයස්පෝරාවට ලබාදුන් පොරොන්දු බොහෝ දුරට ඉටු කළ බව පිළි ගැනීමට හැකි සාක්ෂි ඕනෑ තරම් ඉදිරිපත් කළ හැක. ඒ නිසා එසේ පොරොන්දු කඩ කළ නිසා ජනතාව විසින් ආණ්ඩුව පරාජය කළා යන තර්කය වලංගු නොවේ.

මහජනයා විසින් සැබැවින්ම ආණ්ඩුව පරාජය කරන්නේ මහජනයාට ලබාදුන් පොරොන්දු කඩ කිරීමට වඩා මහජනයාට හොරෙන් තමා බලයට පත්කළ ස්වාමිවරුන්ට ලබා දුන් පොරොන්දු ඉටු කිරීම නිසාය. යුද්ධයට ප්‍රබල ලෙස දායකත්වය සැපයූ රණවිරුවන් දඩයම් කිරීම ඉන් එක් පොරොන්දුවක් පමණි. පසුගිය ජනාධිපතිවරණයට පෙර බෙදුම්වාදී බලවේගවලට සිංගප්පූරුවේදී සහ ජිනීවාවලදී පොරොන්දු වූ ආකාරයට බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනයකට ඉඩ සැලසීම ද එවැන්නකි. මහා සංඝරත්නයට නින්දා අපහාස කරමින් උන්වහන්සේලා සිරගත කොට දුක් දීමේ සිට සංඝ භේදය ඇති කිරීම සහ විවිධ ආකාරයට සංස්කෘතික සෝදා පාළුවට පාර කැපීම ද ආණ්ඩුවේ ස්වාමිවරුන්ගේ ප්‍රබල වුවමනාවකි. ඒ උවමනාවන් ආණ්ඩුව ඉතා හොඳින් ඉටු කිරීමට ගනු ලැබූ උත්සාහය මහජනයාගෙන් සැඟවීමට නොහැක. මංගල සමරවීර විදේශ අමාත්‍යවරයා ජිනීවා මානව හිමිකම් සමුළුවේදී අපේ රණවිරුවන් යුද අපරාධ කළ බවට පිළිගන්නේ ස්තුති පූර්වක ය. ඒවා ගැන රටේ සමස්ත ජනතාව සංවේදී නොවුවත් යම් පිරිසක් සංවේදී වන බව ඉතිහාසය විසින් ඔප්පුකොට ඇත. ඡන්ද ප්‍රතිඵලවලින් පිළිබිඹු වන්නේ එම තත්ත්වය මිසක් වෙනත් කුමක්ද? රාජ්‍ය දේපළ විකිණීම සහ ආර්ථිකය කාබාසිනියා කොට ජනතාව මත බර පැටවීමේ විපාක ද එම ඡන්ද ප්‍රතිඵලය තුළින් පිළිබිඹු වේ.

ජාතික සංවිධාන මහජනයාගෙන් ඉල්ලා සිටියේ පුංචි මැතිවරණය එක් පැත්තකින් බැඳුම්කර හොරුන්ට දඬුවම් දෙන ජනතා අධිකරණයක් බවට පත්කර ගන්නා අතර අනෙක් පැත්තෙන් එය බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනය පරාජය කරන පාර්ලිමේන්තු සැසියක් බවට පත් කරගන්නා ලෙසය. ජනතාව එම ආයාචනා පිළිගෙන ඇත. මෛත්‍රී-රනිල් පාර්ශ්වවල ඡන්ද ගොඩ බරපතළ ලෙස අඩුවන විට මහින්ද රාජපක්ෂ මහතාගේ ඡන්ද ගොඩ වැඩි වන්නේ ඒ නිසාය. මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයා අවසානයට ලබාගත් ඡන්ද ප්‍රමාණය වන ලක්ෂ 62 ලක්ෂ 12 දක්වා අඩුකිරීමට

සහ මහින්ද රාජපක්ෂ මහතා අවසානයට ලබාගත් ඡන්ද ප්‍රමාණය ලක්ෂ 47 සිට 49 දක්වා වැඩිකිරීමට මහජනයා කටයුතු කරන්නේ ආණ්ඩුව ඉටු නොකළ පොරොන්දු නිසා නොව ඉටු කළ පොරොන්දු නිසාය. ඒ නිසා දැන් ආණ්ඩුවේ වහල ආණ්ඩුවේ පාර්ශ්ව දෙකේ හිස මත පමණක් නොව ඔවුන් ආරක්ෂා කරන ඩොලර්වලින් පඩි ලබන එන්.ජී.ඕ. කාක්කන්ගේ හිස මත ද පතිත වී ඇත.

දැන් දෙස් විදෙස් සියලු බලවේග එකාමෙන් දුවන්නේ ආණ්ඩුව කෙලින් කිරීමට මුක්කු ගසමින්ය. ඇමරිකානු සහ ඉන්දියානු තානාපති නිලධාරීන් ටාජ් හෝටලයේදී යම් ඇමතිවරුන් මුණගැසෙන්නේ එවැනි මුක්කු සොයා ගැනීම සඳහා උදව් කිරීමට බව වාර්තා විය. එවැනි තත්වයක් තුළ පරාජිත ආණ්ඩුවකට මුක්කු සොයා දීමට ජයග්‍රාහී මහින්ද පාර්ශවය මහන්සි වන්නේ කුමකටදැයි මහජනයා ප්‍රශ්න කරති. රට අස්ථාවර වීම වැළැක්වීම හෝ ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග විසින් රනිල් - සම්බන්ධන් සන්ධානයක් සෑදීම වැළැක්වීම සඳහා වෙනත් ආණ්ඩුවක් හැදිය යුතු නම් ඊට මහජන ආශිර්වාදය ලබාගත යුතුය. එසේ නැතහොත් එම ක්‍රියාව ලැබුණු ජන මතයට එරෙහිව යාමක් ලෙස අර්ථ දැක්විය හැක. ලැබුණු ජන මතයට එකඟ ව ඔළුගෙඩි මාරු කළ හැකිනම් එය සිදුවිය යුත්තේ මහජනයා ඡන්දයේ දී පරාජය කළ කොන්දේසි එම ආණ්ඩුව යටත් කිරීමේ කොන්දේසි බවට පරිවර්තනය කිරීමෙනි. එසේ කොන්දේසිවලට යටත්ව බල හුවමාරුවක් කෙරෙන්නේ නම් එය අනිවාර්යෙන්ම පරිවාස ආණ්ඩුවකි.

පරිවාස හෝ භාරකාර ආණ්ඩුවක් පැවතිය යුත්තේ යම් නිශ්චිත කාලයකදී නිශ්චිත අරමුණක් ඉටු කර ගැනීම සඳහා පමනි. එසේ වුවත් ජනාධිපතිතුමාගේ ජනවරම මහජනයා විසින් ආපසු උදුරා ගෙන ඇති බැවින් එතුමාට එම ආණ්ඩුවේ නායකයා විය හැක්කේ එතුමා දැන් තමා නිර්පාක්ෂිකයෙකු බව ප්‍රකාශයට පත් කිරීම මගින් පමණි. එනම් එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති පදවියෙන්

ඉවත්වීමට සිදු වනු ඇත. එම නිර්පාක්ශිකත්වය මහජන පිළිගැනීමට ලක් වුවහොත් සහ එතුමා ඊට අනුව කටයුතු කළහොත් එම සුදුසුකම විසින් ඔහුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන විධායක නොවන ජනාධිපති පොදු අපේක්ෂකයා බවට බෞතීස්ම කිරීමට ද ඉඩ ඇත. කෙසේ වෙතත් ඒ සඳහා ඔහුට බොහෝ වෙනස් වීමට සිදුවනු ඇත. සමහරවිට එවැනි එකඟතාවයක් තුළ එනම් විධායක අගමැති ව්‍යවස්ථාවක් සම්මත කිරීමේ උවමනාව සඳහා ජනාධිපතිවරණය ඉක්මනින් කැඳවීමට ද හැකියාවක් තිබේ. එවැනි තත්ත්වයකදී පරිවාස ආණ්ඩුව අවශ්‍ය වන්නේ නව ව්‍යවස්ථාවක් සකස් කොට එය ජනතාවට ඉදිරිපත් කොට ජනාධිපතිවරයා විධායක නොවන ජනපති බවට පත්වන මැතිවරණය පැවැත්වෙන තෙක් පමණි.

**නමුත් පරිවාස ආණ්ඩුවක් මහජන වරමට අනුකූල වන්නේ සහ මහජන පිළිගැනීමට ලක්වන්නේ ඊට පැනවෙන කොන්දේසි අනුවය. මැතිවරණයේදී ආණ්ඩුව පැරදවීමට හේතු වූ කරුණු සැලකිල්ලට ගැනීමේදී එවැනි කොන්දේසි දහයක් හඳුනාගතහැක. ඉන් පළමුවැන්න දැනට ආරම්භ කොට ඇති බෙදුම්වාදයට පක්ෂපාතී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අත්හිටුවා ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය විසුරුවා හැරීම ය.** දෙවැන්න මානව හිමිකම් කවුන්සිලයේදී මංගල සමරවීර මහතාගේ රට පාවාදුන් එකඟතාව වෙනස් කොට ශ්‍රී ලංකාවේ හමුදාවට චෝදනා එල්ල කළ මානව හිමිකම් කොමසාරිස්ගේ වාර්තාව සහ 30/1 සමුළු යෝජනා අත්හිටුවා ඒවා නැවත සමාලෝචනය කිරීම සඳහා විශේෂ සමුළු වාරයක් ලබාගැනීමය. තුන්වැන්න පළමුවැනි යෝජනාවට බැඳී ඇති අතර ඒ මගින් දෙමළ ඩයස්පෝරාව සතුටු කිරීම සඳහා අසාධාරණ ලෙස හෝ චෝදනා රහිතව අත්අඩංගුවේ තබා ගෙන සිටින රණවිරුවන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිය යුතුය. එය ඉතා ප්‍රබල ලෙස මහජන විරෝධයට ලක් වූ වරදකි.

හතරවැන්න, රණවිරුවන් ජාත්‍යන්තර අධිකරණයට ගෙන යාම සඳහා පාර්ලිමේන්තුවේදී බලහත්කාරයෙන් සම්මත කළ අතුරුදන්වීම් වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත බල රහිත කිරීමය. පස්වැන්න දැනට කපා දමා ඇති මහජන සහනාධාර සියල්ල නැවත ලබා දීමය. ඊට ගොවියාගේ පොහොර සහනාධාරය පමණක් නොව පාසල් නිල ඇඳුම් සහ පෙළපොත් සහනාධාරය ද ඇතුළත් වේ. හයවැන්න පවතින නීතියෙන් රිංගා බැදුම්කර නිකුත් කර නීත්‍යනුකූලව බැඳුම්කර මගඩිය කිරීම සඳහා ඉදිරිපත් කරන නව බැදුම්කර මගඩි පනත හෙවත් සක්‍රීය වගකීම් කළමනාකරණය කිරීමේ පනත අත්හිටුවීම ය. පාර්ලිමේන්තුවේ කමිටුවක් පිහිටුවා පසුගිය බැඳුම්කර වංචාවට එරෙහිව කෙරෙන නීතිමය කටයුතු අධීක්ෂණය කිරීම ද ඊට අයත් වේ.

හත්වැන්න විශ්ව විද්‍යාල සිසුන් සහ දෙමව්පියන් අතර මහත් විරෝධයට ලක්වූ සයිටම් අයතනය අහෝසි කිරීම හෝ අවශ්‍ය නම් රජය යටතේ තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා පාර්ලිමේන්තුවේ නව පනතක් සම්මත කිරීම ය. අටවැන්න විය යුත්තේ රටේ ජනතාව අතිබහුතරයක් ණය බරින් පීඩාවට පත් කිරීමට හේතු වී ඇති සුළු ණය පොලී අනුපාත පාලනය කිරීමය. නවවැන්න මිල පාලනයක් සහ මිල සූත්‍ර හඳුන්වා දීම සහ ආනයන බදු පැනවීම් මගින් ආහාර මිල පාලනය කරන අතර දේශීය නිෂ්පාදකයා ද ආරක්ෂා කිරීමට පියවර ගැනීමය.

දසවැන්න ඉතාම වැදගත් වන්නේ පරිවාස ආණ්ඩුවේ අපක්ෂපාතීත්වය තහවුරු කිරීම සඳහා ය. ඒ සඳහා ඉහත සඳහන් කළ ආකාරයට ජනාධිපතිතුමා නිර්පාක්ෂික වීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත් තවත් අත්‍යවශ්‍ය අතුරු කොන්දේසියක් ද වේ. එය ඉදිරි මැතිවරණ බලපෑමෙන් තොරව පැවැත්වීම සඳහා ඉතා වැදගත් වේ. වර්තමාන මැතිවරණ කොමිසමේ සභාපතිවරයා, යම් මට්ටමකට දේශපාලකයින් විසින් ඡන්දදායකයා වෙත කරනු ලබන බලපෑම්

අවම කිරීමට සමත්ව ඇත. එහෙත් ඔහු පක්ෂපාතී බවට සහ අත්තනෝමතිකව තීන්දු තීරණ ගන්නා බවට මෙන්ම මැතිවරණ ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාවේදී ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු සමග රහසිගතව ඔහුගේ කාර්යාලයේ දී සාකච්ඡා කළ බවට චෝදනා එල්ල වී ඇත. පාර්ලිමේන්තු කමිටුවක් මගින් එම චෝදනා විභාග කොට ඔහුව නිර්දෝෂී කෙරෙන තෙක් ඉදිරි මැතිවරණ පිළිබඳ මහජනයා තුළ සැක සංකා පහළ වීම වැළැක්විය නොහැක. එසේ ම දැනට වාර්තා වන ආකාරයට ඒකාබද්ධ විපක්ෂය පරිවාස ආණ්ඩුවේ වගකීම දරන්නේ නැතිනම් 'පරිවාසය' අධීක්ෂණය කිරීමේ වගකීම ඔවුන් විසින් භාරගත යුතුය.



04

# මෛත්‍රී - මහින්ද එකතුව: එදා හැකිවීම සහ අද නොහැකි වීම

''දේශපාලන මිත්‍රද්‍රෝහිත්වය'' පිළිබඳව ශ්‍රී ලංකාවේ ඉතිහාස පොතට නව පිටුවක් එක් කළ මෛත්‍රී - මහින්ද කතා පුවත ඉතා විචිත්‍රවත් එකකි. එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයේ දේශපාලන පරම සතුරා සමග එක්ව එම පාර්ශ්වය පරාජය කළේය. ඉන් පසුව එසේ තම පක්ෂයේ සභාපතිවරයාට විරුද්ධව ජනාධිපතිවරණයේදී ප්‍රතිමල්ලවයා වූ නිසා පක්ෂ සාමාජිකත්වය සහ ලේකම් පදවිය අහිමි වූ ජයග්‍රහකයා එම පක්ෂයේ සභාපති බවට පත්විය. ඒ බලහත්කාරයෙන් හෝ ව්‍යවස්ථානුකූලව තරඟ වැදීමෙන් නොවේ. පක්ෂයෙන් ඉවත් කළ ලේකම්වරයා නැවත සභාපති වන්නේ පරාජිතයා විසින් ජයග්‍රාහකයාට ව්‍යවස්ථා විරෝධීව එම පදවිය ''බන්දේසියක'' තබා පරිත්‍යාග කිරීම නිසාය. ඒ සඳහා පරාජිතයා පෙළඹවූ මිත්‍රයන් සියලු දෙනා ජයග්‍රාහකයාගේ දේශපාලන පොරොන්දුවක් ඉටු කිරීමක් සඳහා පාර්ලිමේන්තුවේ දී ඔහුට විශේෂ

බහුතර කැමැත්ත ලබා දුනි. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය නමින් හැඳින්වූ එම පොරොන්දු පත්‍රය මගින් එසේ පරාජිතයාගේ මිත්‍රයන් විසින් ඔහුගේ සිවිල් අයිතිවාසිකම් අහිමි කරන ලදි. ඒ කතා පුවත එතකින් නිම වන්නේ නැත.

මෙම කතා පුවතේ සුවිශේෂත්වය වන්නේ අංක ගණිතමය වශයෙන් පරාජය වූ අපේක්ෂකයාට බහුතර ජනතාවගේ හදවත් තුළ බහුතර බලය හිමිවීම ය. ඔහුගේ පරාජයෙන් පසුව සමීපතම කල්‍යාණ මිත්‍රයන් යම් පිරිසක් ඔහු හැරදා විදේශ රටවලට පවා පලාගිය ද යම් පිරිසක් ඔහු සතු වූ සැබෑ ජනතා බලය උරගා බැලීමට තරම් නිර්භීත විය. පෙබරවාරි 18 වැනිදා නුගේගොඩ දී පැවැත්වූ එම පරීක්ෂණයෙන් පරාජිතයා නැවත ජන හදවත් තුළ ජයග්‍රාහකයා බවට පත්විය. ඉන් පසු ව රට හරහා හමා ගිය 'මහින්ද සුළඟ' නිසා දුර්මුඛව සිටි පරාජිතයාගේ ජන බලය නැවත අවදි විය. එසේ දේශපාලන කරළියේ මළවුන් අතරට ගිය නායකයෙක් මාසයකුත් දින තුනක් ඇතුළත නැවත මළවුන්ගෙන් නැගිටීමක් පිළිබඳ කතාවක් ශ්‍රී ලංකාවේ ඉතිහාස පොතේ සඳහන් නොවේ. නමුත් පුදුමය වන්නේ එසේ පරාජිතයින් ජයග්‍රහකයින් බවට පත් කිරීමට දේශපාලන ඥානය තිබූ පුද්ගලයන්ට දහනවවැනි සංශෝධනය නමින් ඇටවූ දේශපාලන උගුල තේරුම් ගැනීමට නොහැකි වීමය.

මෛත්‍රී - මහින්ද කතා පුවතේ දෙවැනි පරිච්ඡේදය ආරම්භ වන්නේ ඔහු හැර ගිය පිරිස් නැවත ඔහු සමග එක් වීමෙන් පසුවය. . ඉහත සඳහන් කළ ආකාරයට මළවුන්ගෙන් අවදි වූ වීරයාගේ ප්‍රජා අයිතිය ව්‍යවස්ථාව මගින් අහෝසි කිරීමෙන් පසුව ඔහු නැවත වටයකින් පරාජය කිරීම සඳහා එසේ නැවත එක්වූ පිරිස්වලට හැකිවිය. ඒ සඳහා යොදා ගැනුණේ ජයග්‍රාහකයා සමග එක්වීමෙන් පරාජිතයාට නැවත ජයග්‍රහණය කළ හැකිය යන සුවිශේෂී න්‍යායකි. එම න්‍යායට අනුව පරාජිතයා විසින් ජයග්‍රාහකයා සමග කිසිදු

ගිවිසුමක් අත්සන් කිරීම ද අවශ්‍ය විය. ඒ නිසා අඩුම තරමින් පාර්ලිමේන්තු මැතිවරණයක දී ජයග්‍රහණය හෝ පරාජය යන කුමන ප්‍රතිඵලයක් ලැබුණද හිමි වන ජාතික ලැයිස්තු මන්ත්‍රී පදවි දිනා ගැනීමට අදාළව හෝ ගිවිසුමක් ඇති නොවීය. ඒ සඳහා යම් පාර්ශවවලින් බලපෑමක් තිබුණ ද පරාජිතයා අත්හැර ගොස් නැවත පැමිණි පිරිස් විසින් එවැන්නක් අවශ්‍ය නොවන බවට බලවත් තර්ක ඉදිරිපත් කළ බව වාර්තා විය. එහිදී දෙපාර්ශ්වය විසින් මහජනයා ඉදිරියේ දී යම් කොන්දේසි ප්‍රමාණයකට සහ දේශපාලන වැඩ පිළිවෙළකට එකඟතාවයක් ඇති කරගත යුතු බවට යෝජනා ඉදිරිපත් වුවද ඒවා පවා ප්‍රතික්ෂේප වූ බව දැන් රහසක් නොවේ.

**එදා 2015 අගෝස්තු මාසයේදී මෛත්‍රී - මහින්ද සන්ධානයකට විරුද්ධ වූ පිරිස් තම මතය සාධාරණීයකරණය කළේ එසේ මහජනයාට ඉදිරිපත් කරන එකඟතාවයක් හෝ ගිවිසුමක් නොමැතිව එක්ව තරග කිරීම අනතුරුදායක වන බවට තර්ක කරමිනි. ඒ අනුව එම මැතිවරණ යේදී පුද්ගලික වූ විශ්වාසය මත දේශපාලන වශයෙන් සන්ධානගත වීම නිර්දේශ කළ පිරිස් දේශපාලන අඥබාලයන් බවට ඔප්පු විය. එහෙත් එම වරද දේශපාලන අඥබාල කමක් ද එසේ නැතහොත් සිතාමතා යම් උපායමාර්ගික උවමනාවකට යටත් වීමක් ද යන්න අනාගතයේදී හෙළිදරව් වනු ඇත. එම වරද නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ඒක් ප්‍රකාශයකින් මහින්දවාදීන් ලක්ෂ 11 ක් ඡන්දපොළට යාම වැළැක්විය හැකි විය. ඒ මගින් මහින්ද රාජපක්ෂ මහතා දෙවන වටයටත් පරාජය කෙරුණු අතර ඔහුට අගමැති තනතුර පමණක් නොව විපක්ෂනායකකම ද අහිමි කෙරිණි.** අගමැති තනතුර ඔහුට අහිමි වන්නේ අගමැතිකම නොදී සිටීමට ජනාධිපතිවරයාට තිබූ උවමනාව නිසා පමණක් නොව ඒ සඳහා සුදුසුකම් ලබා ගැනීම වැළැක්වීම නිසාය. ඔහු ජයග්‍රහණය කළා නම් සහ විශේෂයෙන්ම ගිවිසුමක් මත තරග කළා නම් ඔහුට අගමැතිකම අහිමි කිරීමට හැකියාවක් නැත. දැන් ඒම ප්‍රතිඵලයේ අවුල පෙන්වා ඒදා අනුගමනය කළ ක්‍රමවේදයේ අවුල පිළිබඳ සංවාදය යටපත් කිරීම මගින් එකම මූලික වරද නැවත සිදු කෙරෙන තත්වයක් මතු වී ඇත.

එදා පාර්ලිමේන්තු මැතිවරණයේදී මහජනයා විසින් සාක්ෂි දරන ආකාරයට ඉදිරිපත් කළ ගිවිසුමක් හෝ එකඟතාවයක් නොමැතිව මෛත්‍රී - මහින්ද සන්ධානයකට යාම තුළ සිදු වූ වරද මෙවර පළාත් පාලන මැතිවරණයේදී නිවැරදි කරන්නේ කෙසේද? කිසිසේත්ම සන්ධානයකට එකඟ නැත හෝ රෑ වැටුණු වලේ දවල් වැටෙන්නේ නැත යනුවෙන් පැතලි සටන්පාඨ ඉදිරිපත් කිරීම මගින් ඊට විසැඳුම් සොයා ගත හැකිද? මහජනයා සමඟ ගිවිසුමකට එළඹීම මගින් සියලු පාර්ශ්ව ජාතික එකඟතාවයකට යටත් කිරීම වෙනුවට මහජනයාට හොරෙන් අභ්‍යන්තර ඡන්ද ගිවිසුම් අත්සන් කිරීම මගින් එදා කළ වරද නිවැරදි කළ හැකිද? එදා විවෘත ගිවිසුමක් නොමැතිව වීම වරදක් වනවා සේම මෙදා එවැනි විවෘත ගිවිසුමක් නොමැතිව මෙන්ම හොර ගිවිසුමක් මගින් එක්වීම ද වරදක් බව පිළිගත නොහැකි ද? මෙම වැරදි දෙකටම මුල් වන්නේ එකම පිරිසකි. ඔවුන් තම උපායමාර්ගික ඥානයේ දුප්පත්කම වසාගන්නේ දේශපාලන බලය පෙන්වීමෙනි.

එදා ජයග්‍රහකයා විසින් පරාජිතයා අමාරුවේ දමන්නේ එම වරද නිසා නම් අද පරාජිතයාට ජයග්‍රහකයා විය හැක්කේ එම වරද නිවැරදි කිරීමෙනි. අද වන විට එදා ජයග්‍රහකයා දුර්වල වී එදා පරාජිකයා ශක්තිමත් වී ඇත. එම නිසා ශක්තිමත් පරාජිතයකු සහ දුර්වල ජයග්‍රාහකයකු පොදු න්‍යාය පත්‍රයකට එකඟ කර ගැනීම මගින් වැඩි වාසි අත් වන්නේ කාට ද? දුර්වල ප්‍රතිවාදියාට බියවීම නිසා පොදු එකඟතාවයකට බියවන්නා දුර්වලයෙක් ලෙස මහජනයා විසින් හඳුනා ගැනීම වැළැක්විය නොහැක. දේශපාලන නායකයකු තම සතුරා සහ සතුරාගේ මිතුරා අතර පවතින ප්‍රතිවිරෝධතා වර්ධනය වන විට සතුරාගේ මිතුරා දිනා ගැනීමට හෙවත් ඔහු වාසිදායක පොදු න්‍යාය පත්‍රයකට යටත් කර ගැනීමට උත්සහ නොකරන්නේනම් එය දුර්වලකමක් පමණක් නොව දේශපාලන අඥබාල කමකි.

එසේම පුද්ගල චරිත වල දුර්වලතා හෝ අතීත භාවිතාවන් මත දේශපාලන සබඳතා ගොඩ නැගීම හෝ අත්හැරීම තීන්දු කරන්නේ නම් එයද බලවත් දුර්වලකමකි. එවැනි දුර්වල තීන්දු වලට යටත් වීම මගින් සමස්ත රටක් බරපතළ අර්බුදයකට තල්ලු විය හැක. එම න්‍යායාත්මක විග්‍රහය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ උදාහරණ ඕනෑ තරම් සොයාගත හැක. පළමුවැන්න 1976 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ වාමාංශික පක්ෂ අතර ගොඩනැගෙන ප්‍රතිවිරෝධතා කළමනාකරණය නොකිරීම නිසා 1977 දී ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් එහි වාසිය ලබා ගැනීමය. ඉන්පසුව 1982 දී එම වරද යම් පමණකට නිවැරදි කිරීමට හෝ තවදුරටත් ඊට ගොදුරු නොවී සිටීම සඳහා ලැබුණු අවස්ථාව අහිමි වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තර ගැටුම් කළමනාකරණය කිරීමට අසමත් වීම නිසාය. එම ක්‍රියාවලිය අවසන් වන්නේ දස දහස් ගණනින් ජීවිත බිලි දීමෙන් සහ ශ්‍රී ලංකාව ඉන්දු - ඇමරිකානු න්‍යාය පත්‍රයේ දීර්ඝකාලීන ගොදුරක් බවට පත් කිරීමෙනි.

**පසුකාලීනව 2002 දී රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව සටන් විරාම ගිවිසුම අත්සන්කොට තාවකාලික ආණ්ඩුව පිහිටුවීමට එකග වෙමින් ජාත්‍යන්තර බෙදුම්වාදී උගුලට රට ගොදුරු කරන විට ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉටු කළ ඓතිහාසික භූමිකාව කුමක්ද? එදා ජනතා විමුක්ති පෙරමුණේ බහුතර මතය වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය සමඟ දේශපාලන එකඟතාවයක් ඇතිකර ගැනීමට විරුද්ධවය. නමුත් ''නහය වසාගෙන හෝ ඇය සමග එක්ව රනිල් - සෝල්හයිම් න්‍යාය පත්‍රය පරාජය කළ යුතු බවට'' සෝමවංශ අමරසිංහයන් දැරූ මතය ජයග්‍රහණය කළ නිසා ශ්‍රී ලංකාව තවත් සුඩානයක් වීම වළක්වාගත හැකිවිය. සෝමවංශ අමරසිංහයන් එදා බහුතර මතයට යටත් වූවා නම් අද ශ්‍රී ලංකාවේ ජනතාව දෙකඩ වුණු රටක දෙපසට වී මරා ගන්නා අවාසනාවන්තයින් පිරිසකි. ඒ පිළිබඳව සෝමවංශ අමරසිංහයන්ට පුද්ගලිකව ගෞරවය හිමිවිය යුතුය. තනි පුද්ගලයන් විසින් රටවල වල ඉරණම වෙනස් කළ**

**අවස්ථා ඉතිහාසයේ ඕනෑතරම් ඇත. කෙසේ වෙතත් ඔහුගේ එම උත්සාහයට ගුණදාස අමරසේකර සහ නලින් ද සිල්වා වැනි විද්වතුන් දියත් කළ මතවාදී අරගලය ද බෙහෙවින් උපකාරී විය.**

**පසුව 2005 දී මහින්ද රාජපක්ෂයන් ජනාධිපති බවට පත්කිරීමේදීද සෝමවංශයන් විසින් ඒවැනිම භූමිකාවක් ඉටු කරනු ලැබීය. ඒහිදී විමල් වීරවංශයන් ද ඔහුගේ මතය වෙනුවෙන් දැඩි ලෙස පෙනී සිටියේය. ඒහිදී වර්තමාන ජ.වි.පෙ නායකත්වය විසින් දැරුවේ ඊට හාත්පසින්ම වෙනස් මතයකි. ඔහුට අවශ්‍ය වූයේ රටට පෙනෙන ලෙස මහින්ද රාජපක්ෂ සමග සන්ධානගත වී ඔහු පරාජය වීමට ඉඩ හැරීමය. නමුත් සෝමවංශ - විමල් සුසංයෝගය විසින් ඒම මතය ප්‍රායෝගිකව භාවිතාවෙන් පරාජය කරනු ලැබීය. ඒ නිසාද සෝමවංශ අමරසිංහයන්ට මේ රටේ මිනිසුන් සදාකාලිකව ණය ගැති බව පැවසීම දේශපාලන අතිශයෝක්තියක් නොවේ.**

නමුත් තනි පුද්ගලයෙකුගේ කැමැත්ත මත රටක ඉරණම තීන්දු වීමට ඉඩහැරීම භයානක සහ අවාසනාවන්ත තත්වයකි. මේ නිශ්චිත මොහොතේ දී එක්සත් ජාතික පක්ෂ රජයේ විජාතික න්‍යාය පත්‍රයට එරෙහිව පෙළ ගැස්විය යුතු සියලු බලවේග එකතු කිරීමට විරුද්ධ වන්නේ යමකු ද ඔහු ඉතා පැහැදිලිව එක්සත් ජාතික පක්ෂයේ බටහිර ගැති න්‍යාය පත්‍රයට සේවය කරන්නෙකි. එම වරද, එදා ජනතා විමුක්ති පෙරමුණ ඊනියා බහුතර කැමැත්තට යට වූවා නම් සිදු කළ හැකිව තිබූ වරදට සමාන වේ. අද පොදුජන පෙරමුණට සෝමවංශලා එක් අයකු නොව කිහිප දෙනෙක්ම අවශ්‍ය වී ඇති බව පැහැදිලිව පෙනේ. ඒ පුද්ගල සාධක නොසලකා රටට උවමනා පොදු ජාතික න්‍යාය පත්‍රය උඩට ගැනීමට එම පක්ෂය අසමත් වී ඇති නිසාය. ජනතාව සමඟ සමාජ ගිවිසුම්වලට එළඹීමට බිය වන නායකයින්ට පොදු සමාජ න්‍යාය පත්‍ර යනු නයාට අඳුකොළ මෙන් විෂ සහිත දේශපාලන සංකල්පයකි. ඒ නිසා ඔවුන් සැමවිටම උත්සාහ කරන්නේ පොදු න්‍යාය පත්‍රයකින් තොරව හෙවත් ජනතාව සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව බලය ලබා ගැනීමට ය.

මෙවර පුංචි මැතිවරණය මුල්කරගෙන මෛත්‍රී - මහින්ද සන්ධානයක් සඳහා ප්‍රධාන බාධාවක් බව පෙනුණේ මෛත්‍රී පාර්ශ්වය ජාතික ආණ්ඩුවෙන් ඉවත් වීමේ කොන්දේසියයි. එය ඉතා තර්කානුකූල සහ සාධාරණ කොන්දේසියකි. නමුත් එම කොන්දේසිය පූර්ව කොන්දේසියක් බවට පත් නොකර ජාතික ආණ්ඩු ගිවිසුම අවසන් කිරීමට එකඟ වී ඇති දිනයේ දී ඉටු කළ යුතු කොන්දේසියක් බවට පත් කළා නම් තත්ත්වය වෙනස් වීම්ට ඉඩ තිබුණි. එසේ වූවානම් එකඟතාවක් ඇතිකර ගැනීමට නොහැකිවීම පිළිබඳව මහජන ඇස් ඉදිරියේ විත්තිකරුවා වන්නේ මෛත්‍රී පාර්ශ්වය මිස මහින්ද පාර්ශවය නොවේ.

කෙසේවෙතත් අවසානයේදී එම පාර්ශව දෙකම ආමන්ත්‍රණය කළේ යූ.එන්.පී විරෝධී ඡන්ද පදනමට ය. ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණය දක්වා වන යූ.එන්.පී විරෝධී ජන බලවේගවලට එම පාර්ශ්ව දෙකේ ම ජන බලවේග අයත් වේ. මෙරට පුංචි ඡන්ද ප්‍රතිඵලය අනුව මෛත්‍රී - මහින්ද ජන බලවේගය විසින් 57.9% ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන ඇත. එසේනම් ඉදිරි ජනාධිපතිවරණයේදී එම ජන බලවේගයේ ජයග්‍රහණයය වැළැක්විය හැක්කේ එම පාර්ශව දෙක දුරස් කිරීමෙන් පමණි. ඉදිරි ජනාධිපතිවරණය ජයග්‍රහණය සඳහා සියලු ජාතිකවාදී , වාමවාදී , යූ.එන්.පී විරෝධී බලවේග එක කොඩියක් යටතට ගෙන ඒමේදී මෛත්‍රී සාධකය සමීකරණයෙන් ඉවත් කිරීමේ හැකියාවක් නැත. එසේ කිරීමට යෝජනා කරන සියලු පිරිස් ඊට හේතුව කුමක් වුවත් අවසානයේ දී ඉටු කරන්නේ රටට හතුරු බලවේගවල උවමනාවන් ය. අද වන විට මෛත්‍රී පාර්ශ්වය විසින් එතෙක් ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතිවාදී සුළු පක්ෂ විසින් අත්පත් කරගෙන තිබූ රජුන් තනන්නා ගේ භූමිකාව සම්පූර්ණයෙන්ම අත්පත්කරගෙන ඇත. බොහෝ දේශපාලන විචාරකයින් අපේක්ෂා කළේ ඊට වෙනස් තත්වයකි. දැන් මෛත්‍රී පාර්ශ්වය තමා සතු රජුන් තනන්නා ගේ භූමිකාව මගින් දේශපාලන වශයෙන් කේවල් කිරීමට නම් එම බලය

**ආරක්ෂා කරගත යුතුය.** එම බලවේගයේ අපේක්ෂාවලට අනුව කටයුතු කිරීමට මෛත්‍රීපාල සිරිසේන මහතා අසමත් වුවහොත් ඔහුගේ භූමිකාව ද අහිමි වී යනු ඇත. එම නිසා අද වන විට එම පාර්ශ්ව දෙක එක් අරමුණක් සඳහා පෙළ ගැස්වීමේ දේශපාලන විභවය ඉහළ මට්ටමක පවතී.

පටු දේශපාලන අරමුණු හෝ දේශපාලන ළදරු කම නිසා ඉතිහාසයේ අපේක්ෂාවට එරෙහිව ඉතා අමාරුවෙන් උඩුගම් බලා පිහිනීමටට උත්සාහ කරන පිරිස්වලට කරුණු අවබෝධ කිරීම එතරම් අමාරු නැත. එහෙත් හොරට නිදා සිටින්නන් අවදි කිරීම පහසු නැත. වෙනත් වචනවලවලින් කියනවා නම් ජනවාරි 8 ජනවරම පිටුපස සිටි බලවේගවල උපායමාර්ගික උවමනාව දැනුම්වත්ව ඉටු කරන පිරිස් වලට කරුණු අවබෝධ කිරීමට පහසු නැත. දැන් කළ යුත්තේ ඔවුන් දේශපාලන වශයෙන් පරාජය කිරීම ය. එසේ නැතහොත් ජනවාරි 8 වරද නිවැරදි කිරීමට ඉතිහාසය විසින් නිර්මාණය කොට ඇති අවකාශය භාවිතා කිරීමට ශ්‍රී ලාංකික ජාතිය අසමත් වනු ඇත. එය යළි කිසිදිනක ආපසු නිවැරදි කළ නොහැකි වරදක් වන බවට කිසිදු සැකයක් නැත. මුහුණුපොතේ සැරිසරමින් මෛත්‍රීගේ අතීත භාවිතාව හෝ එස් .බී දිසානායක වැනි පුද්ගලයන්ගේ ජන්මගති පිළිබඳව පැමිණිලි කරමින් ඉතා සද්භාවයෙන් ජාතික උවමනාව අනතුරට හෙළන විද්වතුන් සෝමවංශ අමරසිංහයන්ගේ භාවිතාවෙන් ඉගෙනගත යුතුය.




# 05

# 1956 ජයග්‍රහණයේ රහස සහ පූර්වාදර්ශය

1951 සැප්තැම්බර් 02දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගැනීමෙන් පසු එම පක්ෂයට ඓතිහාසිකව අනගාරික ධර්මපාල තුමා විසින් අවදිකළ ජාතිකවාදී බලවේග ඒකරාශී කිරීමට පුළුල් දැක්මක් හෝ වැඩපිළිවෙළක් තිබුණේ නැත. එහි ප්‍රතිඵලය වූයේ 1952 දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී එස්.ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් ඡන්දයට ඉදිරිපත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බරපතළ පරාජයක් අත් වීමයි. එදා සමසමාජ පක්ෂය ආසන 9ක් දිනා ගන්නා විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ද දිනා ගත හැකි වූයේ ආසන 9කි. ලබාගත් ඡන්ද ප්‍රමාණය අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විපක්ෂනායක කම හිමි වුවද බලවත් එක්සත් ජාතික පක්ෂය පෙරළා දැමීමට මහා සමාජ බලවේගයක් ඇවිලවීමේ හැකියාව ඔවුන්ට නොතිබුණි.

නමුත් 1956 දී මහා බලසම්පන්න එක්සත් ජාතික පක්ෂය පරදවා බණ්ඩාරනායක මහතාට ජයග්‍රහණය අත්පත් කරගත හැකි වූයේ අනගාරික ධර්මපාල තුමා විසින් අවදි කොට ඒ වනවිට නිද්‍රාශීලීව සිටි ජාතිකවාදී බලවේග අවදි කිරීමට මහා අවස්ථාවක් ඉතිහාසය විසින් නිර්මාණය කළ බැවිනි. ඒ 1956 පෙබරවාරි 4 වැනිදා බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාවේ නිර්දේශ මඟින් උද්දාමයට පත්වූ ජාතිකවාදී බලවේග විසින් 'දස පනතක්' සම්පාදනය කිරීමට සමත්වීම නිසාය. 1956 මාර්තු 3 වැනි දා හේන්පිටගෙදර ඥානසීහ හිමිපාණෝ සහ මැදගොඩ සුමනතිස්ස හිමිපාණන් ප්‍රමුඛ එක්සත් භික්ෂු පෙරමුණ විසින් එම දස පනත ඉදිරිපත් කොට එය පිළිගන්නා පක්ෂයට ඉදිරි මැතිවරණයේදී ඡන්දය ලබාදෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියහ. එදා එම සභාවට සහභාගි වූ බණ්ඩාරනායක මහතා තමා එම දස පනත හිස් මුදුනින් පිළිගන්නා බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් සිදු කොට එම ජාතිකවාදී න්‍යාය පත්‍රය තම අතට ගත්තේය. එම නිර්භීත පියවර 1956 මහ ජයග්‍රහණයට හේතු විය.

අද වන විට එදා 2009 යුද ජයග්‍රහණයෙන් පසු ජාතිකවාදී බලවේග නොසලකා පැමිණි ගමන විසින් අප රට නැවත ජාතිවාදී බෙදුම්වාදී බලවේගවලට යටත් වන තත්ත්වයක් ගොඩ නැඟී ඇත. එම අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය තුළ අප රට නැවත 1952 දක්වා ආපසු රැගෙන ගොස් ඇත. ඒ නිසා ඉතිහාසය නැවත ප්‍රතිනිර්මාණය කිරීමට අවස්ථාව උදා වී ඇත. එනම් බටහිර සහ ඉන්දියානු අධිරාජ්‍යවාදී බලපෑම් වලට යටත් නොවී සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් මහා සමාජය අවදි කිරීමේ ඉඩක් දැන් විවර වී ඇත. එම තත්ත්වය තුළ මහින්ද රාජපක්ෂයන්ට සහ මෛත්‍රීපාල සිරිසේනයන්ට, හේන්පිටගෙදර ඥානසීහ පරපුරේ භික්ෂූන් වහන්සේලා ඇතුළු ජාතික බලවේගවලට ඉතිහාසය විසින් නව භූමිකාවන් නිර්මාණය කොට ඇත.

# බණ්ඩාරනායක මහතාගේ ජයග්‍රහණය සඳහා මුල් වූ එදා 1956 දී එකඟ වූ දස පනත

01. සියලු ක්‍රියාවන්හි අවිහිංසා ප්‍රතිපත්ති අනුගමනය කිරීම.

02. කවර ස්වරූපයකින් හෝ පැමිණෙන අධර්මයට අහෝ මැර බලයට විරුද්ධව ක්‍රියා කිරීම.

03.බෞද්ධ කොමිෂන් සභා වාර්තාවේ යෝජනා ක්‍රියාත්මක කිරීම.

04. රටේ රාජ්‍ය භාෂාව සිංහල විය යුතු හැටියට වහාම නීති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හැම මගක්ම ගැනීම.

05. ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුවත් ආරක්ෂාවත් සැලසීම සහ පැසිස්ට් ඒකාධිපති ආණ්ඩුවක් හෝ කොමියුනිස්ට් ඒකාධිපති ආණ්ඩුවක් ඇති කිරීමට අදාළ වන දේ වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කිරීම සහ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කර තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී සංවිධාන ද ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන් ද වෙනස් කිරීම.

06. ජාතික කලා ශිල්ප ආයුර්වේද හා අනෙකුත් ජාතික උරුමයන් ට අයත් සකලාංග පුනර්ජීවනයට පත් කිරීම සහ චාම් ජීවිත අනුගමනය කිරීම.

07. තම තමන්ට අභිමත ආගමක් විශ්වාස කිරීමට හා ඇදහීමට ඇති පූර්ණ නිදහස දීමට ද ආගම් භේදයක් නොමැතිව සියලු දෙනාට සමාන ලෙස සැලකීම ද සහතික වන අතර මේ රටේ වැඩි ජනතාවගේ ආගම වන බුද්ධාගම ට මේ රටේ හිමිතැන පිළිගැනීම.

08. රටේ සියලු තරාතිරමේ අයට සතුටුදායක ජීවන තත්ත්වයක් ලබා දීමට නොවරදින සේ කටයුතු පිළියෙළ කිරීම.

09. ධනය සෑම දෙන ම අතර වඩා සාධාරණව බෙදී යන සේ කටයුතු පිළියෙළ කිරීම.

10. ජාති මමත්වයේ දියුණුවට බාධා වන පරිදි ජාතිභේද විදහාපාන දියුණු කරන එමෙන්ම ජාතීන් අතර අසමගිය හා අසමානකම් ඇති කරන කිසිම සංස්ථාවකට ආණ්ඩුව ආධාර නොදීමට වගබලා ගැනීම.

## අදට වලංගු වන නූතන දස පනත හෙවත් දස වැදෑරුම් ජාතික න්‍යාය පත්‍රයක සංකල්පීය රාමුව

01. අවිහිංසාවාදී ප්‍රතිපත්ති අනුගමනය කරමින් පසුගිය ආණ්ඩු පෙරළියෙන් පසුව සිදුවූ නොයෙකුත් දේශපාලන අකටයුතුකම් සහ පළිගැනීම් නැවත සිදු නොවීම සඳහා ඒවාට දායක වූ සියලූ දෙනාට මැදහත් සහ උසස් මනසින් පොදු සමාවක් ලබාදීම සහ පටු දේශපාලන ගැටුම් අවසන් කොට සිංහල, දෙමළ, මුස්ලිම් සමස්ත ජාතිය ම පොදු ජාතික දියුණුව සඳහා පෙළ ගැස්වීම මුල්කරගෙන මෙම මූලික ප්‍රතිපත්තිමය රාමුවට එකඟ වීම.

02. සියලුම ආකාරයේ අධර්මයට, මැරබලයට විදේශ බලපෑම්වලට සහ විවිධ ජාතිවාදී බෙදුම්වාදී බලවේගවල දේශපාලන කේවල් කිරීම් වලට යටත් නොවීම. ඊට අනුව මත් කුඩු කැසිනෝ සහ පාතාල ක්‍රියාකාරකම්වලට විරුද්ධව සියලු බලය යොදා ඒවා මැඩ පැවැත්වීම සහ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව යුද්ධයේ පීඩාවෙන් ගලවාගත් වීරෝදාර රණවිරුවන්ට දඬුවම් කිරීම සඳහා කරනු ලබන ජාත්‍යන්තර බලපෑම්වලට යටත් නොවීම

03. 2013 බෞද්ධ සංස්කෘතික පුනර්ජීවන කමිටු වාර්තාව මගින් පෙන්වාදී ඇති ශ්‍රී ලංකාවට හතුරු අධිරාජ්‍යවාදී බලවේග විසින් දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල සිදු කරන විවිධ ආක්‍රමණ කෙරෙහි අවධානය යොමු කොට ජාති ආගම් භේදයකින්

තොරව සමස්ත ජාතිය මගපෙන්වීම සදහා සියලු මෙහෙයවීම් සඳහා සියලු ජාතිකත්ව සහ ආගමික නියෝජනයන් සහිත ජාතික උපදේශක සභාවක් පත් කිරීම.

04. සිංහල භාෂාව රටේ නිල රාජ්‍ය භාෂාව ලෙස දෙමළ භාෂාව දෙවන පෙළ රාජ්‍ය භාෂාව ලෙස පිළිගන්නා අතර භාෂාව හෝ ජාතිකත්වය හෝ ආගම් මත කිසිදු පුරවැසියෙකුට වෙනස්කමක් සිදු නොවන ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් සියලු පුරවැසියන්ට එක සමානව සැලකීම සහ ඊට අදාළ පැමිණිලි විභාග කොට සාධාරණ විසඳුම් රජයට නිර්දේශ කිරීම සඳහා ජාතික සමානාත්මතා කොමිසමක් පිහිටුවීම සහ එම ක්‍රියාවලිය තුළ බෙදුම්වාදය සහ ජාතිවාදය මතවාදීව පරාජය කිරීම.

05. ප්‍රජාතන්ත්‍රවාදය හා ජන සම්මතවාදය ආරක්ෂා කිරීම සහ දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයන් සහ පොදු ජනතාව වෙත එල්ල කරනු ලබන බලපෑම අවම කිරීම සඳහා මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලු මහජන නියෝජිතයන් හෘද සාක්ෂියට එකඟව පොදු මහජන යහපත සලකා කටයුතු කිරීමට ඉඩ සැලසීම සඳහා සහ පොදු මහජනයාට තමා ජීවත්වන ප්‍රදේශයේ සිට රාජ්‍ය පාලනයට සම්බන්ධවීම සඳහා නව පාලන ව්‍යුහයක් සකස් කිරීම මුල්කරගෙන ඉදිරි ජනාධිපතිවරණයේදී නව ව්‍යවස්ථාවක් රටට ඉදිරිපත්කොට එම මැතිවරණය ජනමත විචාරණයක් බවට පත් කිරීම.

06. ජාතික, සංස්කෘතික, ආගමික අංග, කලා ශිල්ප, දේශීය වෛද්‍ය ක්‍රම ඇතුළු ජාතික උරුමයන්ට අයත් සකලාංග පුනර්ජීවනයට පත් කිරීම සහ එම ක්‍රියාවලිය තුළ ජාතික සමගිය සංහිඳියාව සහ ප්‍රතිසන්ධානයට අවශ්‍ය මූලික පදනම සකස් කිරීම.

07. තම තමන්ට අභිමත ආගමක් විශ්වාස කිරීමට හා ඇදහීමට ඇති සම්පූර්ණ නිදහස දීමට ද ආගම් භේදයක් නොමැතිව සියලු දෙනාට

සමාන ලෙස සැලකීමට ද සහතික වන අතර රටේ බහුතර ජනතාවගේ ආගම වන බුද්ධාගමට ඓතිහාසික හා සංස්කෘතික වශයෙන් හිමි තැන පිළිගැනීම මෙන්ම සිංහල, දෙමළ, මුස්ලිම් පොදු ජාතිමාමකත්වයේ දියුණුවට බාධා වන පරිදි ජාතිභේද, ආගම්භේද, කුලභේද, විදහාපාන සහ ප්‍රචලිත කරන සහ ජාතිකත්ව අතර අසමගිය සහ අසමානකම ඇති කරන ක්‍රියාමාර්ග වලට ඉඩ නොතැබීම.

08. රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සහ රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම මුල්කරගත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ ඒ තුළ රටේ ජීවත්වන විවිධ තරාතිරම්වල ජනතාවට විශේෂයෙන්ම බහුතර ග්‍රාමීය ජනතාවට සතුටු දායක ජීවන තත්ත්වයක් ලබා දීම සඳහා විශේෂ ප්‍රමුඛතාවයකින් කටයුතු කිරීම. රටේ බහුතරයක් වන ගොවි ජනතාවට විශේෂයෙන්ම වී ගොවියාට සහ කිරි ගොවියාට සම්ප්‍රදායානුකූලව තම ජීවන වෘත්තිය කරගෙන යාම සඳහා පහසුකම් සැලසීම සහ ඊට එරෙහිව බහු ජාතික ආහාර සමාගම් විසින් කරනු ලබන අකටයුතුකම් වැලැක්වීම මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම සහ වස විස නැති පෝෂ්‍යදායී සහ ආරක්ෂාකාරී ආහාර මහජනයාට ලැබෙන බව සහතික කිරීම.

09. බහුතර ජනතාව අතර ආදායම් සාධාරණව බෙදී යාම සහතික කිරීම් සඳහා සාධාරණ බදු ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ නිදහස් අධ්‍යාපනය සහ නිදහස් සෞඛ්‍ය සේවය උතුම් වූ පූජනීය වූ රාජ්‍ය සේවාවන් ලෙස තහවුරු කිරීම සහ දියුණු කිරීම සඳහා වන රජයේ වගකීම මෙන්ම පොදු සුබසාධනය සඳහා වන රජයේ වගකීම ව්‍යවස්ථාව මගින්ම සහතික කිරීම.

10. රටේ සිංහල, දෙමළ, මුස්ලිම් පොදු ජාති මාමකත්වයේ දියුණුවට බාධා වන පරිදි ජාතිභේද, ආගම්භේද, කුලභේද ,විදහාපාන හෝ වර්ධනය කරන හෝ ප්‍රචලිත කරන සහ ජාතිකත්ව අතර අසමගිය සහ අසමානකම් ඇති කරවන ක්‍රියාමාර්ගවලට කිසිදු ඉඩක් ලබා නොදීම. විවිධ ජාතිවාදී බලවේගවල නායකත්වයන්ට යටත් වී ඔවුන්ට

ලබා දෙන වරප්‍රසාදයක් ලෙස බහුතර පොදු ජනතාවගේ අපේක්ෂා වලට පටහැනිව යම් ජන වර්ගයකට විශේෂ වූ ප්‍රදේශ අයත් වන බවට කරුණු ලබන ඉල්ලීම්වලට ඉඩ නොදීම සහ සිංහල, දෙමළ, මුස්ලිම්, සියලු ජනතාවට එක සමානව සලකන රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මෙන්ම සෑම ශ්‍රී ලාංකිකයකුටම ජාති, ආගම්, කුල භේදයකින් තොරව තමා කැමැති ප්‍රදේශයක ජීවත් වීමට සහ එම ප්‍රදේශයේ ගම් සභා/ ජන සභා මට්ටමේ දී රටේ පාලනයට හවුල් වීමට ඉඩ සැලසීම සහ එම මූලධර්ම මුල්කරගත් මහජන ව්‍යාපාරයක් දිරිමත් කිරීම.

## පසු වදන

මෙය හුදු මග පෙන්වීමක් හෙවත් උදාහරණයක් ලෙස ඉදිරි ඉදිරිපත් කෙරෙන සංකල්පීය රාමුවක් පමණි ඒ පිළිබඳව මහා සංඝරත්නය ඇතුළු ජාතික බලවේග සහ මහා සමාජය අතර පුළුල් සංවාදයක් ඇති විය යුතුය.

ජාතික න්‍යාය පත්‍රයක් වටා මහජනයා පෙළගැස්වීම අභියෝගාත්මකව සහ විවෘතව සිදුවිය යුතුය. එවැන්නක් රහසේ කළ නොහැක. එය කළ යුත්තේ රටට හතුරු බලවේගවල න්‍යාය පත්‍රයට විවෘතව අභියෝග කරමිනි. සතුරාගේ සියලු ආයුධ උදුරාගත යුත්තේ මහජනයාගේ ඇස් ඉදිරියේ ඔවුන්ගේ අනුමැතිය සහ සහයෝගය සහිතව ය. පුංචි මැතිවරණය විසින් රට නව මාවතකට යොමු කොට ඇත. ඒ තුළ ජාතිවාදී බෙදුම්වාදී බලවේග අත තිබූ රජුන් තනන්නාගේ භූමිකාව අහෝසි වී ඇත. එසේම රටේ ඉරණම සමග සුදු කෙළීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ සතුව තිබූ එම භූමිකාව ද දැන් ජනතාව විසින් ඔවුනට අහිමි කොට ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද සහ මෛත්‍රී පාර්ශ්ව දෙක නියෝජනය කරන ඡන්ද පදනම තුළ ජාතිවාදී, බෙදුම්වාදී බලවේග ප්‍රතික්ෂේප කරන දෙමළ සහ මුස්ලිම් ජනතාව ද සැලකිය යුතු ප්‍රමාණයක් සිටින බවට විවාදයක් නැත.ඔවුන් සම්බන්ධන්ලාගේ

සහ හකීම්ලාගේ ජාතිවාදී බෙදුම්වාදී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන පිරිසකි. ඒ නිසා එම ජනතාව ඒ මහා ප්‍රවාහය තුළ රඳවා ගැනීම සඳහා ජාතිවාදීන්ට බලය බෙදීමේ කප්පම් ලබා දීමට අවශ්‍ය නොවේ. සම්බන්ධන්ගේ ජාතිවාදී, බෙදුම්වාදී න්‍යාය පත්‍රයට පක්ෂව ඡන්දය ප්‍රකාශකර ඇත්තේ උතුරේ ජනතාවගෙන් 35% පමණි. සිංහල, දෙමළ, මුස්ලිම් සියළු ජනතාවට සමානව සැලකීමේ පදනම මත උතුරේ බහුතර ජනතාව අතර බලාපොරොත්තු දැල්වීමේ හැකියාව ඇත.

ඒ නිසා දැන් ඉටුකරගත යුතු පූර්ව කොන්දේසිය වන්නේ මහින්ද - මෛත්‍රී පාර්ශ්ව නියෝජනය කරන 56 ඓතිහාසික බලවේගය සමගි කරවීමයි. එම බලවේගයේ උවමනාව, ආශිර්වාදය සහ බල කිරීම මත නායකත්වයේ මනෝභාවය තුළ වෙනසක් සිදුවිය යුතුය. එසේ නොවුණහොත් ඉතිහාසය විසින් නිර්මාණය කළ මනරම් අවස්ථාව ජාතියට අහිමි කිරීමේ වරදට ඔවුන් දෙපළට ඉතිහාසය විසින්ම දඬුවම් ලබා දෙනු ඇත. කෙසේවෙතත් මේ දිනවල මුහුණුපොතේ සැරිසරමින් ඇඟට පහසුවෙන් 'හාන්සිපුටු' දේශපාලන භූමිකාවක් ඉටුකරන යම් පිරිස් ඒ ඓතිහාසිකක උවමනාවට එරෙහිව මත පළ කරති.

ඔවුන් අත්රින් යම් පිරිසක් දේශපාලන අද බාලයන් විය හැකි වුවත් යම් පිරිසක් විවිධ ඔත්තු සේවාවලින් මෙහෙයවන ලද යම් දේශපාලන නායකයන්ගේ ගෝල බාලයන් බවට සැකයක් නැත. තවත් එවැනිම පිරිසක් එන්.ජී.ඕ. ඩොලර් කාක්කන් විසින් මෙහෙයවන බවට ද සැකයක් නැත. නමුත් ඒවා පිළිබඳව කම්පාවීමට හෝ කලබල වීමට අවශ්‍ය නැත. 2002 වසර වැනි මෑත ඉතිහාසය දක්වා ආපසු ගියත් එම කාලයේ සිට රට මුහුණ දුන් තීරණාත්මක අභියෝගවලදී මුහුණපොත හෝ එහි සැරිසරන එවැනි හාන්සිපුටු සටන්කරුවන්ගේ මුහුණ දක්නට ලැබෙන්නේ නැත. කෙසේ වෙතත් මහජන අපේක්ෂා නැමැති ගංගාව වේගයෙන් ගලන විට එවැනි බලවේගවලට උඩුගම් බලා පිහිනීමට හැකියාවක් ලැබෙන්නේ නැති බව ඉතිහාසය විසින් ඔප්පුකොට ඇත.



06

# වෙල්ලාලයින්ගේ ''ෆෙඩරල් සංහිඳියාව'' වෙනුවට සැබෑ ජාතික සංහිඳියාව

ජාතිකත්ව හෙවත් ජනකොටස් අතර සංහිඳියාව ජාතියක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික සාධකයකි. ශ්‍රී ලංකාව තුළ ඓතිහාසිකව බහුතර සිංහල ජනතාව සහ දෙමළ ජනකොටස් අතර සංහිඳියාව පලුදු වීමට මූලික වශයෙන් හේතු වන්නේ යටත් විජිත පාලකයන් විසින් රෝපණය කළ දෙමළ ජාතිවාදී, බෙදුම්වාදී ව්‍යාපාරයයි. ක්‍රමයෙන් පොදු ජනතාව සහ රජයට එරෙහි සන්නද්ධ යුද්ධයක් බවට පත්වූ එම ප්‍රවණතාව දීර්ඝ ගැටුමකින් පසු ව යුදමය වශයෙන් පරාජය කෙරුණද ජාතිවාදය සහ බෙදුම්වාදය මතවාදී ව පරාජය නොවීය. බෙදුම්වාදය ප්‍රචලිත කරන ජාතිවාදය පරාජය කිරීමෙන් තොර ව සංහිඳියාව ඇති කරන්නේ කෙසේ ද?

දෙමළ බෙදුම්වාදී තුවක්කු නිහඬ කිරීම සඳහා අති බහුතරයක් වූ සිංහල සොල්දාදුවන්ට දස දහස් ගණනින් ජීවිත දන්දීමට සිදුවිය. ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට ලක් වූ ලක්ෂ සංඛ්‍යාත අහිංසක දෙමළ

ජනතාව මුදා ගැනීම මුල් කරගෙන දියත් වූ අවසන් සටනේදී බහුතර සිංහල ජනතාව සහ විශේෂයෙන් ම යුද හමුදාව පෙන්වූ උසස් මානුෂික ගුණය සංහිඳියාව නැවත ගොඩනැගීම සඳහා ඉතා නිර්මාණශීලී ව යොදාගත හැකි ව තිබුණි. එහෙත් යුද්ධය අවසන් වූ සැණින් බෙදුම්වාදීන්ට පක්ෂපාත සහ ඔවුන් පෝෂණය කළ ජාත්‍යන්තර බලවේග විසින් ''මානව හිමිකම්'' නාමයෙන් බෙදුම්වාදයට නැවත පණ දීම ආරම්භ කරන ලදී. ඒ තුළ සැබෑ සංහිඳියාව ජනතාවගෙන් වඩා දුරස් විය. සංහිඳියාව බෙදුම්වාදයට ආවරණය සපයන ලේබලයක් බවට පත් විය.

සැබෑ සංහිඳියාව සඳහා අත්පුඩි ගැසීමට නම් අත් දෙකක් අවශ්‍ය වේ. එක් අතකින් අත්පුඩි ගැසීමට නො හැකි ය. දෙමළ ජනතාවට පමණක් විශේෂයෙන් සලකා විසඳුම් ඉදිරිපත් කිරීමෙන් හෝ සිංහල ජනතාවට වෙනත් ආකාරයකට සලකමින් සංහිඳියාව ඇති කළ නො හැකිය. සංහිඳියාව මූලික වශයෙන් සිතෙහි හටගන්නා දෙයක් මිස, භෞතික ව බාහිරින් ලබාදිය හැක්කක් නො වේ. බහුතර සිංහල ජනතාව අතර සැක සංකාව සහ අසතුට ඇති වන ආකාරයට දෙමළ ජනතාව සතුටු කිරීමට උත්සහ කිරීමෙන් සංහිඳියාව ඇති කළ නොහැක. එහි අනෙක් පැත්ත ද ඒ ආකාරයට ම වලංගුවේ. එමෙන් ම දෙමළ බෙදුම්වාදී බලවේගවලට කප්පම් ලබාදීම මගින් බහුතරයක් දෙමළ ජනතාවට සහන ලැබෙනවා යැයි උපකල්පනය කිරීම ද බලවත් වරදකි. අප කවුරුත් ඒ පරම සත්‍යය තේරුම් ගත යුතු ය.

ඒ නිසා ජාතියක ජාතිකත්ව අතර සංහිඳියාව ඇති කිරීමට නම් සියලු ජන කොටස්වලට සමාන ව සැලකිය යුතු ය. සංහිඳියාව උපදින්නේ සමානාත්මතාවය තුළිනි. සංහිඳියාවේ නාමයෙන් යෝජනා වන පළාත් මට්ටමින් දේශපාලනඥයන්ට බලය බෙදා දීමේ විසඳුම් මගින් පොදු ජනතාව අතර සමානාත්මතාව තහවුරු වන්නේ නැත. ඒ සඳහා සියලු ජනතාවට බලය ලැබෙන සේ ඉතා

කුඩා ම ඒකකය වන පුද්ගලයා වෙත බලය බෙදිය යුතු ය. උතුරේ කුල හීන ජනතාව පීඩනයට පත් කරන වෙල්ලාලයන් කිහිප දෙනෙකු අතට බන්දේසියක තබා බලය බෙදා දීමෙන් ඒ ජනතාවට සෙතක් වී නැති බව දන් ඉතා හොඳින් ඔප්පු වී ඇත.

අපේ රටේ උතුර සහ නැගෙනහිර පළාත්වල දක්නට ලැබෙන කුල පීඩනය නැති කිරීම සඳහා 1957 අංක 21 දරන පනත මගින් විශේෂ නීතියක් ද සම්මත කරනු ලැබී ය. එසේ වුවත් එම පනත මගින් වැරදි ලෙස හඳුන්වන උතුරේ ජනතාවට එරෙහි ව කරනු ලබන අකටයුතුකම් නිවැරදි කොට සියලු ජනයාට සමාන ව සලකන සමාජයක් බිහි කිරීමට උතුරේ නායකයින් අසමත් වී ඇත. පසුගිය දිනවල දකුණින් උතුරට මහා සංසරත්නය සියක් නමක් වඩම්මවා යාපනය රෝහලේ අසාධ්‍ය රෝගීන්ට ලේ දන්දීමට සිදුවූයේ කුල මානය නිසා ලේ දන් නො දෙන පිරිස්වලට ආදර්ශයක් සැපයීම සඳහා ය. පළාත් සභා බලය ලබා ගැනීමෙන් පසුව උතුරේ දෙමළ බෙදුම්වාදී නායකයන් විසින් එම ප්‍රදේශවල ජනතාවට විශේෂයෙන් ලබා දුන්නේ මොනවා ද? එසේ නැතහොත් ඉහත සඳහන් කළ නීතිය මගින් නැති කිරීමට උත්සාහ කළ, ම්ලේච්ඡ කුල පීඩනය නිසා උතුරේ වෙසෙන බහුතරයක් දෙමළ ජනතාවට සිදුවන අසාධාරණය අවම කිරීමට ඔවුන් විශේෂයෙන් කළේ කුමක්ද? අන්තවාදී වෙල්ලාලයින් සුළු පිරිසක් අතට ස්වයං පාලන බලය ලබා දීමෙන් එම තත්වය වෙනස් නොවන බව කුල පීඩනයෙන් පීඩාවට පත්වන උතුරේ සාමාන්‍ය ජනතාව ඉතා හොඳින් දනිති.

අප රටේ මහජනයාගේ අවධානයට ලක් නො වූ 1957 දී සම්මත කළ ''සමාජ දුබලතාවන් වැළැක්වීමේ පනත'' ලෙස නම් කළ එම නීතිය පිළිබඳ ව උතුරේ වෙල්ලාලයන් ලැජ්ජා විය යුතුය. එම නීතිය මගින් වැළැක්වීමට උත්සාහ කළ පහත් ක්‍රියාවන් අතුරින් යම් දේවල් දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී පාලකයින් යටතේ හෝ සිදු වූ බවක් දැනගන්නට නැත. කුල හීනයන්ට පොදු ළිඳකින් වතුර

බීමට ඉඩ නො දීම, පොදු ගමනාගමනය භාවිත කිරීමට ඉඩ නොදීම වැනි වැරදි 12ක් එම පනත මගින් ආවරණය කෙරිණි. ඒ අනුව යටත් විජිත පාලනය අවසන් කිරීමෙන් පසු ව ගෙන එන ලද එම පනත මගින් එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා විසින් උතුරේ කුල හීන ජනතාවට දෙවන වරට නිදහස ලබාදුන් බව පැවසීම අතිශයෝක්තියක් නො වේ. අද වන විට එම පනතේ සඳහන් යම් වැරදි උතුරේ සිදු නො වන බවට වෙල්ලාලයන් වාද විවාද කරනු ඇත. එහෙත් සමස්තයක් ලෙස එම පනත අදටත් වලංගු වන බව ඔවුන්ට ප්‍රතික්ෂේප කළ නො හැකිය.

එම නීතිය මගින් වෙල්ලාලයින් බලවත් සේ ලැජ්ජාවට පත් කෙරුණ ද, ඒ පිළිබඳ ව ඔවුන් කිසිදු ඝෝෂාවක් නො කර සිටීමට පරිස්සම් විය. එහෙත් 1956 දී රාජ්‍ය භාෂා පනත මගින් එතෙක් රාජ්‍ය භාෂාව වූ ඉංග්‍රීසිය වෙනුවට ඉන්දියාවේ මෙන් බහුතර ජනතාව කතා කරන භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කළ විට ඔවුහු මහත් ඝෝෂාවක් කළහ. එයට හේතුව සාමාන්‍ය දෙමළ ජනතාවට ඒ මගින් අසාධාරණයක් වනු ඇතැයි ඔවුන් විසින් කල්පනා කිරීම නො වේ. ඒ මගින් ඉංග්‍රීසි උගත් වෙල්ලාලයින් විසින් අත්පත් කරගෙන සිටි සමාජ බලය බහුතර සිංහලයන් විසින් අත්පත් කරගනු ඇතැයි ඔවුන් බියට පත් විය.

1958 දී දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත මගින් දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට, රාජ්‍ය සේවයට ඇතුළුවීම සහ පාර්ලිමේන්තුවේදී දෙමළ භාෂාව භාවිත කිරීමට සම්පූර්ණ අයිතිය ලබා දුන්න ද වෙල්ලාලයන්ට ඒ පිළිබඳ ව සතුටක් ඇති නොවීය. එයට හේතුව, සාමාන්‍ය දෙමළ ජනතාවගේ ගැටළුව ඒ මගින් විසඳීමය. ඔවුනට අවශ්‍ය වූයේ බහුතර සිංහල ජනතාව මෙන්ම දෙමළ ජනතාවගෙන් බහුතරය සමාජ හිණිමගේ ඉහළ නැගීම වැළැක්වීම ය. එම පනත මගින් දෙමළ භාෂා ප්‍රශ්නය 1958 දීම ඉතා සාධාරණ ලෙස විසඳා තිබිය දී වෙල්ලාලයන් ව්‍යාජ ලෙස ''භාෂා

ප්‍රශ්නය'' දිගින් දිගට ම මතු කරනු ලැබී ය. ඉන් පසු 1978 ව්‍යවස්ථාවෙන් දෙමළ සහ සිංහල, ජාතික භාෂා ලෙස පිළිගැනුණි. ඉන් පසුව 1987 දී 13 වන සංශෝධනය මගින් දෙමළ සහ සිංහල යන භාෂා දෙක ම රාජ්‍ය භාෂා බවට පත් කෙරිණි. ඉන් පසුව වෙල්ලාලයන්ගේ බලපෑම මත භාෂා අසාධාරණය සිදු වූයේ සිංහලයාට ය. ඒ 1988 දී සම්මත කළ 16 වන සංශෝධනය හරහා ඒ වන විට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සිංහලෙන් හෝ දෙමළෙන් පරිපාලන ගනුදෙනු කිරීමට තිබූ අයිතිය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට පමණක් සීමා කිරීම මගිනි. සිංහල භාෂාවට ඒ ආකාරයට ''කුඩම්මාගේ සැලකිලි'' ලැබෙන්නේ පරිපාලන භාෂාව ලෙස දෙමළ භාෂාව කතා කරන ප්‍රදේශවලට පමණක් එම අයිතිය සීමා කිරීම මගිනි. එහෙත් අදත් වෙල්ලාලයන් ඝෝෂා කරන්නේ ඔවුනට බරපතළ ''භාෂා අසාධාරණයක්'' තිබෙන බවට ය. 1958 දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත මගින් ඔවුනට යුක්තිය ඉටු කිරීම පිළිබඳ ඔවුහු සෑම විට ම මුණිවත රකිති. ඒ ආකාරයට ම ඔවුහු 1957 දී වෙල්ලාලයන්ගේ අසාධාරණකම්වලින් බහුතර දෙමළ ජනතාව ගලවා ගැනීම සඳහා සම්මත කළ පනත පිළිබඳව ද කුහක මුනිවත රකිති.

යම් ජන කොටසක් තුළ අභ්‍යන්තරික ව සංහිඳියාව ඇති කිරීමට බාධා කෙරෙන බරපතළ සංස්කෘතික ගැටුමකට හේතුකාරක වන දේශපාලන නායකයින් පිරිසකට ජනකොටස් දෙකක් අතර සංහිඳියාව ඇති කිරීමට මුල්වි ය හැකි ද? ඇමෙරිකාවේ නිර්දේශය මත පිහිටුවා ඇති ඊනියා සංහිඳියා ලේකම් කාර්යාලයේ වාර්තාවෙන් නිර්දේශ ඉදිරිපත් කරන්නේ බහුතර සිංහල ජනතාවගේ හැසිරීමට අදාළ ව පමණි. ඊට අනුව ඊනියා සංහිඳියාවට බාධා කෙරෙන දෙමළ නායකයින්ගේ සංස්කෘතික පසුගාමිත්වය නැතිකර ගැනීමට අවශ්‍ය නොවේ. මේ බොරුව එළිදරව් කළ හැක්කේ සත්‍ය මතු කර ගැනීමෙන් සහ ඒ මත දේශපාලන උපායමාර්ග තේරීමෙන් පමණි. ඒ සඳහා පටු ජාතිවාදී, කුලවාදී නායකයන් අතලොස්සක් අතට බලය ලබාදීම මගින් ජනතාව අතට බලය ලැබෙන්නේ නැති බව තහවුරු

කෙරෙන මතවාදය අභියෝගාත්මකව ඉදිරිපත් කළ යුතුය. එනම් ''සංහිඳියාව ඇතිකළ හැක්කේ සමානාත්මතාව ය තුළින් පමණි'' යන මතය ඉහළට එසවිය යුතුය. බෙදුම්වාදීන්ට තර්කානුකූල ව අභියෝග කළ හැක්කේ ඒ මගින් පමණි.

ඒ සඳහා දකුණේ ජනතාව භුක්ති විඳින, එහෙත් උතුරේ හෝ නැගෙනහිර ජනතාවට අහිමි වී ඇති බව කියන අයිතිවාසිකම් හා වරප්‍රසාද සියල්ල ලැයිස්තු ගත කරන ලෙස අප උතුරේ දේශපාලන නායකයින්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. එසේ ම ලෝකයේ වෙනත් ඕනෑ ම රටක සුළු ජාතිකත්වයන්ට ලබාදී ඇති, එහෙත් ශ්‍රී ලංකාවේ එසේ ලබා දී නැති කුමන හෝ අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ඇත්නම් ඒවා ද එම ලයිස්තුවට එකතු කළ යුතුය. එසේ අහිමිකොට ඇතැයි කියන කිසිදු අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ඔවුනට ලබා දෙනවාට අකමැති එක සිංහලයෙක් හෝ බෞද්ධයෙක් සිටීනම් ඔහුගේ ප්‍රශ්නය විසඳීම බහුතර සිංහල ජනතාව විසින් බාර ගත යුතුය. ඉන් පසුව ඒ බහුතරය විසින්ම ඒ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ලැයිස්තුවේ අඩංගු සියල්ල ''සුළුතරයට''ලබාදිය යුතු බවට රජයට බල කළ යුතු ය. ඒ අභියෝගය රජයට හෝ දෙමළ බෙදුම්වාදී දේශපාලන නායකයන්ට පමණක් නොව, සංහිඳියාවේ නාමයෙන් ඩොලර් ඉපයීම සඳහා ජාතිවාදයට සහ බෙදුම්වාදීන්ට උඩගෙඩි දෙන පිරිස්වලට ද එල්ල විය යුතු ය. සැබෑ සංහිඳියාව දිරිගැන්විය හැක්කේ ඒ මගින් පමණි.

නමුත් බෙදුම්වාදී කප්පම්කරුවන් ඉල්ලන්නේ සැබෑ සංහිඳියාව හෝ ජනතාවගේ සැබෑ අයිතිවාසිකම් නො වේ. ඔවුන් ඉල්ලා සිටින ව්‍යවස්ථාමය විසඳුම කුමක් ද? මහින්ද රාජපක්ෂ පාලනය පෙරළා දැමීමෙන් පමණක් ලබා ගත හැකි යැයි ඔවුන් විශ්වාස කළ එම විසඳුම කුමක් ද? ඔවුන්ගේ සැබෑ අරමුණ අනාගතයේදී ඒකපාර්ශ්වීයව වෙනම රාජ්‍යයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය තරමට දේශපාලන බලය බෙදා හරින ''ව්‍යවස්ථාමය විසඳුමක්''

ලබා ගැනීම නො වේ ද? ඒ අරමුණ ඉටුකර ගැනීම සඳහා ඔවුනට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වන්නේ නැත. එසේ ම 'ඒකීය' වචනය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නැත. ව්‍යවස්ථාවේ බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමට අවශ්‍ය වන්නේ ද නැත.

ඒකීය වචනය ව්‍යවස්ථාවේ එසේ ම තිබියදී 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම මගින් රටේ ඒකීයභාවය නැති කළ හැකිය. එනම්, ෆෙඩරල් ලේබලය නොමැති ව ෆෙඩරල් රාජ්‍යක් බිහි කළ හැකිය. ඒ බව මෑතකදී ලබා දුන් නඩු තීන්දුවකින් ද තහවුරුකොට ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට එරෙහි ව පවතින බාධක ඉවත්කර ගැනීම සහ හැකිනම් ව්‍යවස්ථා අධිකරණය සහ දෙවන මන්ත්‍රණ සභාව මගින් එය තවදුරටත් ශක්තිමත් කරගැනීම පමණි. ඒ නිසා 13 වැනි සංශෝධනයෙන් ලබාදුන් බලතලවලින් දශමයක්වත් එහාට යන බලතල ඉල්ලා සිටීමට ඔවුන්ට උවමනාවක් නැත. උවමනා පමණට වඩා දේ ලබා ගැනීමට උත්සාහ කිරීම අනතුරුදායක බව බෙදුම්වාදීහු ඉතා හොඳින් දනිති. පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයවත් නැති රනිල් වික්‍රමසිංහ මහතාගෙන් උවමනාවට වැඩි දේ ඉල්ලා සිටියහොත් තුනෙන් දෙක අහිමි වී සියල්ල අහිමි වන බව ඔවුහු ඉතා හොඳින් දනිති. නමුත් විද්වත්හු යැයි කියාගන්නා පිරිස් ඒ බව නො දනිති. සතුරාගේ සැලසුම් හඳුනා ගන්නට නොහැකිව ඊට පහසුකම් සලසන ක්‍රියාමාර්ගවල අප නියැලී සිටින්නේ ඒ නිසා නො වේ ද? අප රටේ යම් නායක මට්ටමේ යම් භික්ෂූන් වහන්සේලා විසින් ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ අඩංගු වීමට නියමිත භයානක බෙදුම්වාදී ප්‍රතිපාදන පිළිබඳ ව වචනයක්වත් කතා නො කර බුද්ධාගමට හිමි තැන අහිමි කරනවායැයි බොරුවට ඝෝෂා කරන්නේ ඒ අනවබෝධය නිසා නො වේ ද?

13 වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කරන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීමෙන් පසුව සැබෑ ලෙසම ජාතික සංහිඳියාව ඇති කරන නව ව්‍යවස්ථාවක් සම්මත කළ යුතුය. ඒ නව ව්‍යවස්ථාවේ 13ක් නැත. ඒ නිසා භූගෝලීයව රාජ්‍යයේ විධායක බලය ප්‍රාදේශීය

සහා මට්ටම දක්වා උපරිමයෙන් විමධ්‍යගත කිරීමට බාධාවක් නැත. එසේම ඒ නව ව්‍යවස්ථාව තුළ ජාතිකත්වය, භාෂාව හෝ ආගම මත කිසිදු පුරවැසියකුට අසාධාරණයක් සිදු නොවන බව සහතික කිරීම සඳහා උපරිම ප්‍රතිපාදන ඇතුළු කිරීමේ කිසිදු බාධාවක් නැත. බෙදුම්වාදී, ජාතිවාදී, කුලවාදී දුෂ්ඨ බලවේග සදහටම පරාජය කළ හැක්කේ එවැනි ව්‍යවස්ථාවක් මගිනි. ඒ නිසා ඉදිරි ජනාධිපතිවරණයේදී ජාතික න්‍යාය පත්‍රය ජයග්‍රහණය කරවීම සඳහා මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන පොදු අපේක්ෂකයාට රට අවුලෙන් ගොඩගන්නා නව ව්‍යවස්ථාව අතින් ගෙන තරගයට ඉදිරිපත් වීමට සිදු වනු ඇත. එවිට එම ජනාධිපතිවරණය, නව ව්‍යවස්ථාව අනුමත කරන ජනමත විචාරණයක් බවට පත් වනු ඇත.




07

# 13 නැතිව ජාතික ගැටළුව විසඳන්නේ කෙසේද?

බලය බෙදීමට විරුද්ධ වන පිරිස් තමන්ගේ විකල්ප යෝජනා ඉදිරිපත් කළ යුතු බවට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කරන ලද ප්‍රසිද්ධ අභියෝගය මහජන රාජ්‍ය සභාව වෙනුවෙන් මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි විසින් බාරගනු ලැබීය. ඒ අනුව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පෞද්ගලිකව මුණගැසුණු උන්වහන්සේ එතුමා විසින් අභියෝගාත්මකව ඉල්ලා සිටි විකල්ප විසඳුම් ලිඛිතව බාර දුන්හ.

එම ලේඛනය මගින් උන්වහන්සේ සඳහන් කරන්නේ බලය බෙදීම වර්තමාන ජනාධිපතිතුමා විසින් අභිනවයෙන් කරන්නට උත්සාහ කරන දෙයක් නොවන බවය. උන්වහන්සේ සඳහන් කරන්නේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා දැනටමත් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව මගින් ඉන්දියාවේ ව්‍යවස්ථාවටත් වඩා ඔබ්බට ගොස්

බලය බෙදා අති බවය. එසේනම් දැන් ජනාධිපතිතුමා  අභිමුව ඇත්තේ බලය බෙදීමේ ප්‍රශ්නයකට වඩා බෙදා දී තිබෙන බලය යොදාගෙන මහජන අපේක්ෂා ඉටු කිරීමේ නොහැකියාව නොවේද? උන්වහන්සේ මතුකරන මූලික ප්‍රශ්නය එයයි. ඒ අනුව උන්වහන්සේ විසින් දසවැදෑරුම් විකල්ප විසඳුම් මාලාවක් සහ ඊට අදාළ පසුබිම පැහැදිලි කෙරෙන කරුණු 6 ක් ජනාධිපතිතුමා වෙත ඉදිරිපත්කොට ඇත. නව ව්‍යවස්ථාවක් මගින් ජාතික ගැටළුව විසදීම සඳහා මෙම මෙම යෝජනාවලිය විසින් ඉතා ප්‍රබල පදනමක් සකසා ඇත. ඕනෑම පොදු අපේක්ෂකයෙකුට ඉදිරි ජනාධිපතිවරණයට තරඟ කළ හැක්කේ ඔහු හෝ ඇය ව්‍යවස්ථාවක් අතින් ගෙන ජනතාව ඉදිරියට පැමිණියහොත් පමණි.

## පසුබිම හෙවත් පවතින තත්වය:

**1.** බලය බෙදීමේ මූලික සංකල්ප අනුව ඒ සඳහා ක්‍රමවේද දෙකක් ඇත. ඉන් පළමු වැන්න, මධ්‍යම රජය සතු විධායක බලය රජයේ නිලධාරීන්ට මෙන්ම පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ බල ඒකකවලට පැවරීමයි. දෙවැන්න, නීති හැදීමේ බලය හෙවත් ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුවට සමාන්තරව පිහිටුවනු ලබන දෙවන මන්ත්‍රී මණ්ඩලයකට හෝ පළාත් සභා මට්ටමට මෙන්ම ප්‍රාදේශීය සභා මට්ටමට බෙදා හැරීමය. කෙසේ වෙතත් ව්‍යවස්ථාදායක බලය දෙවන මන්ත්‍රී මණ්ඩලය සහ පළාත් සභා යන ආයතන දෙකටම එක විට බෙදා හැරීම මගින් පාර්ලිමේන්තුව දුර්වලවේ. බෙදුම්වාදී ප්‍රවණතාවයන් තිබෙන රටක ඒ ආකාරයට පාර්ලිමේන්තුව දුර්වල කිරීම සුදුසු නොවේ. විශේෂයෙන්ම විධායක බලය වැඩි වශයෙන් පාර්ලිමේන්තුවට පවරා ඇති තත්වයක එය වඩාත් බරපතළ වේ.

**2.** ජාතිවාදී ගැටුම්, බෙදුම්වාදී මතවාද සහ ඒ සඳහා යුද වැදුණු ඉතිහාසයක් නොමැති රටක විධායක බලය මෙන්ම ව්‍යවස්ථාදායක බලය ද යම් මට්ටමකට බෙදාහැරීම ගැටළුවක්

නොවිය හැක. එසේ වුවත් ව්‍යවස්ථාදායක බලය උපරිමයෙන් බෙදාහැරීම මගින් බෙදුම්වාදී මතවාද තහවුරු වේ. නමුත් ව්‍යවස්ථාදායක බලය නොමැතිව විධායක බලය බෙදාහැරීම ඒ තරමට බරපතළ නොවේ. ඒ මගින් බොහෝ විට සිදුවන්නේ මධ්‍යම රජයේ විධායක බලය විමධ්‍යගත කිරීමය.

**3.** කෙසේ වෙතත් දේශපාලන පක්ෂවලට හෝ බලවත් නායකයින් අතට විධායක හෝ ව්‍යවස්ථාදායක බලය බොදාහැරීම මගින් මහජනයා අතට දේශපාලන බලය හෝ අයිතිවාසිකම් ලැබෙන බවට සහතික කළ නොහැක. නායකයින්ට බලය දීම සහ ජනතාවට සිවිල් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබාදීම අතර බරපතළ වෙනසක් ඇත. එනම්, බලය බෙදීමේ කුඩාම ඒකකය වන පුද්ගලයාට බලය බෙදාදීම සහ යම් භූගෝලීය කලාපයක බල ඒකකයකට බලය බෙදා දීම අතර බරපතළ වෙනසක් ඇත.

**4.** පාර්ලිමේන්තුවේ බලයට යටත්ව ප්‍රාදේශීය සභා මට්ටමට ව්‍යවස්ථාදායක බලය උපරිමයෙන් බෙදාහැරීම මගින් බෙදුම්වාදී අනතුරක් මතු නොවේ. බොහෝ විට ඒ මගින් බෙදුම්වාදී ආකල්ප සමනය වීමක් ද සිදුවිය හැක. එහෙත් පළාත් මට්ටමට ව්‍යවස්ථාදායක බලය, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට යටත් නොවන ආකාරයට, උපරිමයෙන් ලබාදීම අනතුරුදායක වේ. එසේ වුවත් පළාත් සභා වලට එවැනි සුවිශේෂී ව්‍යවස්ථාදායක බලයක් නොමැති තත්වයක් යටතේ මධ්‍යම රජය සතු විධායක බලය යම් මට්ටමකට ලබාදීම ගැටළුවක් නොවනු ඇත. උදාහරණයක් ලෙස පාර්ලිමේන්තු පනතක බලයට යටත්ව පමණක් පළාත් සභාවලට විධායක බලය ලබාදෙන්නේ නම් පළාත් සභා ඇමැතිවරයකුට මධ්‍යම රජයේ උප ඇමති වරයෙක්ගේ බලය වුවද ලබාදිය හැක.

**5.** බලය බෙදීම හැර වෙනත් විසඳුමක් තිබේද යනුවෙන් ජනාධිපතිතුමා විසින් ප්‍රශ්න කිරීමේදී වැරදි අදහසක් මතුවේ. එනම් මේ වන තුරු ශ්‍රී ලංකාවේ බලය බෙදීමක් සිදුකොට නොමැති

බවය. නමුත් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ඉන්දියාවටත් වඩා බරපතළ ෆෙඩරල් බලතල සහිත ව්‍යවස්ථාවක් බවට පත් වී ඇත. එම බලතල උපරිමයෙන් ක්‍රියාත්මක නොවන්නේ ඊට එරෙහිව පවතින ව්‍යවස්ථාමය බාධක නිසාය. එම බාධක බොහොමයක් විධායක ජනපති බලය තුළ පරිපාලන වශයෙන් පැනවෙන අතර සෙසු බාධක ඍජු ව්‍යවස්ථාමය බාධක වේ. බෙදුම්වාදී බලවේග දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලා සිටින්නේ 13 වැනි සංශෝධනයට එරෙහිව පවතින එම බාධක ඉවත් කරන ලෙසය. ඒ සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වේ. එවැනි බාධක 8ක් හඳුනාගත හැකි අතර වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය තුළ ඒවා ඉවත් කිරීම සඳහා උත්සාහ කෙරෙන බව පැහැදිලිව දක ගත හැක.

**6.** හිටපු වැඩබලන අගවිනිසුරු රාජා වනසුන්දර මහතාට අනුව 13 වැනි සංශෝධනය යනු ''කාල බෝම්බයකි'' එයට කොටසක් එකතු කිරීමට හෝ එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළහොත් සමාජයේ බරපතළ පිපිරීමක් සිදුවිය හැක. එසේම සුළු ජන අපේක්ෂා පිළිබඳ සැලකිලිමත් නොවී ඔවුන්ට තිබෙනවා යැයි කියන ගැටළුවලට මානසික සහ භෞතික විසඳුම් ලබා නොදී 13 අහෝසි කිරීමට හෝ ඉන් කොටස් ගැලවීමට උත්සාහ කිරීම ද පිපිරීමකට හේතු විය හැක.

## දස වැදෑරුම් විසඳුම

**1)** 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීම හෝ එහි කොටස් අඩු කිරීම හෝ ඊට එකතු කිරීම හෝ එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම යන ආකාර 4න් එකක් හෝ නොකර සිටීම. එනම් ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවගේ විශ්වාසය දිනා ගන්නාතෙක් කාලබෝම්බයට අත නොතැබීම.

**2)** සුළු ජන කොටස්වල සහ සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් සහ සුබසාධනයට අදාළ විසඳුම් පිළිබඳ සමාජ කථිකාව දිරිගැන්වීම සඳහා පාර්ලිමේන්තුව තුළ සහ ඉන් පිටත යාන්ත්‍රණ පිහිටුවීම සහ එම කාලය තුළ පළාත්සභාවල ක්‍රියාකාරීත්වයට එරෙහිව පවතින මූල්‍යමය සහ නිලධාරීවාදී බාධකවලට විවෘත විසඳුම් ලබාදීම (එම යාන්ත්‍රණ පිළිවෙළින් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් සහ ජනාධිපති කොමිසමක් ලෙස සැලකිය හැක.) එම කොමිසම මගින් බහුතර සිංහල ජනතාව බුක්ති විඳින එහෙත් සුළු ජන කොටස්වලට මේ වනතුරු ලැබී නැතැයි කියන අයිතිවාසිකම් සහ වරප්‍රසාද පිළිබඳ ගැඹුරින් සොයා බලා නිර්දේශ ඉදිරිපත් කළ හැක.

**3)** සුළු ජන අයිතිවාසිකම් පනතක් මගින් ඉහත කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ තේසවලාමේ නීතිය නිසා උතුරේ කුලහීන ජනතාවට සිදුවන අසාධාරණකම් වැළැක්වීම සඳහා පියවර ගැනීම. ජාතිකත්වය, ආගම හෝ භාෂාව මත යම් පුද්ගලයකුට අගතියක් සිදුවන්නේනම් ඒ පිළිබඳව පැමිණිලි කිරීම සඳහා ''ස්ථිර යුක්තියක් ඉටු කිරීමේ කොමිසමක් '' එම නීතිය යටතේ පිහිටුවිය යුතුය.

**4)** 1957 අංක 21 දරන සමාජ දුබලතාවයන් වැළැක්වීමේ පනත අදට ගැලපෙන ලෙස සංශෝධනය කොට බලාත්මක කිරීම මගින් උතුරේ බහුතර කුලහීන ජනතාවට සහන සැලසීම.

**5)** ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කොට ජන සභා පිහිටුවීම මෙන්ම ප්‍රාදේශීය සභා මට්ටමට උපරිමයෙන් විධායක සහ ව්‍යවස්ථාදායක බලය ලබාදීම. ඒ මගින් මහජනයා රාජ්‍ය පාලනයට සම්බන්ධ කර ගැනීම සඳහා විශේෂ ප්‍රතිපාදන සැලසිය යුතුයි.

**6)** ජනාධිපතිවරයා යටතේ උතුරු සංවර්ධන අරමුදලක් පිහිටුවා එම ප්‍රදේශවල හදිසි සහ මානුෂීය ජනතා අවශ්‍යතා සැපිරිම සඳහා විශේෂ මැදිහත්වීමක් සිදු කිරීම.

**7)** උතුරු පළාත් සභාව සහ මධ්‍යම රජය ඒකාබද්ධව නිශ්චිත කාලයක් සඳහා ජනතාව මුල්කරගත් සංවර්ධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු සංවර්ධන අධිකාරියක් පිහිටුවීම.

**8)** ඉහත සඳහන් කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් මගින් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සමානව සැලකීම මුල්කරගත් නව ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා සංකල්පීය රාමුවක් සකස් කොට මහජන සංවාදයට ලක් කිරීම.

**9)** පළාත් මට්ටමින් ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්, උප සභාපතිවරුන් මුල්කරගත් සමාජ සංවර්ධන කමිටුවක් කැඳවීම. එහිදී උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලට ප්‍රමුඛතාවයලබාදිය යුතු අතර ඔවුන් ප්‍රධාන දේශපාලන ප්‍රවාහයකට ඇතුළත්කර ගැනීම සඳහා අධ්‍යාපනය සහ පුහුණුව ලබා දිය යුතුය.

**10)** ජනකොටස් අතර සැබෑ සංහිඳියාව ඇති කිරීම සඳහා සහ බෙදුම්වාදී මතවාද පැරදවීම සඳහා සමාජ, සංස්කෘතික හා දේශපාලන සංවාදයක් පාසල්, විශ්ව විද්‍යාල සහ රාජ්‍ය ආයතන මට්ටමින් ඇති කිරීම සඳහා ''සමානාත්මතා ව්‍යාපාරයක්'' ආරම්භ කිරීම.




## 08

# බෙදුම්වාදයට ගොදුරු නොවී නව ව්‍යවස්ථාවක් මඟින් ජාතික ගැටළුව විසඳීම

**නව ව්‍යවස්ථාවක් මඟින් භූගෝලිය ප්‍රදේශවලට පරිපාලන බලතල බෙදීම සහ සුළු ජාතික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා වන තාක්ෂණික ප්‍රවේශය සහ සංකල්පීය රාමුව**

## බලතල බෙදීමේ ප්‍රභේද-

මූලික වශයෙන් බලය බෙදීම නැමැති සංකල්පයට ප්‍රභේද දෙකක් අයත් වේ. පළමුවැන්න බලය බෙදීමේ කුඩාම ඒකකය වන පුද්ගලයා අතට උපරිමයෙන් පරමාධිපත්‍යයේ බලය ලබා දීමයි. ඒ සඳහා උපාංග දෙකක් යොදා ගත හැක. පළමුවැන්න මූලික අයිතිවාසිකම් තවදුරටත් පුළුල් කොට ඊට සිවිල් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ඇතුළත් කිරීමයි. ඊට සුළු ජන කොටස්වල අයිතිවාසිකම් සහ අඩු ආදායම්ලාභීන්ගේ අයිතිවාසිකම් විශේෂිතව ඇතුළත් විය

යුතුය. මෙම අයිතිවාසිකම් ව්‍යවස්ථාව මගින් සහතික කළ යුතු අතර ප්‍රායෝගිකව එම අයිතිවාසිකම් මහජනයා විසින් භුක්ති විඳින බව සහතික කිරීම සඳහා විශේෂ නීතියක් හඳුන්වා දිය යුතුය. අසාධාරණයට ලක් වන ජනතාවට එම අයිතිවාසිකම් පනත් මගින් පහළ උසාවිවල දී හෝ විශේෂ කොමිසමක් මගින් සාධාරණය ඉටු කිරීමට ප්‍රතිපාදන සැලසිය යුතුය.

දෙවැනි උපාංගය වන්නේ සර්වජන ඡන්ද බලය වඩාත් අර්ථ සහගතව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාව මගින් සහ අදාළ පනත් මගින් ප්‍රතිපාදන සැලසීම ය. එහිදී සැලකිල්ලට ගතයුතු කරුණු රාශියක් ඇත. පළමුවැන්න ඡන්ද ලබාගැනීම සඳහා දේශපාලනඥයන් විසින් මහජනයාට ලබා දෙන පොරොන්දු ලිඛිතව ප්‍රකාශයට පත් පත් කිරීම සඳහා නීති පැනවීම සහ ඒවා අපේක්ෂකයා සහ ඡන්දදායකයා අතර ඇති කරගන්නා ගිවිසුමක් බවට නීතිමය පිළිගැනීමක් ලබා දීමය. දෙවැන්න විධායක බලය පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ හැකි ආකාරයට එම බලය අගමැතිවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට පැවරීමය.

තුන්වැන්න, පාර්ලිමේන්තු මැතිවරණ දෙකක් අතර කාලයේ දී පැවැත්වෙන පළාත් පාලන හෝ වෙනත් අතුරු මැතිවරණවලදී ආණ්ඩුවේ ගමන පිළිබඳ මහජන මතය ප්‍රකාශ කිරීම සඳහා විශේෂ කොටසක් ඡන්ද පත්‍රිකාවට ඇතුළත් කිරීමය. හතරවැන්න, මහජනයා ලබා දුන් බලය ආපසු ගැනීමේ අයිතිය අඩු තරමෙන් පළාත් පාලන මට්ටමේ දී ජනසභා හරහා ලබා දීමය. පස්වැන්න, අපේක්ෂකයින් තේරීමේ දී පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා අපේක්ෂකයින් ශාඛා සමිති, ආසන හෝ දිස්ත්‍රික් සමිති වලින් අනුමත කළ බවට සහතිකයක් ලබාදීම අනිවාර්ය කිරීමයි. හයවැන්න, මැතිවරණයේදී වියදම් කරන මුදල් පිළිබඳ සීමාවක් පැනවීම ය. මෙම ලැයිස්තුව තව බොහෝ දිගු කිරීමට කිසිදු බාධාවක් නැත.

බලය බෙදීමේ දෙවැනි ප්‍රභේදය වන්නේ භූගෝලීයව බලය බෙදීමය. එහි මූලික අරමුණ යම් ප්‍රාදේශීය ජනතාවකට විශේෂ හෝ

අනන්‍ය වූ බලයක් ලබා දීම නොවේ. එහි අරමුණ එම ප්‍රදේශයේ ජනතාවගේ එදිනෙදා සමාජ, ආර්ථික හා සංස්කෘතික ජීවිතයට අදාළ ව තීන්දු ගැනීමේ බලය ලබාදීම සහ රාජ්‍ය සේවය මහජන අපේක්ෂාවන්ට අනුව සහ ඔවුන්ගේ අධීක්ෂණයට යටත්ව කාර්යක්ෂමව ලබා දීමය. එම බලය ව්‍යවස්ථාදායක බලය සහ විධායක බලය වශයෙන් උප ප්‍රභේද දෙකකට බෙදා දැක්විය හැක. මීට අමතරව ඒ බලතල බෙදීමේ භූගෝලීය ඒකකය බෙදීමේදී පාරිසරික සහ භූගෝලීය සාධක මෙන්ම ජනගහනය පැතිරීම ආදී සාධක වලට මුල්තැන දිය යුතු අතර ජාතිකත්ව පැතිරීම් මත බල ඒකක නිර්දේශ කිරීම මගින් ගැටුම් සහ බෙදුම්වාදී ප්‍රවණතා වර්ධනය වේ.

## ව්‍යවස්ථාදායක බලය බෙදීම: (පළාත් පාලන ආයතන හෙවත් ප්‍රාදේශීය ආණ්ඩු මට්ටමට පමණි)

ව්‍යවස්ථාදායක බලය බෙදීමේ දී හෝ විමධ්‍යගත කිරීමේදී එය පළාත්පාලන ආයතන මට්ටමට පමණක් සිදු කළ යුතුය. එම ආයතන වල නීති හැදීමේ බලය අදාළ පනත මගින් පාර්ලිමේන්තුවේ පාලනයට යටත් කෙරේ. එම පනත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතර කැමැත්ත පමණක් අවශ්‍ය වේ. ඒවා ප්‍රාදේශීය ආණ්ඩු ලෙස හැඳින්විය හැක. එහිදී පහත සඳහන් විශේෂිත කරුණු සැලකිල්ලට ගත හැක. පළාත් පාලන ආයතන සතු විධායක බලය සහ ඊට අදාළ විෂය ලැයිස්තුව පනත මගින් නිශ්චිතව දැක්විය යුතුය.

***1. ප්‍රාදේශීය ආණ්ඩුවේ බල ප්‍රදේශය සහ මධ්‍යම රජයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය එකම ප්‍රදේශයක් ලෙස සමපාත විය යුතුය.***

***11. එම ප්‍රදේශය තුළ තෝරාගත් විධායක බලතල ප්‍රමාණයකට අදාළව ප්‍රාදේශීය ලේකම්වරයාට නියෝග දීමේ බලය ප්‍රාදේශීය ආණ්ඩු වලට ලබාදිය යුතුය.***

***111. පළාත් පාලන බල ප්‍රදේශ තුළ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සඳහා ජන සභා පිහිටුවීමේ බලය ප්‍රාදේශීය ආණ්ඩුවලට ලබා දිය යුතු අතර එම සභාවලට ද විශේෂිත බලතල ප්‍රමාණයක් ලබා දිය යුතුය.***

***1v. ප්‍රාථමික අධ්‍යාපනය, මහජන සෞඛ්‍ය, පරිසර සංවර්ධනය කුඩා වාරිමාර්ග, ඉඩම් පර්යේෂණ සහ සමාජ - සංස්කෘතික සංවර්ධන ආදී විෂයයන්ට අදාළව අතුරු නීති සම්මත කිරීමේ බලය ප්‍රාදේශීය ආණ්ඩුවලට ලබාදිය යුතුය. ඉඩම් පරිහරණ බලතල මධ්‍යම රජයේ පුරාවිද්‍යා, වනජීවී, වන සංරක්ෂණ සහ ඉඩම් අත්සතු කිරීමේ නීතිවලට යටත්ව පැවැතිය යුතුය.***

***v. ඉංජිනේරුමය කටයුතු සහ වෙළඳපළ ප්‍රවර්ධනය ආදිය සඳහා ව්‍යාපාරික හස්තයන් පිහිටුවීමේ බලය ද ප්‍රාදේශීය ආණ්ඩුවලට ලබාදිය යුතුය.***

## විධායක බලය බෙදීම: (පළාත් ආණ්ඩු මට්ටමිට)

පළාත් මට්ටමට ව්‍යවස්ථාදායක බලය හෙවත් නීති හැදීමේ බලය ලබා නොදෙන අතර එම මට්ටමට ලබාදිය යුත්තේ වඩාත් පුළුල් මට්ටමින් විධායක බලය පමණි. එම විධායක බලය ප්‍රාදේශීය ආණ්ඩුවලට අවශ්‍ය ප්‍රමාණයට පවරා දිය හැක 'පළාත් ආණ්ඩුවක' අමාත්‍යවරුන් සංඛ්‍යාව නිශ්චිතව සීමා කළ හැකි අතර එම සංඛ්‍යාව සෑම පළාත් ආණ්ඩුවකටම සමාන විය යුතුය. පළාත් ආණ්ඩුවක අමාත්‍යවරයකුට මධ්‍යම ආණ්ඩුවේ උප ඇමතිවරයකුගේ බලය ලබාදිය හැකි අතර ප්‍රදේශ පාලනයට අදාළ විෂය ක්ෂේත්‍ර පමණක් පළාත් අමාත්‍යවරුන්ට පැවරේ.

## පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩු පත් කිරීම

*1. පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩු පිහිටුවීම සඳහා එක් පළාත් පාලන මැතිවරණයක් පමණක් පැවැත්විය යුතු අතර ඒ මගින් තෝරා ගැනෙන්නේ ප්‍රාදේශීය ආණ්ඩු කොට්ඨාස නියෝජිතයින් පමණි. කොට්ඨාසයක ඡන්දදායකයාට පක්ෂයට සහ අපේක්ෂකයාට වෙන වෙනම ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාවව ලබාදිය යුතු ය.*

*11. ප්‍රාදේශීය ආණ්ඩුවල සභාපතිවරුන්ගේ සහ නගරාධිපතිවරුන්ගේ පළාත් මහා සම්මේලනය පළාත් ආණ්ඩුව බවට පත්වේ. ඔවුන් අතුරින් එක් අයෙක් පළාත් ආණ්ඩුවේ ප්‍රධාන අමාත්‍යවරයා හෝ සභාපතිවරයා ලෙස පත් විය හැක. ප්‍රධාන අමාත්‍යවරයාට ද අමාත්‍ය ධුර දැරිය හැක. අමාත්‍යවරුන් ලෙස තේරී පත්වන සභාපතිවරුන්, නගරාධිපතිවරුන් අයත් වන ප්‍රාදේශීය ආණ්ඩුවල උප සභාපති සහ උප නගරාධිපතිවරුන් එම ආණ්ඩුවල ප්‍රධානීන් බවට පත්වේ.*

*111. පළාත් අමාත්‍යවරයකුට තමා අයත් වන ප්‍රාදේශීය ආණ්ඩුවේ රැස්වීම් වලට සහභාගි විය හැකි වුවත් එහිදී ඡන්දය භාවිත කිරීමෙ බලයක් නොලැබේ.*

*1v. පළාත් ආණ්ඩුවලට අයත් විධායක බලතල සහ ප්‍රාදේශීය ආණ්ඩුවලට පවරා දිය හැකි විධායක බලතල මෙන්ම ප්‍රාදේශීය ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක බලතල සියල්ල ව්‍යවස්ථාව මගින් විශේෂිතව සහතික කිරීම අවශ්‍ය නොවේ. මහජන අවශ්‍යතාවය අනුව අඩු හෝ වැඩි විය හැකි එම බලතල පනතක් මගින් ප්‍රකාශයට පත් කළ හැක.*

## මහජන පරමාධිපත්‍යය බලය නැවත පරීක්ෂා කිරීම

*1. ප්‍රාදේශීය ආණ්ඩුවක් විසින් පළාත් ආණ්ඩුවට පත් කරනු ලබන නියෝජිතයා ආපසු කැඳවීමේ බලය ප්‍රාදේශීය ආණ්ඩුව සතු වෙයි. ඒ සඳහා සාමාන්‍ය බහුතර බලය පමණක් අවශ්‍ය*

*වේ. නමුත් එහිදී අදාළ සභිකයාගේ මහජන නියෝජිකත්වය අහෝසි නොවේ.*

*11. ප්‍රාදේශීය ආණ්ඩු සභාපතිවරයා හෝ නගරාධිපතිවරයා පත් පත් කිරීමේ බලය වැඩිම නියෝජිතයින් පත් වූ කණ්ඩායමට හිමි විය යුතු අතර පක්ෂ නායකයින්ට, ස්වාධීන කණ්ඩායම් නායකයින්ට ඊට අයුතු ලෙස බලපෑම් කිරීමට නීතිමය බලයක් නොමැති විය යුතුය.*

*111. ප්‍රාදේශීය ආණ්ඩු නියෝජිතයන්ගේ නියෝජිකත්වය අහෝසි කළ හැක්කේ ජන සභාවල විශේෂ බහුතර කැමැත්තෙන් පමණි. එනම් කොට්ඨාසයක ජන සභාවක ඡන්දදායකයින් ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් අත්සන් කළ පෙත්සමක් අනුව පැවැත්වෙන ඡන්දයකදී තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් එම කොට්ඨාසයේ මහජන නියෝජිතයාට ලබාදී තිබූ කැමැත්ත ආපසු ලබාගත හැක.*

## සුළු ජන කොටස්වල අයිතිය විශේෂිතව සහතික කිරීම -

*1. ශ්‍රී ලංකාවේ භූමිය තුළ කිසිදු රටවැසියකුට ජාතිකත්වය, ආගම, කතා කරන භාෂාව, ජීවත්වන ප්‍රදේශ හෝ කුලය මත පදනම්ව වෙනස් ව සැලකීම රජය විසින් හෝ රටවැසියකු විසින් සිදුනොකළ යුතු බවට ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන පැනවිය යුතුය.*

*11. සුළු ජන අයිතිය තහවුරු කිරීම සඳහා විශේෂ පනතක් හඳුන්වා දිය යුතු අතර එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මධ්‍යම ආණ්ඩුව පළාත් ආණ්ඩු සහ ප්‍රාදේශීය ආණ්ඩු විශේෂිතව බැඳී සිටි. සුළු ජනයා නිර්වචනය කිරීමේදී ද එම පාලන*

*මට්ටම් ත්‍රිත්වය වෙන් වෙන්ව සැලකිය යුතුය. උදාහරණයක් ලෙස මධ්‍යම රජය මට්ටමේ දී සුළු ජන කොටසකට අයත් වන පුද්ගලයෙක් පළාත් හෝ ප්‍රාදේශීය ආණ්ඩු මට්ටමේ දී බහුතර ජන කොටසක් බවට පත් විය හැක.*

*111. සුළු ජන අයිතිය සහතික කිරීමේ පනත මගින් සමානාත්මතා කොමිසමක් පිහිටුවිය යුතු අතර ඊට ලැබෙන පැමිණිලි විභාග කොට ගැටලු විසඳීමට සහ ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට මෙන්ම යම් මට්ටමක දඬුවම් පැමිණවීමට හෝ ප්‍රබල වරදකදී අධිකරණයට යොමු කිරීමේ බලය තිබේ.*

*iv. සිංහල, දෙමළ, මුස්ලිම් අනන්‍යතාව පුද්ගලික කරුණක් වන අතර එය උප්පැන්න සහතිකයට පමණක් සීමා විය යුතුය. ජාතික හැඳුනුම්පත ඇතුළු අනෙකුත් ලේඛන වල ජාතිය ලෙස සඳහන් විය යුත්තේ. ශ්‍රී ලාංකික යන්න පමණි.*

*v. ඉඩම් බෙදා දීමේදී දිස්ත්‍රික් ජන අනුපාතය අනුව 50%ක් සහ ජාතික අනුපාතය අනුව 50% ක් වශයෙන් ඉඩම් ලාභීන් තෝරාගත යුතුය.*

*vi. රැකියා ලබා දීමේදී යම් භාෂාවක් කතා කිරීමේ හැකියාව විශේෂ කරුණක් නොවිය යුතුය. රාජ්‍ය සේවයට බඳවා ගැනීමෙන් පසුව භාෂා දැනුම සේවයේ අවශ්‍යතාවය මත රජය විසින් ලබා දිය යුතුය.*


*v. ඕනෑම ආගමක් ඇදහීමේ අයිතිය ව්‍යවස්ථාව මඟින් තහවුරු කළ යුතු අතර මුදල් හෝ වෙනත් දිරිගැන්වීම් මගින් ආගම් වෙනස් කිරීම සඳහා පෙළඹවීම රටේ නීතිය යටතේ වරදක් විය යුතුය.*

*vi. බුද්ධාගම සහ සෙසු ආගම්වලට අදාළව දැනට ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදන එසේම පැවතිය යුතුය.*

***vii.*** ***ආගමික ගැටුම් වැළැක්වීම සඳහා ජාතික, ආගමික, උපදේශක සභාවක් සහ ලේකම් කාර්යාලයක් පිහිටුවිය යුතුය.***

***viii.*** ***නව ආගමික මධ්‍යස්ථාන පිහිටුවීමට අවසර දීමේදී වැඳුම් පිදුම් සහ වත්පිළිවෙත්වලට අදාලව ඓතිහාසික සම්ප්‍රදායන් සැලකිල්ලට ගනිමින් පොදු ජාතික නිර්ණායක පද්ධතියක් සකස් කළ යුතුය.***

***මෙම නව ව්‍යවස්ථාව ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත්වන පොදු අපේක්ෂකයා විසින් රටට ඉදිරිපත් කළ යුතුය. ඒ මගින් එම ජනාධිපතිවරණය නව ව්‍යවස්ථාව ජනතාව විසින් අනුමත කරන ජනමත විචාරණය බවට පත් කළ යුතුය. ඉන් පසුව එම ජනාධිපතිවරයා ජනාධිපතිවරණය පවත්වා මාසයක කාලයක් ඇතුළත විධායක නොවන ජනාධිපතිවරයා ලෙස ප්‍රකාශයට පත්කළ යුතු අතර භාරකාර රජයක් පත්කළ යුතුය. අගමැතිවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට විධායක බලය පැවරෙන්නේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව පවත්වන මැතිවරණයේ දී බලය ලබාගන්නා නව ආණ්ඩුව යටතේය. එතෙක් භාරකාර ආණ්ඩුව විසින් විධායක බලය ක්‍රියාත්මක කළ යුතුය.***



# 09

# දූෂණ විරෝධී සටන් පාඨයේ ඉදිරි වලංගුභාවය

රාජ්‍ය පාලන ක්‍රියාවලිය තුළ රජුගේ සිට පහළට සෑම මට්ටමකම පෘතග්ජනයා දූෂණයට, වංචාවට සහ අල්ලසට ගොදුරු වන බව චානක්‍ය හෙවත් කෞටිල්‍ය නම් වූ අර්ථශාස්ත්‍රයන් විසින් ප්‍රකාශ කරන්නට යෙදුනේ ක්‍රි. පූ 4 වැනි ශතවර්ෂයේ දීය. එම තත්ත්වය පාලනය කිරීම සඳහා විවිධ ක්‍රමවේද ඔහු විසින් යෝජනා කළ අතර මෞර්යවංශ රාජ්‍ය පාලනය තුළ ඒවා ක්‍රියාත්මක කිරීමට ද ඔහු මැදිහත් විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ දූෂිත රාජ්‍ය වංශිකයන් විසින් ම ඔහුව ඝාතනය කිරීමය. ඊට පෙර බුදුන් වහන්සේ විසින් ද පොදු දේපළ සොරකමේ ආදීනව පිළිබඳ ඉතා පුළුල් වශයෙන් දේශනා කළ අතර ඉන් වැළකී සිටීම සඳහා අවශ්‍ය අධ්‍යාත්මය සකස් කර ගැනීම සඳහා මඟපෙන්වීය. ලෝකයේ සෑම ආගමක් විසින්ම දූෂණය, වංචාව, අල්ලස බරපතළ අකුසල් හෙවත් වැරදි ලෙස නම් කොට ඇත. එසේම ඉන් ගැලවීමේ වැදගත්කම අවධාරණය කොට ඇත.

චීනය වැනි රටක පොදු මහජන දේපොළ සොරා කෑමට එරෙහිව මරණ දඬුවම් පවා පනවා ඇත. ඒ රටෙහි සෑම වසරකම එම වරද සඳහා රාජ්‍ය නිලධාරීන්ට ප්‍රසිද්ධියේ මරණ දඬුවම ලබාදෙන ආකාරය ජාත්‍යන්තර මාධ්‍ය විසින් වාර්තා කරන්නේ ඉතා සුලබ සිදුවීමක් ලෙස ය. මරණ දඬුවම නිසා දූෂිතයන් නිවැරදි වන්නේ නම් හෝ එවැනි ක්‍රියා සමාජයෙන් තුරන් වන්නේ නම් සෑම වසරකම එසේ මරණ දඬුවම් ලබා දීමට සිදුවන්නේ නැත. දූෂණය, වංචාව සහ අල්ලස ධනපති අර්ථ ක්‍රමය තුළ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය ප්‍රවනතාවයක් බව මාක්ස්වාදීන්ගේ මූලික පිළිගැනීමකි. මෙම ප්‍රවණතාවය ආර්ථික වර්ධනය නම් වූ දුම්රියේ එන්ජිම ලෙස සැළකිය හැක. ඒ අනුව ඊට පහසුකම් සලසන රාජ්‍ය පාලන ක්‍රමවේද සහ දේශපාලන සංස්කෘතිය රේල් පීලි ලෙස සැලකිය හැක. එවැනි ක්‍රමයක් පෙරළා දමා ඊට විරුද්ධ යැයි සැලකෙන සමාජවාදී රාජ්‍යයක් ලෝකයේ පළමුවරට බිහිකළ විප්ලවවාදී දේශපාලන නායකයා වූ වී.අයි.ලෙනින් ධනපති ක්‍රමය හාස්‍යයට ලක් කරන්නේ එම ක්‍රමයේ දූෂිත බව පිළිබඳ ඉතා නිර්මාණශීලී අදහසක් ඉදිරිපත් කරමිනි.

ඔහුට අනුව සමජවාදීන්ට ධනපති ක්‍රමය එල්ලා මැරීමට අවශ්‍ය නම් ඊට අවශ්‍ය වන කඹය ඇඹරීමට අවශ්‍ය වන්නේ නැත. එනම් ඔවුන් එල්ලන කඹය ඔවුන්ගෙන්ම මිලදී ගත හැක. ඊට අනුව ධනපති පංතිය කොතෙක් දූෂිත ද යත් ඔවුන් ගෙන් අයෙක් තම පන්තිය එල්ලා මරණ කඹය මුදලට විකුණනු ඇත. එහෙත් තවමත් ලෝක කම්කරු පන්තියට ලෝක ධනේශ්වරය එල්ලා මැරීමට අවශ්‍ය කඹය මිලදී ගැනීම සඳහා ''අතිරික්ත ප්‍රාග්ධනය'' සොයා ගැනීමට නොහැකි වී ඇත. ඊට හේතුව ධනේශ්වර ක්‍රමය තුළ සෑම විටම ශ්‍රමයේ අතිරික්තය ධනපතියා අත ඉතිරි වීම ද? ඉන් අදහස් වන්නේ ඊනියා දූෂණ විරෝධී සටනකින් පමණක් ධනපති ක්‍රමය පරාජය කළ නොහැකි බව ද? එසේ නොමැති නම් ඉන් අදහස් වන්නේ සැබෑ දූෂණ විරෝධී සටන පටන් ගත යුත්තේ හෝ එය සාර්ථක වන්නේ දූෂණයේ උල්පත වන ධනපති ක්‍රමය වෙනස් කිරීමෙන් පසුව පමණක් බව ද?

ඒ සියලු කරුණු සහ ප්‍රශ්න කිරීම් වලින් ප්‍රකට වන්නේ දූෂණයට, වංචාවට එරෙහි සටන මානව ශිෂ්ටාචාරය තුළ පවතින සදාතනික සටනක් බව නොවේද? ඒ සදාතනික සටන පවුල් ඒකකය තුළින් පටන්ගෙන පන්සල, පල්ලිය, පාසල සහ දහම් පාසල තුළ වර්ධනය වී පාර්ලිමේන්තුව දක්වා ගමන් කළ යුතු නොවේද? කෙසේවෙතත් ඒ සදාතනික සටනේ යම් උච්ච අවස්ථාවක් දේශපාලන උපාංගයක් ලෙස යොදාගනිමින් ආණ්ඩු පෙරළීම දක්වා වර්ධනය කිරීමේ විභවය ඇත. එහෙත් එසේ එක් ධනපති ආණ්ඩුවක් පෙරළා තවත් එවැනිම ධනපති ආණ්ඩුවක් ගෙන ඒමෙන් ලෝකයේ දූෂණය සහ වංචාව තුරන් කළ නොහැකි බව පැහැදිලිව ඔප්පු වී ඇත. ඊට අදාළ උදාහරණ ඇමරිකාවේ සිට සිම්බාබ්වේ දක්වා ලෝක සිතියම පුරා සටහන් කළ හැක.

එසේ වුවත් දේශීය සහ විදේශීය බලවේග රාශියක් එක පෙළට සිට ගනිමින් ආණ්ඩුවක් පෙරළීම සඳහා දූෂණ විරෝධී සටන් පාඨ නිර්මාණශීලීව යොදා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව තරම් විචිත්‍රවත් උදාහරණයක් ලෝකයේ තවත් තිබේද ? යන්න සැක සහිතය. පොදු ජනතාව අතරින් ඒ සඳහා ප්‍රබල ඉල්ලීමක් නොතිබූ අවස්ථාවක එවැන්නක් සාර්ථක වීම වඩාත් සුවිශේෂී වේ. ඊට අදාළව ලෝක ඉතිහාසය තුළ ශ්‍රී ලංකාව තවදුරටත් සුවිෂේශී වීමට ද හේතුවක් ඇත. එනම් මහා දූෂණ විරෝධී දේශපාලන මෙහෙයුමක උදව්වෙන් බලයට පත්වන ආණ්ඩුව එසේ බලයට පත්වී මාසයක් ගතවන විට කිසිදු සැකයකින් හෝ බියකින් තොරව එම රටේ සිදුවූ බරපතළ ම මූල්‍ය වංචාවට මුල පිරීම ය. එම සුවිශේෂී තත්ත්වය අතිසුවිශේෂී වන්නේ ඒ මහා දූෂණයට වගකිව යුතු ආණ්ඩුව විසින්ම ඊළඟ මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීම සඳහා දූෂණ විරෝධී සටන් පාඨ තවදුරටත් වරගන්වා යොදා ගැනීමය. ඊට අමතරව තමාගේ සමස්ත දේශපාලන ව්‍යාපාරයම දූෂණ විරෝධය වෙනුවෙන් නැවත බෞතීස්ම කළ ජනතා විමුක්ති පෙරමුණ වැනි වාමාංශික පක්ෂ විසින් පවා එම දූෂණ විරෝධී ව්‍යාජ මෙහෙයුම් සාධාරණීකරණය කරනු ලැබීය.

දේශපාලන වේදිකාවේ රඟදැක්වෙන 'හොරුන්ට එරෙහිව හොරුන්' නම් වූ ඒ ජුගුප්සාජනක නාඩගම මගින් සෙසු බරපතළ දේශපාලන සමාජ, ආර්ථික අර්බුද යටපත් කිරීමටද ආණ්ඩුව සමත් වී ඇත. ඊට ජනතා විමුක්ති පෙරමුණේ රංගන දායකත්වය බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත. සෙසු විපක්ෂ බලවේග ද ප්‍රේක්ෂකාගාරයේ සිට එම නාඩගම දෙස බලා සිටිනවා මිස වේදිකාවට පැන ව්‍යාජ නාඩගම වෙනුවට සැබෑ නාඩගම රඟ දැක්වීමට අපොහොසත් වී ඇත. ඒ නිසා පසුගිය සමස්ථ පුංචි මැතිවරණ කාලය තුළ මහජනයාට බැදුම්කර මගඩි නාඩගම බලමින් කාලය නාස්ති කිරීමට සිදු විය. නමුත් මහින්ද රාජපක්ෂයන්ට අදාලව දූෂණ වංචා විරෝධය එම මැතිවරණයේ තීරක කොන්දේසියක් නොවූ බව මැතිවරණ ප්‍රතිඵලවලින් පැහැදිලි විය. ඒ නිසා නැවත වටයකින් දූෂණ විරෝධි සටන් පාඨ හරහා ආණ්ඩු පෙරළීමට හෝ පත් කිරීමට කිසිදු ඉඩක් නැත.

දැන් ආණ්ඩුවට ආවඩන එන්.ජී.ඕ.කාරයන් පමණක් නොව ජනතා විමුක්ති පෙරමුණ පවා ආණ්ඩුවේ සහ තමාගේ පරාජයට හේතුව ලෙස ඉදිරි ඉදිරිපත් කරන්නේ දූෂණ වූ විරෝධී නාඩගම් හොඳින් රඟ දැක්වීමට අසමත් වීම ය. ඉන් අදහස් වන්නේ ඉදිරි ජනාධිපතිවරණය දක්වා එම නාඩගම වෙනත් ආකාරයකට රඟ දැක්වීමට ඔවුන් සූදානම් වන බව ය. බොහෝ විට ඒ වෙනස යනු විරුද්ධවාදීන්ට එරෙහිව අත්තනෝමතික ලෙස නීතිය ක්‍රියාත්මක කිරිම සදහා මහා පරිමාණයෙන් පළි ගැනීමේ ක්‍රියාවලියක් දියත් කිරීම විය හැක. ඒ මගින් ආණ්ඩුව තමාගේ අසමත්කම වසා ගැනීමට ද කටයුතු කරනු ඇත. දැන් ආණ්ඩුව උත්සාහ කරන්නේ විශේෂ මහාධිකරණය පිහිටුවීම සඳහා අදාළ පනත් සංශෝධනය කිරීම මගින් තම අසමත්කම වසා ගැනීමට ය

එම තත්වයට මුහුණ දීමේදී විපක්ෂයේ බලවේග විසින් තේරිය යුතු මූලික උපායමාර්ගය විය යුත්තේ ආණ්ඩුවේ සැබෑ න්‍යාය පත්‍රය හෙළිදරව් කොට ව්‍යාජ වංචා, දූෂණ විරෝධි සටන් පාඨය

අබිබවා ආණ්ඩුවට එරෙහිව අභියෝග කිරීම ය. නමුත් දැන් විපක්ෂයේ බලවේග කරන්නේ කුමක්ද? ඔවුන් දැන් මහන්සි වන්නේ මහජන වරම අහිමි වී සෙලවුණු ආණ්ඩුව ස්ථාවර කිරීමට ය. මහානායක හිමිවරුන් පවා ප්‍රකාශ නිකුත් කරන්නේ ආණ්ඩුව ස්ථාවර කරන ලෙසට ය. නමුත් මහජනයා තමා විසින් ආණ්ඩුවට මීට පෙර ලබා දුන් ජනවරම ආපසු උදුරා ගන්නේ ආණ්ඩුව අස්ථාවර කොට ආණ්ඩුවේ න්‍යාය පත්‍රය අවුල් කිරීමට ය. එනම් ආණ්ඩුව අස්ථාවරකොට රට ස්ථාවර කිරීම ය.

ඒ අනුව විපක්ෂයක කාර්යභාරය විය යුත්තේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රය එකින් එක පැහැදිලි කොට ඒවා ආණ්ඩුවට එරෙහි කොන්දේසි බවට පරිවර්තනය කොට ආණ්ඩුව දේශපාලන වශයෙන් යටත් කිරීමය. මෙම නිශ්චිත මොහොතේ රටට එරෙහිව විදේශ ආක්‍රමණයක් හෝ සුනාමිය වැනි මහා පරිමාණ ව්‍යසන තත්වයක් පැන නැගී තිබුණානම් ආණ්ඩුව ස්ථාවර කිරීමේ. මාතෘකාව අදාළ විය හැක. නමුත් මේ කතා කරන ස්ථාවරභාවය රැකීම යනු ආණ්ඩුවේ න්‍යාය පත්‍රය තවදුරටත් රැකීම මිස අන් කුමක්ද? ඒ තුළ දැන් ආණ්ඩුව විසින් බැඳුම්කර වංචාව එදා කළා මෙන් දස ගුණයකින් නීතියට හසු නොවන ලෙස කිරීම සඳහා නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර තිබේ. වංචා දූෂණ සටන් පාඨය ඉදිරි ජනාධිපතිවරණය දක්වා දිගු කිරීමට අවශ්‍ය අරමුදල් මහා පරිමාණයෙන් සපයා ගැනීමට ආණ්ඩුවට ඉන් ඉඩ ලැබේ. එම දූෂිත අරමුදල්වල බලයෙන් සහ දූෂණ වංචා විරෝධයේ නාමයෙන් ජනවරම ආපසු හැරවීමට ආණ්ඩුව උත්සාහ කරන බවට කිසිදු සැකයක් නැත. ඒ තුළ විපක්ෂය කළ යුත්තේ කුමක්ද? ඒ ව්‍යාජ දූෂණ විරෝධි මෙහෙයුමට එරෙහි ප්‍රති මෙහෙයුම වන්නේ මහා ජාතික න්‍යාය පත්‍රයක් රට ඉදිරියට ගෙන ඒම නොවේද? ඒ න්‍යාය පත්‍රය මුල් කරගෙන මහා ජන බලවේගයක් ගොඩනැගීම නොවේද?

ඊට අමතරව අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම මගින් තමාට අවශ්‍ය හොරුන්ට පමණක් දඬුවම් කිරීම සඳහා ආණ්ඩුව විසින් ගන්නා වූ උත්සාහය පරාජය කරන්නේ කෙසේද? එම පනතට

එරෙහිව අධිකරණයේ පිහිට පැතීම මගින් පමණක් ආණ්ඩුවේ උත්සාහය පරාජය කළ නොහැක. ඒ සඳහා ආණ්ඩුවට එරෙහිව පාර්ලිමේන්තුව තුළ දී මෙන්ම ඉන් පිටත දීද ඍජුව යුද්ධ ප්‍රකාශ කිරීමට විපක්ෂයට සිදුවනු ඇත.

එම නව පනත මගින් පිහිටුවන විශේෂ ත්‍රී පුද්ගල මහාධිකරණයට චෝදනා ගොනු කරන්නේ නීතිපතිවරයා විසින් සහ අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසිනි. ඒ ආකාරයට විවිධ පනත් 24ක් යටතේ වන වැරදි සඳහා මහාධිකරණයට චෝදනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. එම නිලධාරීන් දෙදෙනාම දේශපාලන උවමනාවන්ට අනුව කටයුතු කිරීමට සිදු වන පුද්ගලයන් වීම තුළ චෝදනා එල්ල කෙරෙනු ඇත්තේ විපක්ෂයේ තෝරාගත් නායකයින් පිරිසකට පමණි. එසේ චෝදනා සහිත ලිපිගොනු සකස් කිරීමෙන් පසුව ඒ බව දන්වා යම් පිරිසක් යටත්කර ගැනීමට ආණ්ඩුව උත්සාහ කරනු ඇත. එවිට යටත්වන්නන්ගේ ලිපිගොනු මහාධිකරණයට ඉදිරිපත් නොකෙරෙනු ඇත. යටත් නොවන්නන්ගේ නඩු පනතේ ප්‍රතිපාදන අනුව කඩිනමින් අසා දඬුවම් ලබාදීමට ආණ්ඩුව මැදිහත් වනු ඇත. එම ක්‍රියාවලිය තුළ ආණ්ඩුවේ යහපාලන පම්පෝරිය රෙද්ද පල්ලෙන් බේරෙන තත්වයක් ඇති වනු ඇත.



# 10

# බෙදුම්වාදයට එරෙහි ජ.වි.පෙ. භූමිකාව සහ එහි අවසානය

ජනතා විමුක්ති පෙරමුණේ වර්තමාන නායක අනුර කුමාර දිසානායක මහතාගේ නවතම මතය අනුව රට බෙදීමේ ජාත්‍යන්තර උවමනාවක් නැත. ඔහුට අනුව රට බෙදෙන්නේ මහින්ද රාජපක්ෂගේ ජාතිවාදී ප්‍රකාශ නිසාය. ඒ අනුව මහින්ද රාජපක්ෂ එවැනි ප්‍රකාශ සිදුනොකරන්නේ නම් රට බෙදීමක් සිදු නොවනු ඇත. නමුත් දෙමළ බෙදුම්වාදී පක්ෂ විසින් ජාතිවාදය පතුරුවන්නේ කුමන අරමුණක් සහිතව ද යන්න පිළිබඳව අනුර කුමාර දිසානායක මහතා කිසිවක් නොකියයි. සමහරවිට ඒ සම්බන්ධන් මහතා විසින් ඔහුට පිරිණමා ඇති විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයට කෘතගුණ සැලකීම සඳහා විය හැක. එහෙත් ජනතා විමුක්ති පෙරමුණ විසින් බෙදුම්වාදයට විරුද්ධව ඉතිහාසයේ තැබූ සලකුණ කිසිවකුට මකා දැමිය නොහැක. අද එම පක්ෂයට යම් ජනප්‍රසාදයක් ඉතිරිවී ඇත්නම් ඒ ඔවුන් විසින් ඉටු කළ ඒ ඓතිහාසික භූමිකාවට පින්සිදු වන්නටය. ඔවුන් විසින්

තම අතීත භාවිතාව අත්හැරීමේ වරදට මෙවර පුංචි මැතිවරණයේ දී විශාල වන්දියක් ගෙවීමට සිදුවිය. ඔවුන් 15%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීම මගින් රජුන් තනන්නාගේ භූමිකාව අත්පත් කර ගැනීමට උත්සහ කළද ඔවුනට ලබාගතහැකිවූයේ 6%ක පමණි. ඒ නිසා දැන් ඔවුන්ට ඉතිහාසය මතක්කර දීමට කාලය පැමිණ ඇත.

මීට වසර 38කට පෙර 1979 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරුපීඨ ශ්‍රවණාගාරයේදී විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්විණි. එහි විශේෂ ආරාධිත දේශනය පැවැත්වූයේ එවකට ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්වරයා වූ ලයනල් බෝපගේ මහත්මයා විසිනි. ''ස්වයං තීරණ අයිතිය'' නමින් පැවැත්වූ එම සම්මන්ත්‍රණය සංවිධානය කළේ විශ්ව විද්‍යාල මහා ශිෂ්‍ය සභාව විසිනි. ඉතා දක්ෂ කථිකයකු වූ බෝපගේ මහතා විසින් උතුරේ ත්‍රස්තවාදය විමුක්ති අරගලයක් ලෙස අර්ථ දක්වමින් ඊට විසඳුම් ලෙස ස්වයං තීරණ අයිතිය නම් වූ න්‍යාය ඉතා තර්කානුකූලව ඉදිරිපත් කළේය. ඊට අනුව දකුණේ විප්ලවවාදී ව්‍යාපාර උතුරේ සන්නද්ධ බෙදුම්වාදී ව්‍යාපාරයට සහාය පල කළ යුතුය. ඒ අනුව ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ අත්තනෝමතික අධිරාජ්‍ය ගැති පාලනයට එරෙහිව කැරලි ගසන උතුරේ බෙදුම්වාදීන් දකුණේ විශ්ව විද්‍යාල සිසුන් අතර වීරයින් බවට පත්වේ.

එදා විශ්ව විද්‍යාල සිසුන් අතර එම දේශපාලන ස්ථාවරය ආකර්ෂණීය විය. විශේෂයෙන්ම එදා එක්සත් ජාතික පක්ෂ ශිෂ්‍ය කණ්ඩායම්වලට එරෙහිව තරඟ වැදුණු ශිෂ්‍ය කණ්ඩායම් වලට දෙමළ සිසුන්ගේ ඡන්ද ලබා ගැනීම සඳහා එම ස්ථාවරය ඉතා ප්‍රයෝජනවත් විය. එම සම්මන්ත්‍රණය සංවිධානය කළ කමිටුවේ සාමාජිකයින්ට රැස්වීමෙන් පසු ලයනල් බෝපගේ සමග තව දුරටත් වාද විවාද කිරීමටද අවස්ථාව ලැබිණි. එම අවස්ථාව ප්‍රයෝජනයට ගත් ඔහු 'දෙමළ විමුක්ති අරගලය තුළින් සමාජවාදයට' යනුවෙන් අප්‍රකාශිත උපායමාර්ගික ප්‍රවේශයක් පිළිබඳව ද නව මතයක් ගොඩනැගීය. නමුත් ඉන් වසරකට පසු පේරාදෙණිය විශ්ව විද්‍යාලයට පැමිණි

රෝහණ විජේවීරයන් ශිෂ්‍ය නේවාසිකාගාරයකදී හමු වූ ශිෂ්‍ය නායකයින් කණ්ඩායමකට එතෙක් ඔවුන් දැරූ මතයට වඩා වෙනස් මතයකට සවන් දීමට සිදුවිය. එහෙත් බෝපගේ ඉදිරිපත් කළ න්‍යාය සම්පූර්ණයෙන්ම නිශේධ කිරීමට විජේවීරයන් අසමත් විය. අවසානයේදී ජාතික ගැටලුව විසඳිය හැක්කේ සමාජවාදය යටතේ පමණක් බව කියමින් ඔහු එම සංවාදය අවසන් කළේය. එහෙත් ප්‍රශ්නය විසඳීම සඳහා සමාජවාදය ගොඩනගනතුරු බලා සිටිය යුතුද යනුවෙන් මතුවූ ප්‍රශ්නයට ඔහු විසින් ඍජු පිළිතුරක් ලබා දුනි. ඒ ''මා අදහස් කරන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සමානව සැලකීමෙන් ප්‍රශ්නය විසඳිය යුතු බව ය'' කියමිනි.

ඉන් පසුව 1983 දී කොළඹ දී ලයනල් බෝපගේ මහතා සහ එදා සම්මන්ත්‍රණයේ සංවිධායකයින් නැවත මුණගැසෙන අවස්ථාව වන විට ජනතා විමුක්ති පෙරමුණ තුළ ''ස්වයං තීරණ අයිතිය'' න්‍යාය පරාජය කොට තිබිණි. ඒ වන විට ඔහු පරාජය බාරගෙන සමු ගැනීම සඳහා එක් පයක් එළියට තබා තිබුණි. නමුත් එසේ ඔහුගේ සමු ගැනීම සමග මහා සමාජය තුළ එම මතවාදය ඉබේම පරාජය නොවන බව රෝහණ විජේවීරයන් තේරුම්ගෙන සිටියේය. වාමාංශික පක්ෂ බෙදුම්වාදී න්‍යාය පත්‍රය තුළට කොටුකර ගැනීම සඳහා අවශ්‍ය මූලික කොන්දේසිය සපුරන්නේ ස්වයං තිරණ අයිතිය පිළිගැනීම නැමති උපායමාර්ගික ප්‍රවේශය තුළින් බවට ඔහු පසුකලෙක පැහැදිලි කරන්නට යෙදුනි. ඒ වනවිටත් ලයනල් බෝපගේ නමැති පුද්ගලයා සහ ඔහුගේ මතවාදය අගය කරමින් බෙදුම්වාදයට පක්ෂපාතී බුද්ධිමය සංවාද ආරම්භ කිරීමට රාජ්‍ය නොවන සංවිධානවලට සම්බන්ධ ඊනියා බුද්ධිමතුන් කටයුතු කරමින් තිබිණි.

කෙසේ වෙතත් 1983 ජූලි මාසයේදී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීම නිසා බෙදුම්වාදය මතවාදීව පරාජය කිරීම සඳහා අවශ්‍ය වන බුද්ධිමය සංවාදය සමාජගත කිරීමට නොහැකි විය. නමුත් තහනම යටතේ

පවා බුද්ධිමතුන් අතර එම සංවාදය ඉදිරියට ගෙන යාම සඳහා ජනතා විමුක්ති පෙරමුණ විසින් විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදී තිබුණි. බුද්ධිමතුන් අතරට එම මතවාදය ගෙන යමින් බෙදුම්වාදය මතවාදීව පරාජය කිරීමේ වගකීම කරට ගෙන තිබුණේ සෝමවංශ අමරසිංහයන් ය. ඉතා දුෂ්කර තත්වයක් යටතේ ඔහු එම වගකීම මැනවින් ඉටු කිරීමට උපරිම ලෙස කැප විය. බෙදුම්වාදයේ පරාජය සහ සමාජවාදයේ ජයග්‍රහණය න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගිකව එකට බැඳී තිබෙන බව ඔහු දැඩි ලෙස විශ්වාස කළේය. ඒ වන විට ළදරු වියේ පැවති බෙදුම්වාදී සන්නද්ධ ව්‍යාපාරය ඉන්දියාවේ ආශිර්වාදය යටතේ ඉතා කෙටි කාලයකදී ඉතා බලවත් තත්වයට පත් වන බව ද ඔහු දැඩි ලෙස විශ්වාස කළේය. බෙදුම්වාදය සෑම විටම පන්ති සටනට සහ සමාජවාදයට හතුරු ප්‍රවණතාවක් ලෙස සලකා ඊට පක්ෂපාතී සියලු බලවේගවලට කොන්දේසි විරහිතව විරුද්ධ විය යුතු බව ඔහු නිතර පැවසීය. ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කිරීමට වසර 3කට පෙර සිට බෙදුම්වාදයට පක්ෂපාතීව බරපතළ මැදිහත්වීමක් ඉන්දියානු රජය විසින් කරන බවට ඔහු විසින් අනාවැකි පළකරන්නට යෙදුනි.

''දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?'' යන පර්යේෂණාත්මක ශාස්ත්‍රීය කෘතිය රෝහණ විජේවීරයන් විසින්ම සම්පාදනය කරන්නට තීන්දු වන්නේ ඊට මුහුණ දීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක පදනම ශක්තිමත් කිරීමටය. ඉන්දියානු මැදිහත්වීමකදී සියලු වාමාංශික පක්ෂ න්‍යායාත්මක පටලවා ගැනීම් නිසා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා අබිබවා යමින් ඊට පක්ෂව කටයුතු කරන බවට ඉතා පැහැදිලි අවබෝධයක් ජනතා විමුක්ති පෙරමුණට තිබිණි. ''අධිරාජ්‍ය විරෝධී අරගලය තුළින් සමාජවාදයට'' යනුවෙන් එදා ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කළ මූලික උපායමාර්ගික ප්‍රවේශය තුළ බෙදුම්වාදී විරෝධී සටනට ප්‍රමුඛස්ථානය හිමි වන්නේ සෙසු වාමාංශික පක්ෂ විසින් සිදු කළ වරද ඔවුන් විසින් නිවැරදි කරගත් බැවිනි. විජේවීරයන් විසින් ඉතා දුෂ්කර තත්වයක් යටතේ වල්හපුතැන්නේ කුඩා නිවසක ආරක්ෂිතව සිටිමින් ''ඊළාම් අරගලයට විසඳුම කුමක්ද? නැමති ශාස්ත්‍රීය නිබන්ධනය සම්පාදනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දී තිබුණි.

1984 අගභාගයේ සිට විජේවීර - සෝමවංශ සුසංයෝගය විසින් එම කටයුත්තට කෙතරම් ප්‍රමුඛතාවක් ලබාදී තිබුණාද යන්න පිළිබඳව පැහැදිලි සාක්ෂි ඇත. එක්තරා අහඹු සිදුවීමක් නිසා එම කෘතියේ මුල් අත්පිටපත මුද්‍රණයට ලබා දීමට පෙර අස්ථානගත විය. නමුත් විජේවීරයන් තම අසාමාන්‍ය මතක ශක්තිය කොතෙක්ද යන්න ඔප්පු කරමින් සමස්ත කෘතිය ඉතා කෙටි කලකදී නැවත ලියා අවසන් කළේය. ඒ අනුව 1985 දී එම කෘතිය සමාජගත කිරීමට හැකි විය. එදා ජනතා විමුක්ති පෙරමුණ 1987 දී සිදුවුණ දේ පිළිබඳ න්‍යායාත්මකව පැහැදිලි කිරීම් සමාජයට ඉදිරිපත් කරන්නේ 1985 දීය. ඒ නිසා ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමට පෙර එහි මූලික අරමුණ කුමක්දැයි එදා සිටි නායකයෝ ඉතා හොඳින් දැන සිටියහ. මහින්ද - ගෝඨාභය සුසංයෝගය විසින් 2009 මැයි 18 දින නන්දිකඩාල් කලපුවේදී අවසන් කරන්නේ විජේවීර - සෝමවංශ සුසංයෝගය විසින් 1987 ජූලි 28 දින පිටකොටුවේදී දියත් කළ බෙදුම්වාදී විරෝධී යුද්ධය නොවේද? එදා ඒ ආරම්භක සටනේ සෙන්පතියන් ලෙස මහින්ද රාජපක්ෂ සහ දිනේෂ් ගුණවර්ධන යන නායකයන්ට අමතරව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පවා පිටකොටුවට කැඳවා ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ සමත්විය. එදා ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කළ ප්‍රබල මතවාදී සටන් පෙරමුණ තුළ වාමාංශික පක්ෂ හැර සෙසු ජාතිකවාදී නායකයින්ට පසු බැසීමේ ඉඩක් ඉතිරි නොවීය.

නමුත් අද වන විට ජනතා විමුක්ති පෙරමුණ ඉටු කරන්නේ ඊට හාත්පසින්ම වෙනස් භූමිකාවකි. එදා ඉන්දු - ලංකා ගිවිසුම අනුව 13 වන ව්‍යාවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන්නේ ඔක්තෝබර් මාසයේ දී වන අතර එය සම්මත වන්නේ නොවැම්බර් මාසයේ දීය. එසේ වුවත් ජනතා විමුක්ති පෙරමුණ එම ක්‍රියාවලියට විරුද්ධව ප්‍රහල විරෝධතා දියත් කරන්නේ ජූලි මාසයේදීයි ඒ වන විට 13 වන ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙහි අඩංගු වන වගන්තිවල වචන මොණවාදැයි ඔවුන් දැන සිටියේ නැත.

නමුත් එම කෙටුම්පත මගින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු සහ ඊට අදාළ උපායමාර්ගික ප්‍රවේශය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට ඉතා හොඳ අවබෝධයක් තිබිණි. ඔවුන් විසින් බෙදුම්වාදී මාර්ග සිතියමේ පළමු සැතපුම් කණුව අසලදී නිසි වේලාවට නිසි පරිදි විරෝධය දක්වන්නේ කෙසේද? ඒ එම මාර්ග සිතියමේ අවසාන සැතපුම් කණුව හඳුනා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක පදනම රෝහණ විජේවීරයන් විසින් ඊට වසර 2කට පෙර හඳුන්වා දුන් බැවිනි.

නමුත් අද ජනතා විමුක්ති පෙරමුණේ නායකයින් මහජනයාගෙන් ප්‍රශ්න කරන්නේ ව්‍යවස්ථා කෙටුම්පතක් දකින්නේ නැතිව ඊට එරෙහිව විරෝධය පළකරන්නේ කෙසේද යනුවෙනි. එදා ඉන්දියානු රාජතාන්ත්‍රික පීඩනයට සහ බෙදුම්වාදීන්ගේ ප්‍රචණ්ඩත්වයට බියවී ඔවුන්ගේ දේශපාලන ඉල්ලීම් ලබා දීමට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට සිදු විය. ඊට එරෙහිව ප්‍රචණ්ඩ ලෙස විරෝධය පළකරන්නට ජනතා විමුක්ති පෙරමුණට සිදු වන්නේ එම යතාර්ථය තුළය. නමුත් ජේ. ආර්. ජයවර්ධන මහතා ඉන්දියාව විසින් ඉදිරිපත් කළ ෆෙඩරල් විසඳුමට සම්පූර්ණයෙන්ම යටත් නොවී බේරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ විසින් සිදු කළ ප්‍රචණ්ඩ විරෝධය ඉතා සූක්ෂ්ම ලෙස භාවිතා කළේය. ජයවර්ධන ජනාධිපතිවරයා කිසිසේත්ම කැමැත්තෙන් බලය බෙදීමට එකඟ වූ අයකු නොවේ. ඔහුට අවශ්‍යවූයේ සිංගප්පූරු මොඩලයට අනුව ශක්තිමත් මධ්‍යගත ධනපති රාජ්‍යයක් ගොඩනැගීමටය. ඒ නිසා ඔහු ඉන්දියානු නිලධාරීන් විසින් සකස් කළ ව්‍යවස්ථා සංශෝධනයට විවිධ ආකාරයට ව්‍යවස්ථාමය බාධක ප්‍රමාණයක් ඇතුල් කිරීමට ක්‍රියා කළේය. ඒ සඳහා ඔහුට දේශප්‍රේමී නිලධාරීන් සහ නීතිඥයින් කිහිපදෙනෙකුගේ සහාය ලැබිණි. ඊට අදාල සාක්ෂි පසු කලෙක එච්.එල්. ද සිල්වා සහ එස්. එල්. ගුණසේකර වැනි ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් උපදෙස් ලබා ගත් ජ්‍යෝෂ්ඨ නීතිඥවරුන් මෙන්ම 13 වන ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේදී තීන්දුව ලබා දුන් රාජා වනසුන්දර වැනි විනිසුරුතුමන්ලා ද එළිදරව් කරන්නට යෙදුනි.

කෙසේ වෙතත් ජනමත විචාරණයක් දක්වා යොමු වන ව්‍යවස්ථා සංශෝධනයක් වැළැක්වීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කළ ප්‍රචණ්ඩ විරෝධය හේතු වූ බවට විවාදයක් නැත. ඉන්දියානු නිලධාරීන් සමග කේවල් කිරීමේදී එම ප්‍රචණ්ඩ මහජන විරෝධය ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට ආශිර්වාදයක් විය. ඔහු විසින් 13 වන ව්‍යවස්ථා සංශෝධනය මුළුමනින්ම ක්‍රියාත්මක වීම වැළැක්වීම සඳහා යෙදූ ව්‍යවස්ථාමය බාධකවලට විධායක ජනාධිපති ක්‍රමයද ආශිර්වාදයක් විය. අද ජයම්පති වික්‍රමරත්න සහ සුමන්තිරන් යන ජාතික ලයිස්තු මන්ත්‍රී සුසංයෝගය විසින් ගලවා ඉවත් කිරීමට උත්සාහ ගන්නේ එදා ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් යෙදූ ව්‍යවස්ථාමය බාධක බවට ඉතා පැහැදිලි සාක්ෂි ඇත. ඉතා සුළු ව්‍යවස්ථා සංශෝධනයක් මගින් එම බාධක ඉවත්කර ගතහොත් බෙදුම්වාදීන්ට තම මාර්ග සිතියම ඔස්සේ කිසිදු බාධාවකින් තොරව ඉදිරියට ගමන් කළ හැක. ඒ සඳහා ව්‍යවස්ථාවේ පවතින ඒකීය වචනය හෝ බුද්ධාගමට හිමි ප්‍රමුඛස්ථානය වෙනස් කිරීම අවශ්‍ය වන්නේ නැත.

එදා ජනතා විමුක්ති පෙරමුණ හැටදහසකගේ පමණක් නොව එහි නිර්මාතෘවරයාගේ ද ජීවිතය පුදා 13 වන ව්‍යවස්ථා සංශෝධනය සහ ඊට මඟ පෑදූ ඉන්දියානු මැදිහත්වීමට විරෝධය පළ කළේය. නමුත් බොහෝ ලපටි දේශපාලනඥයන්ට අනුව ඒ සියල්ල නිශ්ඵල දේශපාලන ව්‍යායාමයන්ය. එහෙත් ජනතා විමුක්ති පෙරමුණ එදා ඒ ආකාරයට ප්‍රචණ්ඩ ලෙස විරෝධය පළ නොකළේනම් 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉන්දියාවටත් වඩා බරපතල ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කෙරෙන්නේ 1987 දීම බවට කිසිදු සැකයක් නැත. එසේ වූවානම් ඊට වසර කිහිපයකට පසුව නැවත ආරම්භ වන්නේ බෙදුම්වාදී යුද්ධයක් නොව පශ්චාත් බෙදුම්වාදී දේශසීමා යුද්ධයක්ය. එපමණක් නොව එදා විජේවීර - සෝමවංශ සුසංයෝගය විසින් බෙදුම්වාදයට විරුද්ධව ජීවිත පරිත්‍යාගයෙන් ප්‍රභල විරෝධයක් පළ නොකළානම් හෝ ඒ සඳහා විශාල වන්දියක් නොගෙව්වානම් 94 දී නැවත නැගිටීමෙන් පසුව බෙදුම්වාදී විරෝධය ජනතාවිමුක්ති පෙරමුණ නැමති පක්ෂ දේහයේ ඇට මිදුළු වලට කාවදින්නේ නැත.

එසේ නොවුනානම් 2002දී සටන් විරාම ගිවිසුම සහ තාවකාලික ආණ්ඩුව පරාජය කොට බෙදුම්වාදී මාර්ග සිතියමේ දෙවන පියවර පරාජය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ නැවත වටයකින් දිවි හිමියෙන් කැපවන්නේ නැත. සෝමවංශයන් විසින් ඒ දෙවන ඊළාම් විරෝධී සටන් පෙරමුණට නායකත්වය සපයන්නේ විජේවීරයන් විසින් පෙන්වූ න්‍යායාත්මක පදනම මත ශක්තිමත්ව දෙපා තබා ගනිමිනි. එසේ නොවුණානම් යුද්ධය අවසන් කිරිම සඳහා මහින්ද රාජපක්ෂයන් බලයට ගෙන ඒමේ ව්‍යාපෘතියට සෝමවංශයන් කරගහන්නේ නැත. එම දේශපාලන ව්‍යාපෘතියේ සාර්ථකත්වයට විමල් වීරවංශයන් ද ප්‍රබල භූමිකාවක් ඉටු කරනු ලැබීය. නෝර්වේ රජයේ ''නොරාඩ්'' නැමති ආධාර ව්‍යාපෘතියේ මුදල් වලින් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ විද්වතුන් කණ්ඩායමක් මගින් සිදු කළ අධ්‍යයන වාර්තාවක් මගින් සුඩානයට කළ දේ ශ්‍රී ලංකාවට කළ නොහැකිවූයේ කුමක් නිසා දැයි හෙළිදරව් වී ඇත.


''සාමයේ ඉත්තෝ'' ලෙස නම්කොට ඇති එම වාර්තාවට අනුව නෝර්වේ රජයේ මැදිහත්වීමෙන් සුඩානය බෙදා වෙන් කිරීමට හැකිවූවත් ශ්‍රී ලංකාවේදී එම සූත්‍රය වලංගු නොවන්නේ ප්‍රධාන වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉටු කළ සුවිශේෂී දේශපාලන භූමිකාව නිසාය. එහි මූලික ගෞරවය සෝමවංශ අමරසිංහයන්ට හිමි විය යුතුය. නමුත් එසේ සුඩානයට උරුමවූ අවාසනාවන්ත ඉරණමෙන් ශ්‍රී ලංකාව ගලවා ගැනීමට මුල්වූ පුද්ගලයාට අත්වූ කණගාටුදායක ඉරණම දෙස බලන විට ජනතා විමුක්ති පෙරමුණේ බෙදුවාදී විරෝධී මතවාදයට අද අත්වී ඇති ඉරණම ගැන පුදුමයක් ඇතිවිය නොහැකියි ඊළාම් මාර්ග සිතියමේ තුන්වන අදියර පරාජය කළ මහින්ද රාජපක්ෂයන්ට අත්වූ ඉරණම සමග සැසඳීමේදී එහි දෙවන අදියර පරාජය කිරීමට මුල්වූ සහ තුන්වන අදියරට පාර කැපූ සෝමවංශ අමරසිංහයන්ගේ ඉරණම ඉතා ඛේදනීයවේ. ඊට වගකිවයුතු පිරිස් අද රටේ ඉරණම තීන්දු කරන ඊළාම් මාර්ග සිතියමේ හතරවන හෙවත් අවසාන අදියර හමුවේ හැසිරෙන ආකාරය දෙස බලන විට රටේ අනාගත ඉරණම පිළිබඳ

පින්තූරය වඩාත් භයානක වේ. මේ නිශ්චිත මොහොතේ ව්‍යවස්ථා සංශෝධනය හරහා දියත්වන ඒ බෙදුම්වාදී මාර්ග සිතියමේ අවසාන අදියර හමුවේ නිහඬව සිටින සියලුම බලවේග වලට ඉතිහාසය විසින් අත්පත් කර දෙනු ලබන ඉරණම කුමක්දැයි රටේ ඉරණම විසින් තීන්දු කරනු ඇත. ඔවුනට මීට පෙර ඉතිහාසය විසින් කෙසේ සමාව දී තිබුණත් මේ අවසාන පාවාදීමට නම් කිසිදු සමාවක් නොලැබෙනු ඇත.

අනුර දිසානායක න්‍යාය අනුව ජනතා විමුක්ති පෙරමුණට බලය ලබා ගත හැක්කේ සමාජය පීඩාවට පත් වී අසරණ වී මර්දනයට ලක් වන විටය. ඔහුට අනුව ජනතාව තමා දෙසට නැඹුරුවන්නේ රාජ්‍යයේ පීඩනය වර්ධනය වන ප්‍රමාණයට සාපේක්ෂවය. රනිල් වික්‍රමසිංහ පාලනය බලයට ගෙන ඒමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට ජනතා විමුක්ති පෙරමුණ විසින් උපාය උපක්‍රම තෝරන්නේ ඒ න්‍යායාත්මක පදනම මතය. නමුත් දැන් ජනතාව විසින් ඔවුන්ගේ දේශපාලන කේවල් කිරිමේ බලය සීමා කිරීමට තීරණය කිරීම නිසා ඉදිරි ජනාධිපතිවරණයේදී ජයග්‍රාහකයා තේරීම සඳහා කේවල් කිරීමේ බලයක් ඔවුන් සතුව නැත. එම බලය දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ''මෛත්‍රී පාර්ශ්වය'' විසින් උදුරා ගෙන ඇත.

ජනතා විමුක්ති පෙරමුණට දැන් ඉතිරි වී ඇත්තේ දේශපාලන කුලී කරුවාගේ භූමිකාව ය. බෙදුම්වාදී 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ඔවුන් එකගවන්නේ ඒ කුලීකාර භූමිකාවේ ප්‍රධාන කොන්ත්‍රාත්තුව ලෙසය. ඊනියා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හරහා හෝ සෘජුව ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කිරීම මගින් බෙදුම්වාදීන්ගේ අරමුණ අනතුරට වැටෙන තත්වයක් මේ වනවිට රටේ උද්ගත වී ඇත. ඒ අමාරු තත්වයෙන් ආණ්ඩුව ගලවා ගැනීම සඳහා දැන් ජනතා විමුක්ති පෙරමුණ ඉතා කැමැත්තෙන් ඉදිරිපත් ඇත. මේ වන විට ජ.වි.පෙ තුළ බලවත්වී සිටින ''එන්.ජී.ඕ කාරයින්ට'' සහ ගේම් කාරයින්ට එවැනි මහා පාවාදීම් ඉතා සරල ''දේශපාලන ගේම්'' බවට පත් වී ඇත.

ඔවුන්ගේ සැලසුම අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් බැවින් එය අමාත්‍ය මණ්ඩලය වෙත යැවීම සිදු වේ. ඉන් පසු අමාත්‍ය මණ්ඩලය හරහා එය නැවත පාර්ලිමේන්තුවට එන්නේ ආණ්ඩුවේ යෝජනාවක් ලෙස නොව ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවක් ලෙසය. ජ.වි.පෙ අතීත භූමිකාවට සාපේක්ෂව බලන විට එම පාවාදීම සමාන කළ හැක්කේ පියකු විසින් තම දියණිය දූෂණය කිරීම සඳහා කූට්ටාලිකම කිරීම වැනි දුෂ්ට ක්‍රියාවකට ය. එම යෝජනාවේ මුඛ්‍ය අරමුණ ලෙස විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ උවමනාව ඉදිරියට දමනු ඇත. එහෙත් බෙදුම්වාදී බලවේග සමග ඔවුන් ඇතිකර ගන්නා එකගතාවය වන්නේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ඊනියා සුළු සංශෝධන ප්‍රමාණයක් සම්මත කිරීමටය. ඊට අමතරව මහා සංසරත්නය රැවටීම සඳහා මනාප ඡන්ද ක්‍රමය සංශෝධනය කිරීමේ යෝජනාවද ඊට ඇතුළත් කරනු ඇත. ඊට හේතුව මීට පෙර එවැනි යෝජනාවක් මහානායක හිමිවරුන් විසින් ඉදිරිපත් කිරීමය. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ අනුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව පමණක් ජනමතවිචාරණයට ලක් කළ යුතු බව පවසා කල් දැමීමේ හැකියාව ඇත. ඉන් පසුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව ඉදිරි ජනාධිපතිවරණයේ දී නැවත වටයකින් ඊනියා පොදු අපේක්ෂකයෙකුගේ භූමිකාවට සුජාතභාවය ලබා දීම සඳහා යොදා ගනු ඇත.




11

# ජනාධිපතිවරණය දක්වා භාරකාර ආණ්ඩුවක්

ප්‍රධාන මැතිවරණ දෙකක් අතර පවත්වනු ලබන සෙසු මැතිවරණ සැලකෙන්නේ ඒ වන විට පත්වී සිටින ආණ්ඩුවේ ජනවරම නැවත විමසා බලන ජනමත විචාරණයක් ලෙසයි. එය ලෝකයේ පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයකි. ව්‍යවස්ථාවට අනුව ඊළඟට කැඳවිය යුතු ප්‍රධාන මැතිවරණය ජනාධිපතිවරණයයි. ඒ අනුව පසුගිය පුංචි මැතිවරණය ජනාධිපතිවරණ දෙකක් අතර ආණ්ඩුවේ ජනප්‍රියත්වය උරගා බලන ජනමත විචාරණයක් බවට පත්වේ. එම ජනාධිපතිවරණයේ ප්‍රතිඵල අනුව ජනාධිපතිවරයා ලබාගත් ජනවරම බරපතල ලෙස අභියෝගයට ලක්වී ඇත. එම නිසා එම ජනවරමට හිස නමන්නේ නම් ජනාධිපතිවරයා විසින් වහාම ජනාධිපතිවරණයක් කැඳවා නැවත ජනමතයට මුහුණ දීමට ක්‍රියා කළ යුතුය. එය උසස් නායකයකුට ගතහැකි අවම ක්‍රියාමාර්ගයය. එම මැතිවරණයේදී ජනාධිපතිවරයා විසින් පසුගිය කාලය තුළ කරන ලද වැරදි නිවැරදි කිරීම සඳහා න්‍යාය පත්‍රයක් හෙවත් වැඩපිළිවෙලක්

රටට ඉදිරිපත් කළ හැක. එම වැඩපිළිවෙළ පොදු මහත් සමාජය පිළිගන්නා ජාතික වැඩපිළිවෙළක් නම් වර්තමාන ජනාධිපතිතුමාට නැවත වටයකින් පොදු අපේක්‍ෂකයා වීමට බාධාවක් නැත. නමුත් එවැනි උත්සාහයකට වලංගුභාවය ලැබෙන්නේ එතුමා වහාම නිර්පාක්‍ෂික වීම මගින් සහ ජාතික ආණ්ඩුවෙන් ඉවත්වීම මෙන්ම ජනාධිපතිවරණය දක්වා ජනතා අපේක්‍ෂා ඉටු කරන කොන්දේසි වලට එකගවන ආණ්ඩුවක් වහා පිහිටුවීම මගිනි. එවැනි ආණ්ඩුවක් හැඳින්විය හැක්කේ පරිවාස ආණ්ඩුවක් ලෙසය. එම පරිවාස ආණ්ඩුවේ කොන්දේසි තුළින් ඉදිරි ජනාධිපතිවරණයේ දී ජයග්‍රහණය කරන ජාතික වැඩපිළිවෙළ උපදිනු ඇත. නමුත් ජනාධිපතිවරයා විසින් දැන් කරගෙන යනු ලබන රූපලාවන්‍ය වෙනස්කම් මගින් එම අපේක්‍ෂා ඉටුවන්නේ නැත.

## භාරකාර හෝ පරිවාස ආණ්ඩුවක් සඳහා ජාතික සංවිධාන විසින් ඉදිරිපත් කළ කොන්දේසි

01. දැනට ආරම්භ කොට ඇති ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ව්‍යවස්ථා විරෝධි බැවින් එය අත්හිටුවා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසුරුවා හැරීම.

02. මානව හිමිකම් මහකොමසාරිස් වාර්තාව සහ 30/1 යෝජනාව නැවත සලකා බැලීම සඳහා මානව හිමිකම් සමුළුවේ විශේෂ සැසියක් ඉල්ලා යෝජනාවක් සම්මත කිරීම සහ 30/1 අනුව ආරම්භකර ඇති ක්‍රියාවලිය අත්හිටුවීම.

03. චෝදනා නොමැතිව අසාධාරණ ලෙස රිමාන්ඩ් බන්ධනාගාරගත කර සිටින යුද හමුදා නිලධාරීන් නිදහස් කිරීම සහ ඊට අදාළ පසුබිම විමසා බැලීම සඳහා පාර්ලිමේන්තු කමිටුවක් පත් කිරීම.

04. අතුරුදහන්වීම් වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයෙන් ඉවත් කිරීම සහ ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කිරීම.

05. අත්හිටුවා ඇති සියලු මහජන සුබසාධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම.

1. පොහොර සහනාධාරය,
11. සමෘද්ධි සහ වැඩිහිටි සහනාධාරය
111. පෙළ පොත් සහ පාසල් නිල ඇඳුම් සහනාධාරය ආදිය

06. 'සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීම'' නම් වූ නව පනත අත්හිටුවා, බැඳුම්කර වංචාව මහා පරිමාණයෙන් කිරීම සඳහා ගනු ලබන උත්සාහය වැළැක්වීම සහ පසුගිය බැඳුම්කර මගඩිය සහ රටේ ණය බර පිළිබඳව සොයා බැලීමට මෙන්ම වැරදිකරුවන්ට දඬුවම් දීමේ ක්‍රියාවලිය පිළිබඳව සොයා බැලීමට පාර්ලිමේන්තු කමිටුවක් පත් කිරීම.

07. නව පාර්ලිමේන්තු පනතක් සම්මත කොට, අහෝසි කිරීම හෝ රජය යටතේ පවත්වා ගෙන යාම යන ආකාර දෙකෙන් සිසුන් සහ දෙමාපියන් කැමැති ආකාරයකට 'සයිටම් ප්‍රශ්නය' විසඳීම.

08. මූල්‍ය සමාගම් විසින් සුළු ණය සඳහා අය කරන පොලී අනුපාතවල උපරිමයට සීමාවක් පනවා ග්‍රාමීය සහ නාගරික අඩු ආදායම්ලාභී ජනතාව ණය බරින් මුදවා ගැනීම සඳහා පියවර ගැනීම.

09. මිල පාලනය සහ මිල සූත්‍ර හඳුන්වා දීම මගින් අත්‍යවශ්‍ය ආහාර මිල පාලනය කිරීම සහ ආනයන සඳහා විශේෂයෙන්ම කිරි පිටි ආදියට විශේෂ බදු පැනවීම මගින් දේශීය ගොවීන් ආරක්ෂා කිරීම (එම බදු කෘෂිකර්මාන්තයේ සහ ගොවියාගේ දියුණුව සඳහා පමණක් යෙදවිය යුතුය)

10. එට්කා ගිවිසුම අත්සන් නොකිරීම සහ හදිසියේ සහ හොර රහසේ අත්සන් කළ සිංගප්පුරු වෙළඳ ගිවිසුමේ සේවා කොටස අත්හිටුවීම.

## අතුරු කොන්දේසි

i. ජනාධිපතිවරයා නිර්පාක්ෂික වීම.

ii. ජාතික ආණ්ඩු ගිවිසුම අවසන් කිරීම.

iii. ඇමති මණ්ඩලය 30ට සීමා කිරීම.

iii. මැතිවරණ කොමිසමට එරෙහිව පවතින චෝදනා විභාග කිරීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කිරීම.

iv. ඒකාබද්ධ විපක්ෂයේ කමිටු මගින් ඉහත කොන්දේසි අධීක්ෂණය කිරීම

v. කිරිපිටි සහ පාන්පිටි බදු වංචා පිළිබඳ සොයා බැලීමට ජනාධිපති කොමිසමක් පත් කොට මහජනයාගෙන් සහ ගොවින්ගෙන් අදහස් ලබා ගැනීම.

## ඉදිරි ජනධිපතිවරණය දක්වා ඉටුකර ගත යුතු කොන්දේසි:

i. ජනාධිපතිවරයා නිර්පාක්ෂිකවීම සහ ධුරකාලයේ වසර 4 අවසන් වූ වහාම ජනාධිපතිවරණය පැවැත්වීම. (ජාතික ආණ්ඩුවෙන් ඉවත් වී භාරකාර ආණ්ඩුවක් යටතේ එම මැතිවරණය පැවැත්විය යුතුය)

ii. ව්‍යවස්ථාවක් අතින් ගෙන ජනාධිපතිවරණයට ඉදිරිපත්ව එම මැතිවරණය ජනමත විචාරණයක් බවට පත්කරන පොදු අපේක්ෂකයෙක් තරගයට ඉදිරිපත් කිරීම සහ එම අපේක්ෂජකයා මහින්ද රාජපක්ෂ මහතා විසින් තේරීම.

iii. ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයාට වඩා ඔහු විසින් රටට ඉදිරිපත් කරන ජාතික න්‍යාය පත්‍රයට මුල්තැන දීම.

iv. එම න්‍යාය පත්‍රයට සහ වැඩපිළිවෙළට තෛනිකායික මහනායක හිමිවරුන් ප්‍රමුඛ ආගමික නායකයින්ගේ සහ සියලුම ජාතිකවාදී සහ වාමවාදී බලවේග වල ආශිර්වාදය ලබාගැනීම.

v. වර්තමාන ජනාධිපතිවරයාට එම වර්ධනයන් හමුවේ අතර මැද සිට ගැනීමට අවකාශයක් නොදීම. එනම් එතුමා විසින් ජාතික න්‍යාය පත්‍රය සහ වැඩපිළිවෙළ පිළිගැනීම හෝ රටට හතුරු අධිරාජ්‍යවාදී අපේක්ෂා ඉටු කිරීම යන දෙකෙන් එකක් තේරීමට දේශපාලන වාතාවරණය සකස් කළ යුතුය.



12

# ශ්‍රී ලංකාවට එරෙහි ඇමෙරිකානු ''මායාකාර යුද්ධය''තුළ 2019 මැතිවරණ වසරේ ක්‍රියාන්විතය

දෙවන ලෝක යුද්ධයෙන් පසුව සමස්ත ලෝකය දීර්ඝකාලීනව තම අණසකට යටත් කර තබා ගැනීම සඳහා ඇමරිකාව විසින් දියත් කළ ''මායාකාරී යුද්ධය'' හෙවත් රැවටීමේ යුද්ධය අද වන විට මහා පරිමාණ ගෝලීය ක්‍රියාන්විතයක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකාවට අදාළව ගත් විට ඉන්දියාව, ජපානය සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල් එම ''යුද්ධයේ'' ප්‍රබල පාර්ශ්වකරුවන් බවට පත් වී ඇත. ඉතා සූක්ෂ්ම මානසික යුද උපක්‍රම යොදා ගනිමින් පවත්වාගෙන යන එම රැවටීමේ යුද්ධයේ සෙනෙවියන් ලෙස කටයුතු කරන්නේ ඇමරිකානු තානාපතිවරුන්ය. දෙස් විදෙස් රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරිකයන් එම යුද්ධයේ සොල්දාදුවන් ලෙස කටයුතු කරති.

ඒ සමස්ත ගෝලීය ක්‍රියාන්විතයට නායකත්වය දෙන්නේ 1946 දී පිහිටවූ සී.අයි.ඒ සංවිධානය හෙවත් ඇමරිකානු මධ්‍යම රහස් ඔත්තු සේවය විසිනි. ඊට සහාය ලබා දෙන ආයතනය ඇමරිකානු තොරතුරු ඒජන්සිය යි. එම සහායක ආයතනය මගින්

පර්යේෂණාත්මක දත්ත විශ්ලේෂණය සහ ප්‍රචාරක ව්‍යාපාර සැලසුම් කිරීම සිදු කරයි. සී.අයි.ඒ සංවිධානය විසින් ලෝකය පුරා ක්‍රියාන්විත දියත් කිරීම සඳහා ඉදිරි පෙළ සංවිධාන ලෙස හැඳින්වෙන රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ද පිහිටුවා ඇත. ඉන් සමහර සංවිධාන ඇමරිකානු රජයට ඍජුව අනුබද්ධව කටයුතු කරන අතර ඒවාට ඇමරිකානු නීතිය යටතේ ආරක්ෂාව සැපයේ.

එවැනි එක් ප්‍රධාන සංවිධානයක් වූයේ ජාත්‍යන්තර ස්වේච්ඡා සේවාව හෙවත් අයි.වී.එස් සංවිධානයයි. වියට්නාමයේ කොමියුනිස්ට් ව්‍යාපාරයට එරෙහිව මහජනයා පෙළඹවීම සඳහා දියත් කළ මානසික යුද ක්‍රියාන්විතයේ බිම් මට්ටමේ සොල්දාදුවන් ලෙස ක්‍රියා කළේ එම ඊනියා ස්වේච්ඡා සේවකයන්ය. ඔවුන් සෞඛ්‍ය, අධ්‍යාපන ආදී සේවා සැපයීම මුවාවෙන් වියට්නාමය තුළ ක්‍රියාත්මක වීය. ඔවුන් විසින් සිදු කළ මානසික යුද අපරාධ හෙළිදරව් වීම නිසා මෙම සංවිධානයේ නම වෙනස් කරන ලදි. ඒ අනුව 'සාම බලකා ස්වේච්ඡා සේවාව' හෙවත් පී.සී.වී යනුවෙන් නව සංවිධානයක් බිහි විය. නමුත් අරමුණු සහ ක්‍රියාන්විතය වෙනස් නොවුණි.

මේ වන විට ලක්ෂ 2 කට ආසන්න මෙම ඊනියා ඇමරිකානු ස්වේච්ඡා සේවකයින් ලෝකයේ රටවල් 141ක ක්‍රියාත්මක වේ. ලෝකය පුරා ඇමෙරිකානු හිතවාදී ආණ්ඩු ආරක්ෂා කිරීමට සහ ඇමෙරිකානු විරෝධී ආණ්ඩු පෙරළා දැමීම සදහා මෙම ''ගෝලීය සාම බලකාය'' සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන බවට ප්‍රබල සාක්ෂි ඇත. ඔවුන්ගේ ප්‍රධාන භූමිකාව වන්නේ මානව හිමිකම් යොදා ගනිමින් යුද්ධය විකිණීමය. පසුගිය පෙබරවාරි 26 වැනිදා ශ්‍රී ලංකාවේ අගමැති කාර්යාලයේ දී අත්සන් කළ ගිවිසුම අනුව මේ ඊනියා සාම හමුදාව සිය ගණනින් හෝ දහස් ගණනින් තව නොබෝ දිනකින් ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත. එවිට එම රටවල් ප්‍රමාණය 142ක් වනු ඇත. නමුත් චීනය විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති යුදමය සහ භූ දේශපාලන වටිනාකම නිසා ඒ රටවල් සියල්ලම අතුරින් ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතියට ප්‍රමුඛතාවයක් හිමි වන බවට සැකයක් නැත. මෙම ඊනියා සාම බලකා ස්වේච්ඡා සේවකයින් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මුවාවෙනි.

මීට පෙර 1998 දක්වා එම බලකාය යම් ප්‍රමාණයකට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය. නමුත් අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සහ තානාපති අතුල් කේෂාප් අතර අත්සන් කළ ගිවිසුම අනුව ඔවුන් දැන් මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වනු ඇත. ඊට පෙර ඔවුන් ශ්‍රී ලංකාව තුළ තම මානසික යුද ක්‍රියාන්විත දියත් කළේ දේශීය සහ වෙනත් විදේශීය රාජ්‍ය නොවන සංවිධාන ජාලයන් හරහා ය. ඒ අනුව සාම බලකාය විවෘත ව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවීය. ශ්‍රී ලංකාව වැනි රටක වඩා පරිස්සම් වීම සඳහා ද එම උපක්‍රමය ඔවුන්ට වැදගත් වේ. යහපාලන ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා ඉන්දියානු සහ ඇමෙරිකානු ඔත්තු සේවා විසින් දියත් කළ ඒකාබද්ධ ක්‍රියාන්විතය බිම් මට්ටමේ දී දියත් කරනු ලැබුවේ රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් විසිනි.

ඇමරිකාවේ හිටපු රාජ්‍ය ලේකම් ජෝන් කෙරී මහතා රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2015 වාර්තාවට සැපයූ ප්‍රකාශයක් අනුව ඇමරිකාව විසින් ශ්‍රී ලංකාවේ, බුරුමයේ සහ නයිජීරියාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සඳහා ඩොලර් මිලියන හයසිය අසූවක් ආයෝජනය කොට ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ යහපාලන ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා ඔවුන් අඩුම තරමින් රුපියල් මිලියන තිස් දාහක් (30,000) රාජ්‍ය නොවන සංවිධාන අතර බෙදා දී ඇත කෙසේ වෙතත් ඒ රාජ්‍ය දෙපාර්තමේන්තුව නිල වශයෙන් පිළිගන්නා ප්‍රමාණය පමණි. වෙනත් අරමුදල් සහ ඉදිරිපෙළ ආයතන හරහා වියදම් කළ මුදල් ප්‍රමාණය සොයා ගත හැක්කේ සමස්ත රාජ්‍ය නොවන සංවිධාන ජාලයේ ගිණුම් සහ ඒවායේ නායකයින්ගේ බැංකු ගිණුම් සහ සෙසු වත්කම් පරික්ෂා කිරීමෙනි.

ඊට පෙර නෝර්වේජියානු ආධාර වැඩ වැඩසටහන් දියත් කළ් නෝරාඩ් ආයතනය විසින් සකස් කළ සාමයේ ඉත්තෝ නම් වූ වාර්තාවට අනුව 2001 සිට 2010 වන විට නෝර්වේ රජය විසින් රාජ්‍ය නොවන සංවිධාන වෙත ඩොලර් මිලියන 280ක් ලබා දී ඇත. එම වාර්තාව මගින් රාජ්‍ය නොවන සංවිධාන අතුරින් ප්‍රධාන ඒවා නම් වශයෙන් සඳහන් කොට තිබිණි. පාක්‍යසෝති සරවනමුත්තු

සහ ජෙහාන් පෙරේරා වැනි අද ඊනියා සංහිඳිය ව්‍යාපෘතියේ නියමුවන් බවට පත් වී සිටින පුද්ගලයින්ගේ සංවිධාන ද ඊට අයත් විය. එදා සාමය නමින් සහ මෙදා 'සංහිඳියාව' නමින් මෙම සංවිධාන වලට ගෙවන ලද සැබෑ මුදල් ප්‍රමාණය සහ වාර්තාවල සඳහන් ප්‍රමාණය අතර බරපතළ වෙනස්කම් තිබිය හැකි බව කුඩා දරුවකුට වුවද තේරුම් ගත හැක.

කෙසේ වෙතත් එම සංවිධාන විසින් මුදල් ලබා ගත්තත් 'එන්.ජී.ඕ. කාරයින් වැඩේ හරියට නොකළ බව' අදාළ වාර්තාවේ සඳහන් විය. එවැනි වූ ක්‍රියාන්විතයක් මගින් සුඩානයට කළ දේ ශ්‍රී ලංකාවට කළ නොහැකි වන්නේ එම ඩොලර් කාක්කන්ට වැඩේ හරියට කළ නොහැකි වූ නිසා බවට විවාදයක් නැත. පසුගිය යහපාලන ව්‍යාපෘතිය සඳහා දායක වූ ඩොලර් කාක්කන් පිරිසගේ තත්ත්වය චාල්ස් අබේසේකර වැනි එන්.ජී.ඕ. රාජාලීන් සමග සැසඳීමේදී ඔවුන් අගුටු මිට්ටන් බව පැහැදිලි වේ. නමුත් අගුටුමිට්ටන්ට ලොකු වැඩක් කළ හැකි වූයේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ මහ මොළකරුවන් ගේ මොළය නිසි තැන නොතිබූ නිසා විය හැක. පෙබරවාරි 10 ඡන්ද ප්‍රතිඵල අනුව ඒ අගුටුමිට්ටන්ගේ භූමිකාව තවදුරටත් අභියෝගයට ලක් වී ඇත. දැන් ඇමෙරිකානු සාම බලකායේ සෙබළුන් සෘජුව ''වැඩේට බස්සන්නේ'' එම යථාර්ථය තුළ බව පැහැදිලි ය.

නමුත් යහපාලන ආණ්ඩුවට අතුල් කේෂාප්ලා ලබා දුන් කොන්ත්‍රාතුව රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් බොහෝ දුරට ඉටු කර අවසන් ය. ජිනීවා හි මානව හිමිකම් කවුන්සිලය හරහා ක්‍රියාත්මක වන ඇමෙරිකානු න්‍යාය පත්‍රය හෙවත් 30/1 යෝජනාවට සම අනුග්‍රහය දැක්වීම ඉන් ප්‍රධාන එකකි. එතැන් පටන් එම යෝජනාවට අදාළ කොන්දේසි සහ ඩයස්පෝරාව සතුටු කිරීම සඳහා අවශ්‍ය සෙසු කොන්දේසි සියල්ල ඉටු කිරීම සඳහා රනිල් වික්‍රමසිංහ මහතා නොපැකිලව ඉදිරිපත් විය. හමුදා ඔත්තු සේවා නිලධාරීන්

සිරගත කිරීමෙන් පටන්ගෙන දැන් ගෝඨාභය රාජපක්ෂ මහතා හඹා යාම දක්වා එම ක්‍රියාවලිය ඉදිරියට යමින් ඇත. අතුරුදහන්වූවන්ගේ කාර්යාලය හරහා ඒ ගමන ඉතා ශීඝ්‍රයෙන් ඉදිරියට යනු ඇත. දැන් ජාතිවාදී සෝෂාව තුළ අතුරුදහන්වීම් වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත ද බලහත්කාරයෙන් සම්මත කරනු ලැබීය. ඒ අනුව ඉතා කෙටි කලකින් සමස්ත ආරක්ෂක හමුදාව දුර්මුඛ කොට දුර්වල කිරීමේ අරමුණු ඉටුකර ගැනීම අමාරු නැත. ඒ සඳහා නිලධාරින් කිහිප දෙනකුට දඬුවම් කිරීම සෑහේ.

රනිල් වික්‍රමසිංහ මහතාට නව ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තව ම අවසන් කළ නොහැකි වුවත් ඒකාබද්ධ විපක්ෂය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට පටලවා ගැනීම මගින් ඔහුගේ දක්ෂකම ඇමරිකාවට පෙන්විය දැන් රඟ දැක්වෙන ඔළුගෙඩි මාරු සෙල්ලමෙන් ඔහු ජය ගත් වහාම 13 වැනි සංශෝධනය බලාත්මක කරන ඊනියා ''සුළු'' ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර දීමට ඉදිරිපත් වන බවට සැකයක් නැත. දයාන් ජයතිලක වැනි ඒකාබද්ධ විපක්ෂයේ උපදේශකයන්ට අනුව 13 බලාත්මක කරන සුළු සංශෝධන වලට විපක්ෂය සහාය දිය යුතුය. ඊට අමතරව රටේ සමස්ත ආර්ථිකය ගෝලීය කොල්ලකාරී ආර්ථික උපායමාර්ගවලට අනුකූල වන ලෙස වෙනස් කිරීම සඳහා රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමාගේ බටහිර ස්වාමිවරුන්ට පොරොන්දු වූ කොන්දේසි රාශියක් දැනටමත් ඉටුකර ඇත.


නව විදේශ විනිමය පනත සහ දේශීය ආදායම් පනත මගින් කළු සල්ලි ජාවාරමට සහ ශ්‍රී ලංකාවේ දේපල විදේශිකයන් විසින් අත්පත් කරගැනීමට අවශ්‍ය පහසුකම් සියල්ල සලසා ඇත. ඔහු විසින් සිංගප්පූරු නිදහස් ගිවිසුම හොර රහසේ අත්සන් කළ අතර ඉතා කෙටි කලකදී ''එට්කා'' සාකච්ඡා අවසන් කිරීමට ද දින නියම කොට ඇත. මත්තල ගුවන්තොටුපළ ඉන්දියාවට සහ ත්‍රිකුණාමල වරාය සිංගප්පූරු සමාගමක් හරහා අමෙරිකාවට සහ ජපානයට බදු දීමට ද සියලු මූලික කටයුතු අවසන් කොට ඇත. දැන් ප්‍රධාන වශයෙන් ඉතිරි වී ඇත්තේ එක් කොන්දේසියක් පමණි. ඒ ඊනියා

සුළු ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ආපසු හැරෙන්නට නො හැකි සේ බෙදුම්වාදයට රට තල්ලු කිරීම ය. ඒ නිසා එය ඉටු කරදෙන තෙක් රනිල් වික්‍රමසිංහ මහතා අගමැති පුටුවේ තබා ගැනීමට අතුල් කේෂාප්ලා කළ හැකි සියල්ල කරන බවට සැකයක් නැත. එපමණක් නොව ඉදිරි ජනාධිපතිවරණය කලින් පැවැත්වීම වැළැක්වීම සහ පෙබරවාරි 10 ඡන්ද ප්‍රතිඵලය එම ජනාධිපතිවරණයේ දී නැවත ප්‍රතිනිර්මාණය කිරීම වැළැක්වීම සඳහා ද ඔවුන් කළ හැකි සියල්ල කරනු ඇත. පුංචි මැතිවරණ ප්‍රතිඵලය තුළ දක්නට ලැබෙන ප්‍රධාන උපාය මාර්ගික මඟ සලකුණු දෙකක් පිළිබඳව අතුල් කෝෂාප්ලා වියරු වැටීම පුදුමයට කරුණක් නොවේ. දැන් ඔවුන් ඇමෙරිකානු සාම බලකායට සෘජුව වැඩේ බාර දීමට උත්සාහ කරන්නේ ඒ නිසාය.

පළමු ලකුණ වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද සහ මෛත්‍රී පාර්ශ්ව එක බලවේගයක් බවට පත්වී ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත් වන තත්ත්වයකදී ඔවුන්ගේ ජයග්‍රහණය ඉර හඳ සේ සහතික වීමය. අංක ගණිතමය වශයෙන් ගත්තද එම බලවේගය විසින් ලබාගත් සමස්ත ඡන්ද ප්‍රතිශතය 57%කි. ඔවුන් දකින දෙවැනි ''සොහොන් ලකුණ'' වන්නේ සියලූ සුළු ජාතික ජාතිවාදී බෙදුම්වාදී පක්ෂ සතුව තිබූ රජුන් තනන්නාගේ භූමිකාව ඔවුන්ට අහිමි වීමය. ජනතා විමුක්ති පෙරමුණ විසින් එම භූමිකාව අත්පත් කර ගැනීමට උත්සාහ කළ ද එය මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් උදුරා ගන්නා ලදි.

ඒ නිසා ඉහත සඳහන් කළ මූලික උපායමාර්ගික වාසිදායක කොන්දේසි දෙක අහෝසි කිරීම සඳහා රටට හතුරු සියලු බලවේග එක් පෙළට සිට ගන්නා බවට කිසිදු සැකයක් නැත. ඒ සඳහා විවිධ ඔත්තු සේවා විසින් නඩත්තු කරන පුද්ගලයින් දැනටමත් මුහුණුපොත් හරහා වැඩ ආරම්භ කොට ඇත. ඔවුන් විසින් පතවා ඇති මානසික බාධක යම් පමණකට සාර්ථක වී ඇත. මෛත්‍රී සහ මහින්ද පාර්ශ්ව එක ජාතික බලවේගයක් බවට පත් කිරීමේ උපායමාර්ගික වැදගත්කම යම් කෙනෙකුට අවබෝධ වී තිබුණ ද ඔවුන් ඒ ගැන විවෘතව කතා කිරීමට මැලි වන්නේ ඒ නිසාය. එම තත්ත්වය වෙනස් කිරීමට

කොන්ද පණ ඇති ජාතික නායකයින් සහ මහා සංඝරත්නය වහා ඉදිරි ඉදිරිපත් නොවුණහොත් ඉතිහාසය විසින් නිර්මාණය කළ මනරම් අවස්ථාව අහිමි කිරීමේ වරදට ඔවුන් සියලු දෙනාට ඉතිහාසය විසින් දඬුවම් දෙනු ඇත. ඇමරිකානු සාම බලකාය කැඳවා මහා පරිමාණ මානසික යුද ක්‍රියාන්විතයක් දියත් කිරීමට අතුල් කේෂාප්ලා උත්සාහ කරන්නේ එම අමාරු තත්වය වෙනස් කිරීම සඳහා ය.



# 13

## ජාතිවාදී ගැටුම්වලින් වාසි අත්වන්නේ කාටද?

සිංහල හා මුස්ලිම් තරුණයන් දෙදෙනකු අතර ඇති වූ පුද්ගලික ගැටුමක් නිසා එක් අයකු මියයාම සමග ජාතිවාදී ගැටුමක් ඇවිලවීමට දෙපාර්ශවයේම අන්තවාදීන් අතලොස්සක් සමත් වී ඇත. එසේ යම් හුදකලා සිද්ධියක් මුල් කරගෙන පුපුරා යන්නේ දීර්ඝ කාලයක් තිස්සේ ජන කොටස් අතර පැවැති අසහනකාරී තත්ත්වයකි. එම තත්වය ක්‍රමානුකූලව සමාජය තුළ වර්ධනය වන බව පෙනුනත් එය උත්සන්න කිරීමට යම් පිරිසක් දැනුම්වත්ව සහ සැලසුම් සහගතව ක්‍රියාත්මක වන බව පැහැදිලිව පෙනේ. මීට පෙර ජාතික සංවිධාන විසින් පෙන්වා දුන්නේ දෙපාර්ශවයම දිනපතා ‘පෙට්‍රල්’ හලමින් යන බැවින් එක් පුද්ගලයකුට වුව ද ඕනෑම මොහොතක ගිනිකූරක් ගසා ගිනි ඇවිලවිය හැකි බවය. ඉතා සරලව ගත්හොත් 10%කට ආසන්න ප්‍රතිශතයක් සහිත ජන කොටසක් විසින් සමාජය තුළ ඇති වන ඕනෑම ගැටුම් 10කින් එකක් නියෝජනය කිරීමේ සම්භාවිතාවක් ඇත. අවශ්‍ය වන්නේ එවැනි ගැටලුවක් පැන නැගී එන තුරු නිරන්තර

අවධානයෙන් පසුවීම සහ එම නිශ්චිත අවස්ථාවේදී ගිනිකූරක් ගසා විසි කිරීම පමණි.

ඒ සඳහා යෙදවිය යුත්තේ මුදලට වැඩ කරන හෝ මානසික ව්‍යාධියකින් පෙළෙන අන්තවාදීන් ඉතා සුළු පිරිසකි. ගිනිකූර ගැසූ සැණින් ඇවිලෙන ගින්නට පිදුරු සහ 'පෙට්‍රල්' විසි කිරීමට දහස් ගණනින් නොමිලයේ සේවය කරන පිරිස් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙති. එම පිරිස වැඩි වන්නේ සමාජය තුළ ජනවාර්ගික වෛරය පතුරුවා ඇති ප්‍රමාණයට සාපේක්ෂව ය. මුස්ලිම් සහ සිංහල ජනතාව අතර අවිශ්වාසය සහ සැකය වර්ධනය කිරීමට එම දෙපාර්ශවය ම දායක වේ. එහෙත් ශ්‍රී ලංකාවේ බෞද්ධ මූලධර්මවාදයක් නැත. බෞද්ධ ආගමිකයින් අතර ආගමික අන්තවාදයක් හෝ මූලධර්මවාදයක් වර්ධනය කිරීම සඳහා එම ආගම පදනම් වන දර්ශනය තුළින් ම අවකවකාශයක් ලැබෙන්නේ නැත. නමුත් බටහිර අධිරාජ්‍යවාදී පාලන සමයේ සිට ආක්‍රමණිකයා විසින් ඍජුව බෞද්ධයාට එරෙහිව සිදු කරන ලද අකටයුතු කම් රාශියක් ඇත. ඊට අමතරව ඔවුන් විසින්ම ජනකොටස් අතර සිතා මතා ගැටුම් ඇති කිරීම සඳහා සිදු කරන ලද අකටයුතුකම් ද රාශියක් ඇත. ඒ නිසා පොදුවේ බෞද්ධයා තුළ අනාරක්ෂිත මනසක් ගොඩනැගීම ස්වාභාවික තත්වයකි. නිදහසින් පසු බලයට පත්වූ සෑම ආණ්ඩුවක්ම සුළුජාතික, ජාතිවාදී කල්ලි කණ්ඩායම්වල කේවල් කිරීමේ බලයට යටත් වීම නිසා බෞද්ධයා තුළ ඓතිහාසිකව ගොඩනැගී තිබෙන අනාරක්ෂිත මනෝභාවය තවදුරටත් වර්ධනය වේ.

එම මනෝභාවයෙන් පටු දේශපාලන වාසි ලබා ගන්නා සිංහලයන් අතලොස්සක් විසින් ඉතා සැලසුම් සහගතව සහ සූක්ෂ්මව එම මනෝභාවය පෝෂණය කොට දීර්ඝ කාලීනව හදාවඩාගන්නා බව ද රහසක් නොවේ. සෝම හාමුදුරුවන් විසින් නියෝජනය කළ පොදු සමාජයේ වැඩෙමින් තිබෙන අනාරක්ෂිතභාවය එම සිංහලයින් විසින් තම දේශපාලන ව්‍යාපාරයේ වර්ධනය සඳහා මනා ලෙස ප්‍රයෝජනයට ගත් ආකාරය ද සමාජයට රහසක් නොවේ. උන්වහන්සේගේ මරණයෙන් පසුව එම දේශපාලන ව්‍යාපාරයට

පිම්මකින් ඉදිරියට පැමිණීමට හැකි වන්නේ බොර දියේ මාළු බෑමට ඔවුන් විසින් පෙන්වන දක්ෂතාව ය නිසා ය.

අනෙක් පැත්තෙන් ගත්විට අප රටේ බෞද්ධ ආගමික මූලධර්මවාදයක් නැතත් මුස්ලිම් මූලධර්මවාදයක් සහ ඒ තුළින් මතුවන අන්තවාදී දේශපාලන බලවේගයක් ඇත. එය ලෝක පරිමාණයෙන් පවතින තත්වයකි. අප රටේ දී එම බලවේග විසින් තවමත් ආගමික ත්‍රස්තවාදයක් බිහි කිරීමට අසමත් වී ඇත. එහෙත් දැන් පැනනැගෙන ජාතිවාදී ගැටුම් තුළ මුස්ලිම් තරුණ කොටස් ජාත්‍යන්තර මූලයන් සහිත මුස්ලිම් ත්‍රස්තවාදී සංවිධාන වෙත ඇදී යාමේ අනතුර වර්ධනය වේ. එසේම අතිබහුතරයක් වන සාමකාමී මධ්‍යස්ථ මුස්ලිම් ප්‍රජාව අතර මූල්ධර්මවාදී හැසිරීම් පැතිරවීම්ට අන්තවාදීන් විසින් භාවිතා කරන විවිධ උපක්‍රම සාර්ථක වී තිබෙන බව ද පෙනේ. උදාහරණයක් ලෙස මීට වසර 20-30 කට පෙර මුස්ලිම් කාන්තාවන් අතර ප්‍රචලිතව නොතිබුණු 'බුර්කාව' දැනුම්වත්ව ඉතා ශීග්‍රයෙන් ප්‍රචලිත කිරීමට මූලධර්මවාදීන් සමත්වී ඇත. එසේම අරාබි පාසල් ප්‍රචලිත කිරීම මඟින් මුස්ලිම් තරුණ, තරුණියන් බහුතර සිංහල ජනතාවගෙන් දුරස් කොට හුදකලා කිරීම සිදු වේ. වෙනස් ලෙස පෙන්වීම මගින් දුරස් වීම සිදු වේ. දුරස් වීම තුළින් සැකය සහ අවිශ්වාසය වර්ධනය වේ.

**ඉහත කරුණු අනුව චම්පික රණවකලා සහ රිෂාඩ් බදුර්දීන්ලා එකිනෙකාට සේවය කරමින් තම තමාට ද සේවය කර ගන්නා ආකාරය මැනවින් පැහැදිලි වේ.** දැන් ගැටුම ඇවිලී ඇත. එහි සැබෑ දීර්ඝකාලීන අවාසිදායක ප්‍රතිඵලය මළමිනී ගණන අනුව තීරණය නොවේ. 1915 මුස්ලිම් - සිංහල ජාතිවාදී කෝලාහලය සහ 1983 සිංහල දෙමළ ජාතිවාදී කෝලහලය සමඟ සැසඳීමේදී මෙවර දක්නට ලැබෙන මරණ සංඛ්‍යාව හෝ ගිනි තැබූ ව්‍යාපාරික ස්ථාන ප්‍රමාණය මහා පරිමාණ නොවන බවට විවාද කළ හැක. එහෙත් මෙවර දෙපාර්ශවයේම සිත් තුළ ඇති වන වේදනාව සහ වෛරය අන්

කවර අවස්ථාවකදීටත් වඩා ඉහළ මට්ටමක පවතින බවට විවාදයක් නැත. විශේෂයෙන්ම සමාජ වෙබ් අඩවි ජාලය යොදාගෙන කරනු ලබන මානසික යුද්ධය ඉතා හානිකර වේ.

එදා 1983 දී ගැටුම් ඇවිලවීම සඳහා මූලික හේතුව බවට පත්කරගත් හමුදා නිලධාරීන් දහතුන් දෙනකු මරා දැමූ බිම් බෝම්බය වැනි බෝම්බයක් නිෂ්පාදනය කිරීමට සඳහා ඒ වනවිට එල්.ටී.ටී.ඊ සංවිධානයට තාක්ෂණික දැනුම නොතිබූ බවට සාක්ෂි ඇත. එම නිසා එම ක්‍රියාව සඳහා ඉන්දියානු රෝ ඔත්තු සේවාව උදව් කළ බවට එල්ල වන චෝදනාව බැහැර කළ නොහැක. එසේම එදා කොළඹ නගරයේ ද්‍රවිඩ ව්‍යාපාරික ස්ථාන ගිනි තැබූ යම් සංවිධානාත්මක පිරිස් සිතියම් බලමින් ක්ෂණිකව සහ නිශ්චිතව ස්ථාන හඳුනා ගත් බවට ද සාක්ෂි ඇත. මෙවර ද දිගන ආශ්‍රිත ප්‍රදේශවල සිදු කළ ගිනි තැබීම්වල දී ද ලොරිවලින් පැමිණි බාහිර පිරිස් විසින් කලින් හඳුනාගෙන තිබූ බවට සැක කළ හැකි ආකාරයට ස්ථාන තෝරා ගිනි තැබූ බවට සහ සාක්ෂි ඇත. මේ සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ ඉතිහාසය නැවත නැවත ප්‍රතිනිර්මාණය කෙරෙන බව නොවේ ද? 1915 දී සිදු වූ ගැටුම යොදා ගනිමින් ජාතික නිදහස් ව්‍යාපාරයේ නායකයන් මර්දනය කරන්නට අවශ්‍ය තත්ත්වය නිර්මාණය කෙරිණි. 1983 දී ද එසේම සිදුවිය. ඊට අමතරව එමගින් එල්. ටී. ටී. ඊ සංවිධානයේ නවකයන් බඳවා ගැනීම් ප්‍රමාණය සිය ගුණයකින් ඉහළ දැමීමට ද හැකි විය. ඊට අමතරව දීර්ඝකාලීනව ජාතිකත්ව අතර විරසකය දිගින් දිගටම වර්ධනය කර පවත්වා ගැනීමට එම මතකය උපයෝගී වේ.

අද පවතින තත්වය අනුව පැනනැගුන සිංහල - මුස්ලිම් ගැටුම් තුළින් කුමන පිරිස්වලට කුමන වාසි ලැබේ ද යන්න විමසා බැලිය යුතුය. ඒ මගින් ආණ්ඩුවේ න්‍යාය පත්‍රයට මෙන්ම ජාත්‍යන්තර බෙදුම්වාදී න්‍යාය පත්‍රයට බරපතළ වාසි අත්වේ. ඊට අමතරව ලෝකය පුරා. පතුරුවන ඇමරිකානු රැවටීමේ යුද්ධය සඳහා අවශ්‍ය බිම් මට්ටමේ සොල්දාදුවන් නිර්මාණය කිරීමද ඒමගින් සිදුවේ. අද අයි.එස් අන්තවාදී මුස්ලිම් ත්‍රස්තවාදයෙන් වැඩිම වාසි අත් වන්නේ

ඇමෙරිකානු යුද න්‍යාය පත්‍රයට බව ලෝකයට රහසක් නොවේ. ආණ්ඩුව පැත්තෙන් ගත්විට ගැටුමක් ඇතිවිය හැකි වාතාවරණයක් ගොඩනැගෙන බව පැහැදිලි ව දක්නට තිබියදී පවා ක්ෂණිකව තීන්දු නොගත්තේ කුමක් නිසාද? සිහිසුන් වන තුරු තරුණයාට පහර දුන් පිරිස් අත්අඩංගුවට ගෙන නිදහස් කරන්නේ මුස්ලිම් අන්තවාදී දේශපාලකයන්ට තිබෙන බිය නිසා ද? එසේ නැතහොත් ගැටුම් ඇවිලවීමට ඉඩ හැර වාසි ලබාගැනීමට ද?

කෙටිකාලීනව ගැටුම් ඇවිලී ගිය දින කිහිපය තුළ ආණ්ඩුව විසින් ලබාගත් වාසි රාශියක් ඇත. පළමුවෙන්ම පෙබරවාරි 10 මැතිවරණ ප්‍රතිඵලය විසින් රට තුල වර්ධනය කළ ආණ්ඩු විරෝධී මනෝභාවයේ උණුසුම නිශේධ කිරීමට මෙම ගැටුම් හේතු වී ඇත. දෙවනුව මෙතෙක් කාලයක් රට තුළ සහ පාර්ලිමේන්තුව තුළ ප්‍රබල විරෝධයට ලක් වූ පනත් දෙකක් බලහත්කාරයෙන් සම්මත කර ගැනීමට ආණ්ඩුව සමත් විය. ගැටුම්කාරී තත්ත්වය නිසා ඊට එරෙහිව විරෝධයක් එල්ල කිරීම්ට ජාතික බලවේග පවා අසමත් විය. ඒ අතුරින් පළමු පනත අතුරුදන් කිරීම් වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත හෙවත් 'රණවිරු දඩයම්' පනතයි. එමගින් ආරක්ෂක හමුදා නායකයන්ට එරෙහිව ගොතන ලද චෝදනා මත ඔවුන්ට වෙනත් රටක දී නඩු දැමීම සඳහා රටින් පිටුවහල් කිරීමට පවා ප්‍රතිපාදන සැලසෙයි.

දෙවන පනත, ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතයි. අඩු මිලට භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ වෙළඳපළ විකෘති කිරීම වැළැක්වීම එම පනතේ ප්‍රකාශිත අරමුණයි. නමුත් සැබෑ ලෙසම ඒ මඟින් සිදුවන්නේ ඊට එරෙහිව ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගවලට එරෙහිව පියවර ගැනීමට මහා සමාගම් වලට අවස්ථාව ලැබීම යි. ලෝක වෙළඳ සංවිධානය විසින් එම පනත සම්මත කරන ලෙස බල කරන්නේ 1994 සිට ය. චන්ද්‍රිකා පාලන සමයේදී 2004 දී ඒ සඳහා ගත් උත්සාහය ජනතා විමුක්ති පෙරමුණ විසින් ව්‍යර්ථ කරනු ලැබීය. දැන් සිංහල - මුස්ලිම් ගැටුමට

පින්සිදුවන්නට බාරගත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ආණ්ඩුව සමත් වී ඇත. රණවිරු දඩයම් පනත ගත්විට එම පනත විවාදයට ගැනීමට ඉඩ නොදෙන බවට ජනාධිපතිතුමා විසින් මහා සංඝරත්නයට පොරොන්දු විය. නමුත් සිදුවී ඇත්තේ ඊට ප්‍රතිවිරුද්ධ දෙයක් ම ය.

එය සිදුවිය හැක්කේ තුන් ආකාරයකින් එක් ආකාරයකට පමණි. පළමුවැන්න, ජනාධිපතිතුමා සිතා මතා මහා සංඝරත්නයට බොරු පොරොන්දු ලබා දී පසුව හොර රහසේ ඊට අනුමැතිය ලබා දීමය. දෙවැන්න ජාත්‍යන්තර බල බලපෑම් මත අසරණ ව ඔවුන් ඉදිරියේ දණ ගැසීම ය. තුන්වැන්න, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා විසින් ජනාධිපතිවරයා අමාරුවේ දමන අතර තම අරමුණද ඉටුකර ගැනීමය. සිදුවී ඇත්තේ කුමක් වුවත් එක් පැත්තකින් අගමැතිවරයා ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවලට ලබා දුන් තවත් පොරොන්දුවක් ඉටු කිරීමට සමත් වී ඇත. අනෙක් පැත්තෙන් ඒ මහා පාවාදීමේ පාපය ජනාධිපතිවරයා මත පැටවීම මගින් ජාතික බලවේග අතර එතුමා බලවත් අප්‍රසාදයට ලක් කොට ඇත. ඒ මගින් තවත් විශේෂ වාසියක් ද ආණ්ඩුව සහ බෙදුම්වාදී බලවේග විසින් අත්පත්කරගෙන ඇත. එනම් ඉදිරි ජනාධිපතිවරණයේදී මහින්ද - මෛත්‍රී බලවේග එකතු කිරීම සඳහා යම් ඉඩක් තිබේ නම් ඊට බාධා වන ආකාරයට මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රතිරූපය තවදුරටත් විනාශ කිරීමය.

බෙදුම්වාදී උවමනාවට සාපේක්ෂව ගත් විට මූලික වශයෙන් පොදු මුස්ලිම් ජන මනස දෙමළ බෙදුම්වාදයට පක්ෂපාතී ස්ථාවරයකට නැඹුරු කිරීම සඳහා මෙම ගැටුම විශාල වශයෙන් උපකාරී වේ. එනම් එදා 1983 කළු ජූලිය මගින් සාමාන්‍ය දෙමළ ජනතාවගේ මනස තුළ සිදු කළ විපර්යාසයට සමාන තත්ත්වයක් ඇති වේ. ඒ තුළ උතුරු නැගෙනහිර ඒකාබද්ධ කිරීමේ දී ඇති විය හැකි මුස්ලිම් ජනතාවගේ විරෝධය සමනය වේ. ඒ සමඟ ඒ තුළ මුස්ලිම් අන්තවාදය ද පෝෂණය වේ. ඒ මඟින් අයි.එස් වැනි සංවිධාන ශ්‍රී ලංකාව තුල සංවිධානගත කිරීමට ද පහසු ඉඩකඩක් විවර වේ. අවසානයේ දී පකිස්තානයේ මෙන් ප්‍රචණ්ඩත්වය සංස්ථාගත කිරීම සිදු වන අතර යුද්ධයක් නොමැති ව නිරන්තරයෙන් මළමිනී ගණින තත්ත්වයක් ඇති වේ.

බෙදුම්වාදීන්ගේ අවසන් ඉලක්කය සපුරා ගැනීම සඳහා එම තත්ත්වය ඉතා වැදගත් වේ. රටක් බෙදා වෙන් කිරීම මනුෂ්‍ය ශරීරයෙන් කකුලක් කපා දැමීම තරම් වේදනාකාරී දෙයකි. ඒ නිසා ඒ සඳහා එම පුද්ගලයා නිර්වින්දනය කිරීමට සිදු වේ. සමාජයක් බෙදා වෙන් කරන විට සමස්ත සමාජය නිර්වින්දනය කළ හැක්කේ ඒ මත ප්‍රචණ්ඩත්වය මුදා හැරීමෙනි. වර්තමාන සිංහල - මුස්ලිම් ගැටුම් අවසානයේ දී අයි.එස් ත්‍රස්තවාදය පවා යොදා ගනිමින් මුදාහරින මහා පරිමාණ සමාජ ප්‍රචණ්ඩත්වයක් දක්වා වර්ධනය විය හැක.

ඒ නිසා ආණ්ඩුවට දැන් ඉටු කිරීමට ඉතිරි වී තිබෙන අවසාන පොරොන්දුව වන බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමෙන් පසු මෙම ගැටුම උත්සන්න කිරීමට නැවත වටයකින් අවශ්‍යතාවය මතු වේ. එම අවශ්‍යතාවය ආණ්ඩුවට මෙන්ම බෙදුම්වාදී බලවේගවලට එක සේ පවතින බව තව නොබෝ කලෙකින් අප රටේ ජනතාව තේරුම්ගනු ඇත. නමුත් අප රටේ විපක්ෂය මෙම භයානක තත්ත්වය ගැඹුරින් තේරුම් ගන්නවා ද යන්න පිළිබඳ ප්‍රශ්නයක් ඇත. ඔවුන්ගේ වගකීම වන්නේ ගැටුම්වලට සම්බන්ධ නොවන ලෙස ජනතාවට ආයාචනා කිරීම පමණක් නොවේ. ඔවුන් ආණ්ඩුවේ සමස්ත සැලසුම් වටහා ගෙන ඊට අනුව එම වැඩ පිළිවෙල අවුල් කිරීම සඳහා උපාය උපක්‍රම තේරිය යුතු ය. නමුත් සිදු නොවන්නේ ද එයම ය.

උදාහරණයක් ලෙස ආණ්ඩුව විසින් ජාතිවාදී ගැටුම් ඇවිලවීමෙන් පසුව ඒ ඝෝෂාව තුළ අතුරුදන්වීම් වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත ඉතා කූඨ ලෙස සම්මත කරගන්නා විට විපක්ෂය හැසිරුණු ආකාරයෙන් පෙනී යන්නේ ඔවුන් ආණ්ඩුවේ සැලසුමට ගොදුරු වූ බව ය. පළමුවෙන්ම 07 වැනිදා එම පනත විවාදයට ගන්නා බව ඔවුන් 05 වැනිදා වන විට දැන සිටිය ද ඒ පිළිබඳව මහා සංඝරත්නය සහ ජාතික බලවේග දැනුම්වත් කොට පාර්ලිමේන්තුවෙන් පිටත විරෝධයක් ගොඩනැගීමට සමත් වූයේ නැත. විශේෂයෙන්ම මීට පෙර එම පනත විවාදයට ගැනීම කල් දැමීමට හැකි වූයේ එම බලවේගවල මැදිහත් වීමෙනි. දෙවනුව

විවාදයට හැකිතරම් ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කැඳවා ගැනීමට ඔවුන් විසින් ප්‍රශස්ත උත්සාහයක් දරා නැත. ඒ සඳහා පැමිණ සිටියේ මන්ත්‍රීවරු 16ක් පමණි. තුන්වනුව ආණ්ඩුව විසින් ව්‍යාජ සංශෝධන යෝජනා කරන විට ඒවා පිළිගෙන ඊනියා විවාදයට සහභාගී වීමට සහ ඡන්දය භාවිතා කිරීමට ඉදිරිපත් වීම තුළින් ආණ්ඩුවේ බලහත්කාරයට සුජාතභාවය ලබාදීම ය. ඡන්ද විමසීම කල් දමා වෙනත් දිනක විවාදයක් ලබා දීමට කතානායකවරයා මුල් වටයේදී එකග වී පසුව එම එකගතාව බිදීම තුළ ආණ්ඩුවේ බලහත්කාරය ප්‍රදර්ශනය විය. පාර්ලිමේන්තුව තුළ රැඳී සිට ඡන්දය නොදී සිටීම හෝ විරුද්ධ වීම යන කුමන ආකාරයට ප්‍රතිචාර දැක්වුවත් ඒ මගින් ආණ්ඩුවේ බලහත්කාරය සාධාරණීකරණය වේ.

එවැනි තත්ත්වයක දී විපක්ෂයේ මන්ත්‍රීවරුන් කළ යුතුව තිබුණේ පනතට ගිනි තබා විරෝධය පළකර එළියට බැසීම ය. අවසානයේදී 16 දෙනෙක් පමණක් විරුද්ධව ඡන්දය දීම මගින් ඔවුන් සියලු දෙනා විසින් එම විවාදයට සහභාගී නොවූ මහින්ද රාජපක්ෂ මහතා ද අපහසුතාවයට පත් කොට ඇත. ඉදිරියේදී බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට ආණ්ඩුව උත්සාහ කරන අවස්ථාවේ දී විපක්ෂය ඒ ආකාරයටම ප්‍රතිචාර දැක්වුවහොත් නැවත දේශපාලනය ගැන කතා කිරීමට විපක්ෂයක් හෝ රටක් ඉතිරි වන්නේ නැත. දැන් ආණ්ඩුව උත්සාහ දරන්නේ බොරු සාක්ෂි ගොතා ජාතිවාදී ගැටුම්වල වගකීම විපක්ෂය මත පැටවීමට ය. ඊට පෙර විපක්ෂය විසින් මෙම ගැටුමේ ගැඹුර මහා සමාජයට වටහා දිය යුතුය. එසේම සුළු ජාතික ජනකොටස් සහ විපක්ෂ බලවේග අතර විරසකයක් ඇති කිරීම සඳහා ආණ්ඩුව විසින් කරගෙන යන මහා පරිමාණ බොරු ප්‍රචාරවලට එරෙහිව ඒකාබද්ධ විපක්ෂය විසින් වහා පියවර ගත යුතු ය.



14

# ආණ්ඩුවේ අන්තිම ''ක්‍රීඩා සැලසුම'' හෙවත් ජාතියේ ''අන්තිම ගමන''

ලෝකයේ රටක ආණ්ඩුවක් එම රටේ රාජ්‍යයට එරෙහිව සිදු කරනු ලැබූ දුෂ්ටතම මහා පාවාදීම 2018 මාර්තු 7 වැනිදා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ දී සිදුවිය. ඒ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා ජාත්‍යන්තර අධිකරණ බලයට ගොදුරු කරන 'අතුරුදහන් කිරීම වැළැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත" බලහත්කාරයෙන් සම්මත කිරීමෙනි. මන්ත්‍රීවරුන් 225ක් සිටින පාර්ලිමේන්තුවේ ඊට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට රැඳී සිටියේ 53 දෙනකු පමණි. එසේම ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කොට ඇත්තේ 16 දෙනෙකි. මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ සැබෑ විපක්ෂය ලෙස පිළිගන්නා ඒකාබද්ධ විපක්ෂයේ සෙසු මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ. නමුත් ඒ මහා පාවා දීමේ පනත එදින විවාදයට ගන්නා බව ඊට දින දෙකකට පෙර ඔවුහු දැන සිටියහ. එහෙත් ජාතිවාදී ගැටුම්කාරී තත්වය නිසා ඒ පිළිබඳව සමාජ අවධානය යොමු කරවීමට ඔවුන් අසමත් විය.

එහිදී විවාදයට තවත් දිනයක් ලබා දීමට සහ ඒ අනුව ඡන්ද විමසීම එතෙක් කල් දැමීමට කතානායකවරයා එකඟ ව සිටිය ද යම් බලපෑමක් මත හදිසියේම ඡන්දය විමසනු ලැබීය. නමුත් අවාසනාවකට එම ප්‍රජාතන්ත්‍ර විරෝධී බලහත්කාරයට විරුද්ධව අවශ්‍ය ප්‍රමාණයට විරෝධය පළ කිරීමට විපක්ෂය අසමත් විය. මෙම අවස්ථාවේදී ඔවුන් 16 දෙනකු පාර්ලිමේන්තුව තුළ රැඳී සිටිමින් ඡන්දය පාවිච්චි කිරීම නිසා කතානායකවරයා ප්‍රමුඛ ආණ්ඩුවේ බලහත්කාරයට සුජාතභාවය ලැබිණි. එපමණක් නොව ඔවුන් ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ ව්‍යාජ සංශෝධනය පිළිබඳ සාකච්ඡා කිරීමට එකඟවීමෙන් හෝ ඒ පිළිබඳව ඉතා බොළඳ ආකාරයට විශ්වාසය තැබීමෙන් තවත් නරක ආදර්ශ කිහිපයක් ද පෙන්වීය.

පළමුව ඔවුන් ආණ්ඩුවේ කොහුවලින් තමා විසින්ම ලණු අඹරාගෙන ගිලීමට මානසිකව සූදානම් බව පෙන්වීය. ඒ අනුව අනාගතයේදී ව්‍යවස්ථා සංශෝධන පනත ගෙන එන විට භයානක තත්වයක් උදා වේ. දෙවනුව ඔවුන් ''යකාගේ'' රැවුල හෝ කොණ්ඩය කපා ඔහුගේ භයානකකම අඩු කළ හැකි යැයි විශ්වාස කරන බව පෙන්වීය. තුන්වනුව එසේ ව්‍යාජ ලෙස වගන්තියක් වෙනස් කළ විට පනතේ භයානකකම නැති වී යනවා නම් එය එතරම් භයානක පනතක් නොවන බව ජනතාවට ඒත්තු ගැන්වීය. ඊට අමතරව පනතට විරුද්ධව ඡන්දය භාවිතා කරමින් පනත පිළිබඳ විවාදය සාධාරණීකරණය කිරීමට ඔවුන් තීරණය කරන්නේ අදාළ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ පිටපත් මන්ත්‍රීරුන්ට ලබාදීමට කථානායකවරයා අසමත්ව සිටියදී ය. ඒ අනුව මන්ත්‍රීවරුන් පක්ෂව හෝ විපක්ෂව ඡන්දය පාවිච්චි කරන්නේ ප්‍රඥප්තියේ අඩංගුවන භයානක ප්‍රතිපාදන පිළිබඳව කිසිවක් නොදැන ය. එවැනි මන්ත්‍රීවරුන් ඉතියෝපියාවේ හෝ සිටිනවාද යන්න සැක සහිතය.

එවැනි තත්වයක් තුළ ආණ්ඩුව තම ඉදිරි ක්‍රියාමාර්ග හෙවත් තමා බලයට පත් කළ ස්වාමිවරුන්ට ලබා දුන් පොරොන්දු ඉටු කිරීම සඳහා ඕනෑම දුරක් යාමට සූදානම් බව පෙන්වීය. එසේම ඒ තුළ විපක්ෂය මේ වනවිට හැසිරෙන ආකාරයේ ප්‍රබල වෙනසක් සිදු නොවුණහොත් ආණ්ඩුවේ බලහත්කාරය නැවැත්වීම පහසු නොවන

බව ද පැහැදිලිවේ. ඒ නිසා ජනතාව දැන් දේශපාලන පක්ෂ දෙස පමණක් බලා නොසිට ස්වයං ක්‍රියාමාර්ගවලට අවතීර්ණ නොවුණහොත් ඉදිරි වසර දෙක අවසානයේ දී ආපසු හැරවීමට නොහැකි සංධිස්ථානයකට රට ගමන් කරනු ඇත.

ජනතාවගේ අවබෝධය පිණිස ඉදිරි වසර දෙක ඇතුළත දිගහැරෙන ආණ්ඩුවේ ''මායාකාර'' න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංග 07ක් මෙසේ හඳුනාගත හැක. ඒවා ඉටුකිරීම සඳහා උනන්දු වන්නේ ආණ්ඩුව පමණක් නොවේ. ආණ්ඩුව බලයට පත් කිරීමට මෙහෙයුම් දියත් කළ දෙස් විදෙස් බෙදුම්වාදී බලවේග එක් පැත්තකින් ආණ්ඩුව ආරක්ෂා කරමින් සහ ඊට උදව් කරමින් මෙන්ම අනෙක් පැත්තෙන් ඊට බල කරමින් සහ ආණ්ඩුවේ අත කරකවමින් නව වටයකින් මෙහෙයුම් දියත් කොට ඇත. ඔවුහු දූන් ජනතා විමුක්ති පෙරමුණ යොදාගනිමින් බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට සුජාතභාවය ලබාදීමට උත්සාහ ගනිමින් සිටිති. දරුවා දූෂණය කිරීම සඳහා කුට්ටාලිකම කරන්නේ පියා විසින්ම නම් දරුවා මෙන්ම බලාසිටින්නන් සැක නොකරනු ඇත. ජනතා විමුක්ති පෙරමුණේ අතීත භූමිකාවට සාපේක්ෂව ගත්විට එය 'ඌරාගේ මස් උගේ පිටේ තබා' කැපීමකි. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හරහා හෝ ඍජුව ආණ්ඩුව විසින් ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඉදිරිපත් කරන තත්වයක දී එම ක්‍රියාවලියේ භයානකකම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම වඩා පහසු වේ.

## 01. පූර්ව කොන්දේසිය ඉටු කිරීම

ආණ්ඩුවේ න්‍යාය පත්‍රය දිග හැරීම සඳහා වන පූර්ව කොන්දේසිය වන්නේ පෙබරවාරි 10 මැතිවරණ ප්‍රතිඵලය මගින් නිර්මාණය කළ දේශපාලන අර්බුදය සමනය කර ගැනීම ය. දැන් ආණ්ඩුව විසින් සිතා මතා වර්ධනය වීමට ඉඩ දුන් ජාතිවාදී ගැටුම තුළ මැතිවරණ ජයග්‍රහණයේ උණුසුම මැකී යන තත්ත්වයක් උදා වී ඇත. දෙවනුව ඒ තුළ රනිල් වික්‍රමසිංහ මහතාට විරුද්ධව පැන නැගුණු විරෝධය යම් පමණකට යටපත් වී ඇත. තුන්වනුව රනිල් වික්‍රමසිංහ මහතා විසින් අමාත්‍ය මණ්ඩලය තුළ යම් රූපලාවන්‍ය ප්‍රතිසංස්කරණ

හඳුන්වා දෙමින් ආණ්ඩුවේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධය සමනය කරගැනීමට ප්‍රශස්ත උත්සාහයක් ගනිමින් ඇත. ඊට අමතරව එම උත්සාහයට උපරිම සහාය ලබා දීම සඳහා ඇමෙරිකානු සහ ඉන්දියානු තානාපති අංශ ඉදිරිපත්වී ඇත. ඒ සියලු ක්‍රියාමාර්ගවලින් කළනොහැකි දේ මුදල් විසිකිරීමෙන් ඉටුකර ගත හැකි බවට සැකයක් නැත. එසේම සජිත් ප්‍රේමදාස මහතා වැන්නකුට පක්ෂය තුළ වැඩි බලයක් ලබා දීම මගින් ඒ සියල්ලට අවශ්‍ය මනෝභාවය පක්ෂය තුළ සකස් කිරීමට ද රනිල් වික්‍රමසිංහ මහතා පසුබට නොවනු ඇත. **රනිල් වික්‍රමසිංහ මහතා දැන් ආරක්ෂණ ප්‍රවේශයෙන් ප්‍රහාරාත්මක ප්‍රවේශයට මාරු වෙමින් ඇත. නමුත් විපක්ෂ බලවේග තවමත් පසුවන්නේ ආරක්ෂණ ප්‍රවේශය තුළ නිදා වැටෙමිනි.**

රනිල් වික්‍රමසිංහ මහතාගේ මානසික යුද උපක්‍රම තුළ ඉදිරි ජනාධිපතිවරණයේදී ඔහුගේ හැසිරීම කුමක් වනු ඇත්ද යන්න පිළිබඳ මානසික අවුල් ඇති කිරීමට විශේෂ වැදගත්කමක් හිමිවනු ඇත. එහිදී ඔහු තමා ජනාධිපති අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වන බවට බාහිර සමාජයට සංඥා ලබාදෙනු ඇත. එම ව්‍යාජ සංඥා මගින් තම සතුරන් උපායමාර්ගිකව පීලි පැන්නවිය හැකි බව ඔහු ඉතා හොඳින් දනියි. දැනටමත් 2015 දී සිදු කළ වරද නැවත සිදු කරමින් පොහොට්ටුවේ ප්‍රභලයින් අභ්‍යන්තරිකව සූදානම් වන්නේ 2020 දී රනිල් වික්‍රමසිංහ මහතාට මුහුණදීමට ය. එදා 2015 දී එම ප්‍රබලයෝ රනිල් විරෝධී පෝස්ටර් මිලියන ගණනින් මුද්‍රණය කොට තබා ගැනීමට තරම් උපායමාර්ගික අදබාලයෝ ලෙස කටයුතු කළහ. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා යනු තම කඳවුර තුළ තමාගේ පැවැත්ම මෙන්ම තම න්‍යාය පත්‍රය ආරක්ෂාකර ගැනීම සඳහා බොහෝ පරිත්‍යාග කිරීමට සූදානම් අයෙකි. ඔහු 2010 දී සහ 2015 දී ඒ බව මැනවින් ඔප්පු කොට ඇත. ඒ අනුව ඔහු ඉදිරි ජනාධිපතිවරණයේදී 2015 දීට වඩා පහසුවෙන් අලෙවි කළ හැකි පොදු අපේක්ෂකයකුට තමා එකඟ වන බවට තම කඳවුර තුළදී ප්‍රතිඥා දෙනු ඇත. ඒ මගින් ඔහු තමාට එරෙහිව තම කඳවුර තුළ ගොඩනැගෙමින් පවතින විරෝධය ඉතා සූක්ෂ්ම ලෙස සමනය කර ගනු ඇත.

## 02. බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම

බෙදුම්වාදීන්ට තම ඊළාම් මාර්ග සිතියමේ අවසන් සැතපුම් කිහිපය අවසන් කිරීම සඳහා නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වන්නේ නැත. එසේම ඔවුන්ට බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමට හෝ ඒකීය වචනයේ එල්ලීමට අවශ්‍යතාවක් ද නැත. ඒකීය වචනය ව්‍යවස්ථාවේ එසේම තිබියදී රට ෆෙඩරල් කිරීම සඳහා අවශ්‍ය වන්නේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කරන සීමිත සංශෝධන ප්‍රමාණයකි. එනම් විපක්ෂ බලවේග වලට උපදෙස් දෙන දයාන් ජයතිලක වැන්නන් කියන ආකාරයට 'සුළු සුළු' සංශෝධන ප්‍රමාණයකි. ඔහු දැන් ඉංග්‍රීසි පත්තර හරහා ඩයස්පෝරාවෙන් ඉල්ලා සිටින්නේ ඒ සුළු සංශෝධන බාරගන්නා ලෙස ය. ඒ අනුව බෙදුම්වාදීන්ගේ එකඟතාව ය ඇතිව ඒ සුළු සංශෝධන ගෙන ඒමේ ප්‍රබල හැකියාවක් ඇත. එහෙත් එම සංශෝධන ගෙන එන අවස්ථාවේදී මහජනයා ඇන්දවීම සඳහා ඔවුන් විසින් ව්‍යාජ විරෝධයක් පෙන්වනු ඇත. කෙසේ වෙතත් එම සුළු සංශෝධනවලට සිනි තැවරීම සඳහා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ මනාප ඡන්ද ක්‍රමය වෙනස් කිරීම වැනි ජනප්‍රිය සටන්පාඨ යොදා ගෙන ඇත. එම සමස්ත ක්‍රියාවලියේ අවසන් පියවර වන ජනමත විචාරණයක් සඳහා ඉදිරි ජනාධිපතිවරණය යොදා ගැනීමට ද ඉඩ ඇත.

කුමන වන්දියක් ගෙවා හෝ කුමන හෝ කූඨ ආකාරයට එම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම ආණ්ඩුවට ඉතා තීරණාත්මකව වැදගත් වේ. ආණ්ඩුව ඊට අසමත් වුවහොත් මහින්ද පරාජය කොට මෛත්‍රීගේ මුහුණ පෙන්වා රනිල් බලයට පත්කිරීමේ ව්‍යාපෘතියේ මූලික අරමුණ ඉටු නොවේ. එවිට රනිල් වික්‍රමසිංහ මහතා තම ස්වාමිවරුන් ඉදිරියේ බරපතළ අපහසුතාවයට සහ උදහසට ලක් වේ. එය එතුමාගේ ''ආත්ම ආරක්ෂාවට'' බරපතළ තර්ජනයකි. මීළඟ පොදු අපේක්ෂකයා හෙවත් ''හංස නාඩගමේ'' දෙවන වටය හරහා නැවත අගමැති වීමේ ඊනියා සදාචාර බලය ඔහුට ඉතිරිවන්නේ මේ වටයේදී බාරගත් කොන්ත්‍රාත්තුව හරියට ඉටුකළහොත් පමණි.

## 03. ඉදිරිපත් කිරීමට නියමිත 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ කූඨ ක්‍රමවේදය

13 වැනි සංශෝධනය බලාත්මක කිරීම සඳහා කළ යුතු සුළු සංශෝධන ප්‍රමාණය මෙසේ හඳුනාගත හැක. පළමුවැන්න, ආණ්ඩුකාරවරයා මහ ඇමතිගේ යටත් වැසියකු බවට පත් කිරීම ය. ඒ සඳහා අවශ්‍ය වන්නේ ඉතා ප්‍රජාතන්ත්‍රවාදී බවක් ආරෝපණය කොට ආණ්ඩුකාරවරයා පත් කිරීම සඳහා මහ ඇමතිගේ අනුමැතිය අවශ්‍ය බවට සුළු සංශෝධනයක් ඇතුළු කිරීම ය. දෙවැන්න, සමගාමී ලැයිස්තුව අහෝසි කිරීමය. ඒ සඳහා පළාත් පාලන ආයතන වලට වැඩි බලයක් දීමේ මුවාවෙන් සමගාමී බලතල ලැයිස්තුව වෙනුවට පළාත් පාලන බලතල ලයිස්තුවක් ඇතුළු කිරීම ය. එවිට එම ලයිස්තුවද පළාත් බලතල ලැයිස්තුවක් බවට පත් වේ. තුන්වැන්න දැනට මධ්‍යම ආණ්ඩුවට පමණක් සීමා කොට ඇති ජාතික ප්‍රතිපත්ති සෑදීමේ බලය පළාත් සභාවලට ද ලබාදීම ය. එය ද ඉතා සාධාරණ බවට ව්‍යාජ තර්ක ඉදිරිපත් කළ හැක. හතරවැන්න, දැනට ලබා දී ඇති ඉඩම් පරිහරණ බලය වචන හරඹ මගින් තවදුරටත් ශක්තිමත් කිරීමය. පස්වැන්න, පාර්ලිමේන්තුවේ බලය ශක්තිමත් කිරීමේ මුවාවෙන් ජනාධිපතිවරයාගේ විධායක බලතල කප්පාදු කිරීම ය. එය හදිසි අවස්ථාවක දී පළාත් සභාවකට අදාළව ක්‍රියාත්මක වීම සඳහා ජනාධිපතිවරයා සතු බලතල කප්පාදු කිරීමට සීමා වනු ඇත.

මෙම කූඨ ප්‍රයෝගය ආවරණය කිරීම සඳහා මනාප ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේ වුවමනාව ඉදිරියට දැමීමට ද ආණ්ඩුව ක්‍රියා කරනු ඇත. විශේෂයෙන්ම මහනායක හිමිවරුන් පවා එවැන්නකට අනුමැතිය ලබාදී ඇති බැවින් සහ ඊට පෙර 20වැනි සංශෝධනය යෝජනා වූයේ ඒ සඳහා බැවින් එම ප්‍රයෝගය මඟින් මහජනයා රැවටීමේ වැඩි ඉඩක් ඇත. ඒ අනුව 20වැනි සංශෝධනය හඳුන්වනු ඇත්තේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සහ පළාත් සභා කාර්යක්ෂම කිරීම වැනි සුරංගනා කතාවල මාතෘකා යොදා ගනිමිනි.

ඊට අමතරව දූන් ජනතා විමුක්ති පෙරමුණ ''රෝ'' සංවිධානයේ පිටපතකට අනුව රඟපාන අළුත්ම නාඩගම අනුව 20 වැනි සංශෝධනයට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යන ලේබලයද අලවන බවට සැකයක් නැත. කෙසේ වෙතත් විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වේ. ඒ අනුව යෝජිත සංශෝධනයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට අදාල බරපතළ වගන්ති සම්මත කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය බවට ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් තීන්දු කරනු ඇත. එවිට පාර්ලිමේන්තුව විසින් විශේෂ බහුතරයෙන් සම්මත කරන්නේ සමස්ථ ව්‍යවස්ථා සංශෝධනය වුවත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසිවන්නේ ඊට අදාළව ජනමත විචාරණය පැවැත්වීමෙන් පසුවය. ඒ අනුව ජනමතවිචාරණය පැවැත්වුවත් නැතත්, එය ජයග්‍රහණය කළත් පරාජය වුවත් බෙදුම්වාදීන්ට අවශ්‍ය දේ ඉටු වේ. ඉන්පසුව ඉදිරි ජනාධිපතිවරණය ජනමතවිචාරණයක් බවට පත් කිරීමට ද වැඩි ඉඩක් ඇත.

එහිදී මීට පෙර 19 වැනි සංශෝධනයේ දී සිදු කළ ආකාරයට බරපතළ බවක් ආරෝපණය නොවන ලෙසට ගැසට් කරනු ලබන මූලික සංශෝධන කෙටුම්පත සකස් කරනු ඇත. උදාහරණයක් ලෙස බුද්ධාගමට හිමි තැන අහිමි කිරීම සහ ඒකීය වචනය වෙනස් කිරීම වැනි බෙදුම්වාදීන්ට තාක්‍ෂණිකව අත්‍යවශ්‍ය නොවන සංශෝධන ඊට ඇතුලත් නොකෙරෙනු ඇත. ඉන්පසුව විවාදයේ කාරක සභා අවස්ථාවේදී මීට පෙර අත්හදා බලා ඇති උපක්‍රමය භාවිතා කරමින් ඉදිරිපත් කොට ඇති සංශෝධන තවදුරටත් ශක්තිමත් කිරීමට සහ නව සංශෝධන ඇතුළු කිරීමට ආණ්ඩුව විසින් බලහත්කාරයෙන් යොදා ගනු ඇත. එහිදී මීට පෙර සිදුවූ ආකාරයටම එම බලහත්කාරයට සැබෑ විපක්ෂය යටත් වුවහොත් බෙදුම්වාදය ජයග්‍රහණය කරන බවට කිසිදු සැකයක් නැත. එහිදී ව්‍යාජ විපක්ෂය ආණ්ඩුවේ උපක්‍රමයට සහාය දෙමින් මහජනයා රැවටීම සඳහා පාර්ලිමේන්තුව තුළ ව්‍යාජ ඝෝෂාවක් පමණක් නඟන බවට ද සැකයක් නැත.

## 04. සුද්දන් ඉදිරියේ දණින් වැටී පොරොන්දු වූ ආකාරයට ආරක්ෂක හමුදා දුර්මුඛ කිරීම සහ දුර්වල කිරීම

මංගල සමරවීර හිටපු විදේශ අමාත්‍යවරයා 2015 දී ජගත් මානව හිමිකම් කවුන්සිලයේ දී රණවිරුවන්ට එල්ල වූ සියලු චෝදනා ස්තුති පූර්වකව පිළිගනු ලැබීය. ඒ සමගම ඔහු රණවිරුවන්ට දඬුවම් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ 30/ 1 යෝජනාවට සම අනුග්‍රහය දැක්වීය. දැන් එම පොරොන්දුවලින් ඉටු කිරීමට ඉතිරි වී තිබෙන්නේ එකක් පමණි. එනම් ජාත්‍යන්තර මැදිහත්වීමකට පාර කැපෙන ආකාරයට ජාත්‍යන්තර සහභාගිත්වය සහිතව ඊනියා සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීම ය. ඊට මැදිහත් වූ දකුණු අප්‍රිකානු පහසුකම් සලසන්නා වන සිරිල් රම්පෝසා දැන් එම රටේ ජනාධිපතිවරයා බවට පත් වී ඇත. ඒ නිසා දැන් ඔහු ඒ සඳහා දැඩි මැදිහත්වීමක් කිරීමට ඉදිරිපත් වනු ඇත. ඊට අදාළ පනත ලඟදීම සම්මත කරන බවට සංහිඳියා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ මනෝ තිත්තවැල්ල මහතා මෑතක දී ප්‍රකාශ කළේය.

දැන් අතුරුදහන්වීම් කාර්යාලයට නිමල්කා ප්‍රනාන්දු වැනි කොටිහිතවාදීන් පත්කොට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැළක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත 'බලහත්කාරයෙන්' සම්මත කොට ඇත. ඒ මඟින් ජාත්‍යන්තර අධිකරණයක් පිහිටුවා රණවිරුවන්ට දඬුවම් කරන ආකාරයට වඩා පහසුවෙන් තෝරා ගත් හමුදා නායකයින් පිරිසකට දඬුවම් කිරීමේ හැකියාව ඇත. ඒ නිසා දැන් දේශීයව හා විදේශීයව වෙනත් යුද අපරාධ යාන්ත්‍රණයක් අවශ්‍ය වන්නේ නැත. දැන් ව්‍යවස්ථා සංශෝධන පොරොන්දුව ඉටු කළ පසු සියලු පොරොන්දු ඉටු කර අවසන් වනු ඇත. ඊට අමතරව පරිපාලනමය වශයෙන් අහඹු ලෙස රණවිරුවන්ට, විශේෂයෙන්ම ඔත්තු සේවා නිලධාරීන්ට, දඬුවම් කිරීමේ ක්‍රියාවලිය බෙදුම්වාදීන් බලාපොරොත්තු වූවාටත් වඩා හොඳින් ආණ්ඩුව විසින් ඉටු කරමින් ඇත. දැන් එහි උච්චතම අවස්ථාව ලෙස දෙමළ ඩයස්පෝරාව උපරිමයෙන් සතුටු කිරීම සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතා බොරු චෝදනා යටතේ අත්අඩංගුවට ගැනීමට ආණ්ඩුව සැරසෙමින් ඇත.

# 05. ගෝලීය කොල්ලකාරී ආර්ථික සහ මූල්‍ය පද්ධතියට ශ්‍රී ලංකාව යටත් කිරීම

පසුගිය මාර්තු 7 වැනිදා මහජනයාට හොර රහසේ සම්මත කළ ඊනියා ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත මගින් 1994 සිට ලෝක වෙළඳ සංවිධානය විසින් හඬාගිය උවමනාවක් ආණ්ඩුව ඉටු කළේය. එම පනත මගින් සිදුවන්නේ එහි ලේබලයේ සඳහන් දේට ප්‍රතිවිරුද්ධ දෙයකි. එනම් මෙතෙක් කලක් ආණ්ඩුව සතුව තිබූ ආනයනික භාණ්ඩ සඳහා විවිධ බදු පැනවීමේ බලය අහෝසි කර ගැනීමය. දැන් නව පනත යටතේ එසේ බදු පැනවීම සඳහා බලසම්පන්න සමාගම්වලින් අවසර ගැනීමට සිදු වේ. ඊට පෙර නව විදේශ විනිම ය පනත සහ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම මගින් කළු සල්ලි ජාවාරම සඳහා ලෝකයේ හොඳම තැන ශ්‍රී ලංකාව බවට පත් කළේය.

ඊට අමතරව පසුගිය  අයවැය මගින් විදේශිකයන් විසින් දේපළ මිලදී ගැනීමේදී පනවා තිබූ 100% බද්ද ඉවත් කරනු ලැබීය. දැන් නව විදේශ විනිමය පනත අනුව ඉඩම් නීතිවල ඉතා සුළු සංශෝධන මඟින් කළු සල්ලි යොදවා රටේ දේපළ විදේශිකයන් විසින් අත්පත් කර ගැනීමට ඉඩ සැලසේ. අප වැනි රටවල  ඉඩම් සහ නිවාස ඇතුළු දේපළ අත්පත්කර ගැනීම සහ විදේශීය කළු සල්ලි ජාවාරම එකට බැඳී ඇත. හම්බන්තොට වරාය චීනයට දී මේ අවුල බේරීම සඳහා දැන් සිංගප්පූරු සමාගමක් හරහා ත්‍රිකුණාමලය වරාය ඉන්දියානු, ඇමරිකානු හා ජපන් සමාගම්වලට පවරා දීමේ ක්‍රියාවලිය ආරම්භ කොට ඇත. මත්තල ගුවන්තොටුපල ඉන්දියාවට බදු දීමෙන් පසුව මහා ජාතික සම්පත් විකුණා කෑමේ ක්‍රියාවලිය ද අවසන් වේ. ඉන් පසුව ඉතිරි වන්නේ සංචාරක ව්‍යාපාරය හරහා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ඇඟ විකුණාගෙන කෑම සඳහා තායිලන්තයේ ආදර්ශය අනුව ක්‍රියා කිරීම පමණි.

## 06. සංස්කෘතික සෝදා පාළුව සහ ආගමික ගැටුම් නිර්මාණය කිරීම

ඉහත කොන්දේසි දෙක බෙදුම්වාදී න්‍යාය පත්‍රයේ අවසන් ජයග්‍රහණය සඳහා ඉතා තීරණාත්මව වැදගත් වේ. රටක් බෙදා වෙන්කළ හැක්කේ සමස්ත සමාජය දුර්වල කොට දුර්මුඛ කිරීම මගිනි. මනුෂ්‍ය දේහයකින් කකුලක් කපා ඉවත් කිරීම සඳහා එක් පැත්තකින් එම දේහය නිර්වින්දනය කළ යුතුය. සමාජයක් නිර්වින්දනය කළ හැක්කේ ඒ මත අතිශය අමානුෂික ලෙස ප්‍රචණ්ඩත්වය වැපිරීමෙනි. ඒ සඳහා දැනට අත්හදා බලා ඇති සිංහල මුස්ලිම් ජාතිවාදී, ආගම්වාදී ගැටුම් මහා පරිමාණයෙන් යොදාගනු ඇත. අනෙක් පැත්තෙන් කකුල අහිමි කිරීම පිළිගැනීමට තරම් දුර්වල මනෝභාවයක් සමාජය තුළට කාවැද්දිය යුතුය. සමාජයක් මානසිකව දුර්වල වන්නේ මානසික ශක්තිය වර්ධනය කරන සාධක අහිමි කළ විටය. සංස්කෘතික සෝදා පාළුව ඉංජිනේරුමය ක්‍රමවේද යොදාගිනිමින් මහා පරිමාණයෙන් දියත් කිරීම අවශ්‍යවන්නේ ඒ සඳහාය. ඒ සඳහා මහා පරිමාන උපායමාර්ගික සැලසුමක් දැන් හොර රහසේම ක්‍රියාත්මක වෙමින් ඇත. එහි බරපතලකම තේරුම් ගැනීම සඳහා එක් උදාහරණයක් පමණක් සෑහෙයි. අගමැති කාර්යාලය හරහා දියත්කොට ඇති 'සමාන් බව සිතන්න' නැමැති ව්‍යාපෘතිය යටතේ මෙම වසර අවසන් වන විට පෙර පාසල් 19,000ක දරුවන්ට සමලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනයක් ලබාදෙනු ඇත. එම ව්‍යාපෘතිය සාධාරණීකරණය කෙරෙන්නේ සමලිංගිකත්වය ඉවසීම සඳහා ඉතා කුඩා අවධියේම දරුවන් පුහුණු කළ යුතු බව කියමිනි.

## 07. ඉදිරි ජනාධිපතිවරණය මුල්කර ගෙන එ්.ජා.ප විරෝධී පොදු ජන බලවේගයක් නිර්මාණයවීම වැළැක්වීම.

එජාප ආණ්ඩුවේ ඉදිරි වසර දෙක තුළ ගමන මෙන්ම ඉදිරි ජනාධිපතිවරණයෙන් පසුව ඔවුනට අත්වන ඉරණම තීන්දු වනුයේ ඔවුනට එරෙහිව පෙළගැසෙන ජන බලවේගයේ ශක්තිය මතය. එනම් ජනාධිපතිවරණයට පෙර කාලය තුල ජාතික ආණ්ඩුව අහෝසි

කිරීම, භාරකාර හෝ පරිවාස ආණ්ඩුවක් පිහිටුවීම, ජනාධිපතිවරණය කලින් පැවැත්වීම, හෝ ඉදිරි ජනාධිපතිවරණයට ජාතික න්‍යාය පත්‍රයක් මත පොදු අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීම යන සාධක රදා පවතිනුයේ එම ආණ්ඩු විරෝධි මහා ජන බලවේගයේ ශක්තිය මත ය.

ඒ නිසා සියලු ජාතිකවාදී වාමවාදී බලවේග විසින් පොදු න්‍යාය පත්‍රයක් යටතේ පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කිරීම සඳහා තිබෙන ඉඩ ආණ්ඩුවට මාරාන්තිකවේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද - මෛත්‍රී පාර්ශව මෛත්‍රී ඇතිව හෝ නැතිව , සන්ධානගත වීම වැළැක්වීම සඳහා කළ හැකි සියලුම දේ කිරීම සඳහා ආණ්ඩුව ඉදිරිපත් වනු ඇත. ආණ්ඩුව මුහුණ දෙන ප්‍රධානතම උපාය මාර්ගික අභියෝගය ද එය වනු ඇත. නමුත් විවිධ පුද්ගලික රුචි අරුචිකම් මත පදනම්ව ආණ්ඩුවේ ඒ උවමනාවට පක්ෂපාතීව මත පළකරන බලවේග ජාතික ව්‍යාපාරය තුළ පවා සිටීම නිසා ආණ්ඩුවට යම් වාසි සහගත තත්වයක් උදා වී ඇත.

එජාපය ප්‍රමුඛ ඔවුන්ව ආරක්ෂා කරන බෙදුම්වාදී බලවේග එකට එක්ව ඉදිරි ජනාධිපතිවරණයේදී රග දැක්වීමට නියමිත 'හංස නාඩගම" දෙවන කොටසට අදාළපිටපත කියවීමෙන් ඉහත සදහන් කළ ආණ්ඩුවේ උපායමාර්ගික උවමනාව වඩා හොඳින් තේරුම්ගත හැක. ඉදිරි ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් රනිල් වික්‍රමසිංහ මහතා තරගයට ඉදිරිපත් වන බවට පොහොට්ටුව පක්ෂයේ මහ මොළකරුවෝ අනාවැකි පළ කරති. එහෙත් එම නාඩගම් පිටපත අනුව සිදුවන්නේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. කෙසේ වෙතත් ඉදිරි ජනාධිපතිවරණයට අදාළව විපක්ෂ බලවේග රැවටීමේ ක්‍රියාවලිය ඉතා සුක්ෂ්ම ලෙස දැනටමත් දියත්කොට ඇත. ඒ ලණුදීමේ එක් න්‍යායක් අනුව එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වන්නේ චම්පික රණවක ය.

**නමුත් ඉදිරි ජනාධිපතිවරණයේදී එ.ජා.ප ප්‍රමුඛ සියලු බෙදුම්වාදී, ජාතිවාදී පක්ෂවලට පමණක් නොව ජනතා විමුක්ති පෙරමුණට ද එකසේ පිළිගතහැකි චරිතයක් නව සළුපිළි අන්දවා**

පොදු අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් කෙරෙන බවට කිසිදු සැකයක් නැත. ඔහුගේ හෝ ඇයගේ භූමිකාව වන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට බෙදුම්වාදීන්ගේ අත්‍යවශ්‍ය ඉල්ලීම් ඉටු වන ආකාරයට නව ව්‍යවස්ථාවක් සම්මත කරන ජනමත විචාරණයක් ලෙස ඊළඟ ජනාධිපතිවරණයට විශේෂ වටිනාකමක් ලබාදීම ය. එම පොදු අපේක්ෂකයා අනිවාර්යයෙන්ම නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමෙන් පසුව පුටුවෙන් බැස යන අයකු වනු ඇත. ඒ නිසා එම අපේක්ෂකයා මහා සදාචාර වටිනාකමක් සහිතව මහජන මනසේ ස්ථානගත කෙරෙනු ඇත. පවතින තත්වය තුළ මෛත්‍රීපාල සිරිසේන මහතාට ද තෝරාගතහැකි හොඳම විකල්පය එය විය හැක. ඊට කෘතගුණ සැලකීම සඳහා ඔහුව විධායක නොවන ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තුව මගින් පත් කිරීමේ ඉඩක් ඇත.


දැන් ජනතා විමුක්ති පෙරමුණ විසින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සටන් පාඨය ඉහළට ඔසවන්නේ ඉදිරි ජනාධිපතිවරණය ඊට අදාළව ස්ථානගත කිරීමට බව පැහැදිලිව පෙනේ. එහෙත් යෝජිත 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන ජනමත විචාරණය ජනාධිපතිවරණයට පෙර පවත්වා එම ජනාධිපතිවරණය අහෝසි කිරීමට යම් සම්භාවිතාවක් ඇත. එහෙත් එය යථාර්ථයක් බවට පත්වනු ඇත්තේ එම උපායමාර්ගයට වර්තමාන ජනාධිපතිවරයා එකඟ වුවහොත් පමණි. එතුමාගේ වාර්තමාන ධුර කාලය වෙනස් නොකරන බවට ජවිපෙ විසින් සහතිකයක් ලබා දෙන්නේ ඒ සඳහා පාරක් කපා ගැනීමට බව පැහැදිලි ය. ඒ සඳහා ඔවුන් තවත් අඩියක් ඉදිරියට තබා පාර්ලිමේන්තුව විසින් පත් කිරීමට නියමිත විධායක නොවන ජනාධිපතිධුරය එතුමාට පිළිගැන්වීමට ද ඉඩ ඇත. ඒ අනුව ඉහත සඳහන් කළ ආකාරයට ජනාධිපතිවරණය ජනමතවිචාරණයක් බවට පත් කිරීම හෝ ජනාධිපතිවරණයට පෙර ජනමතවිචරණයක් පවත්වා විධායකය අහෝසි කිරීම යන තේරීම් දෙකෙන් ඕනෑම එකක් එතුමාට ආකර්ශනීය වනු ඇත. එම තත්වය වෙනස් කළ හැක්කේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද පාර්ශ්වය විසින් තුන්වන හෙවත් විකල්ප යෝජනාවක් ඉදිරිපත් කිරීම මගිනි. එම යෝජනාව 20 වැනි සංශෝධනයට විශේෂ බහුතරය අහිමි කිරීමට තරම් මෛත්‍රී පාර්ශවයට ආකර්ෂණීය විය යුතු ය. එසේ වුවත් මහින්ද පාර්ශ්වයේ යම් ප්‍රබල නායකයින් ඊට බාධා කරන බවට සැකයක් නැත.

# 08. ආණ්ඩුවේ පැවැත්ම සඳහා මුදල් සොයා ගැනීමේ අභියෝගයට මුහුණ දීම

ඉහත සඳහන් කළ පස් වැදෑරුම් පාවාදීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා ඉදිරි වසර දෙක තුළ ආණ්ඩුවේ පැවැත්ම තහවුරු කොට රනිල් - මෛත්‍රී සාධකය ඇතිව හෝ නැතිව 'හංස නාඩගම' රඟ දැක්විය යුතු ය. ඒ සඳහා මුදල් අවශ්‍ය වේ. පළමුවෙන්ම ලබන 2019 වසරේ ගෙවීමට ඇති ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලතම ණය වාරිකය වන ඇමරිකානු ඩොලර් මිලියන 4200 හෙවත් ඩොලර් බිලියන 4.2 ක ණය ගෙවා දැමීය යුතු ය. දෙවනුව 2019 මැතිවරණය වසරේදී මහජනයා ගොනාට ඇන්දවීම සඳහා අතපය දිගහැර වියදම් කළ යුතු ය. තුන්වනුව මැතිවරණ ක්‍රියාවලිය සහ මන්ත්‍රීවරුන් මිලදී ගැනීම සඳහා පක්ෂ අරමුදල් ගොඩනගා ගත යුතුය. ඒ සියලුම උවමනාවන් එක පනතකින් ඉටුකර ගැනීම සඳහා බැඳුම්කර මගඩි පනතක් මහජනයා නොමග යැවීම සඳහා ඊට සක්‍රීය බැරකම් කළමනාකරණ පනත නමින් ව්‍යාජ ලේබලයක් සම්මත කරගෙන ඇත.

**එම පනත මගින් හිතුවක්කාර ලෙස අගමැතිවරයාට උවමනා ආකාරයට රුපියල් බිලියන 1000ක් හෙවත් රුපියල් . ට්‍රිලියනයක් දක්වා බැඳුම්කර නිකුත් කිරීමට හැකියාව ලැබේ. ඒ මගින් 'නීත්‍යානුකූල' ආකාරයට සොයාගත හැකි කොමිස් මුදල පසුගිය බැඳුම්කර මගඩිය මගින් සොරකම් කළ රාජ්‍ය අරමුදල් ප්‍රමාණය මෙන් 20 ගුණයක් විය හැක. ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණයේදී දූෂිත ආකාරයට වියදම් කරන මුදල් ප්‍රමාණය මහජනයාට සිතා ගැනීමටවත් නොහැකි තරම් විශාල වනු ඇත. එහි ප්‍රතිඵල ද ආපසු හැරවිය නොහැකි තරම් බරපතළ වනු ඇත.**

කෙසේ වෙතත් සියලු පාවාදීමේ පනත්වලට අත් ඔසවන මන්ත්‍රීවරුන්ට පමණක් නොව ඔවුන්ගේ හත්මුතු පරම්පරාවලටද අනාගත පරපුරෙන් කිසිදු සමාවක් නොලැබෙන බව සහතිකය. ඒ ඉන් පසුව රට තුළ සිදුවන විනාශය සිහි බුද්ධිය ඇති කිසිවකුට ඉවසා දරාගත නොහැකි නිසා ය.



නංගියේ, මල්ලියේ
දුවේ, පුතේ,
ආචාර්ය මහාචාර්ය විද්වතුනි...

# එන්න,

## මුහුණු පොතෙන් පියවි ලොවට...

...ඒ නිසා දැන් ඉටුකරගත යුතු පූර්ව කොන්දේසිය වන්නේ මහින්ද-මෛත්‍රී පාර්ශ්ව නියෝජනය කරන 56 චෛතිහාසික බලවේගය සමගි කරවීමයි. එම බලවේගයේ උවමනාව ආශිර්වාදය සහ බල කිරීම මත නායකත්වයේ මනෝභාවය තුළ වෙනසක් සිදුවිය යුතු ය. එසේ නොවුණහොත් ඉතිහාසය විසින් නිර්මාණය කළ මනරම් අවස්ථාව ජාතියට අහිමි කිරීමේ වරදට ඔවුන් දෙපළට ඉතිහාසය විසින්ම දඬුවම ලබා දෙනු ඇත. කෙසේ වෙතත් මේ දිනවල මුහුණපොතේ සැරිසරමින් ඈගට පහසුවෙන් "හාන්සිපුටු" දේශපාලන භූමිකාවක් ඉටුකරන යම් පිරිස් ඒ චෛතිහාසිකක උවමනාවට එරෙහිව මත පළ කරති. ඔවුන් අතුරින් යම් පිරිසක් දේශපාලන අඥ බාලයන් විය හැකි වුවත් යම් පිරිසක් විවිධ ඔත්තු සේවාවලින් මෙහෙයවනු ලබන යම් දේශපාලන නායකයින්ගේ ගෝල බාලයන් බවට සැකයක් නැත. තවත් එවැනිම පිරිසක් එන්.ජී.ඕ. ඩොලර් කාක්කන් විසින් මෙහෙයවන බවට ද සැකයක් නැත. නමුත් ඒවා පිළිබඳව කම්පාවීමට හෝ කලබල වීමට අවශ්‍ය නැත. 2002 වසර වැනි මෑත ඉතිහාසය දක්වා ආපසු ගියත් එම කාලයේ සිට රට මුහුණුදුන් තීරණාත්මක අභියෝගවල දී මුහුණපොත හෝ එහි සැරිසරන එවැනි හාන්සිපුටු සටන්කරුවන්ගේ මුහුණ දක්නට ලැබෙන්නේ නැත. කෙසේ වෙතත් මහජන අපේක්ෂා නමැති ගංගාව වේගයෙන් ගලන විට එවැනි බලවේගවලට උඩුගම් බලා පිහිනීමට හැකියාවක් ලැබෙන්නේ නැති බව ඉතිහාසය විසින් ඔප්පුකොට ඇත...

මිල රු 200/